# බුදුසරණ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564 ක් වූ වෙසක් අමාවක පෝය දින
රාජ්‍ය වර්ෂ 2020 මැයි 22 වනදා සිකුරාදා
BUDUSARANA, FRIDAY MAY 22, 2020
54 වන කාණ්ඩය, 46 වන පත්‍රය, පිටු 20
ආරම්භය 1965 - 06 - 13 මිල රු. 40.00
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්

www.budusarana.lk Email:budusarana@lakehouse.lk



පංචායුධ ජාතකය

මහලු වියෙහි දුක් නොවන්න
**තුරුණු දිවිය ගොඩනඟන්න**
02 පිටුව

ජීවිතයට
**දැඩි වෙහෙසක් දැනෙන්නේ ඇයි ?**
පිටුව 04

අද දවසේ
**අපේ වගකීම**
05 පිටුව

ව්‍යසන වලින් ගොඩ එන්න
**දිනචරියාව වෙනස් කරන්න**
පිටුව 06

ප්‍රමාද වී
**පසුනොතැවෙන්න**
පිටුව 07

# මහලු වියෙහි දුක් නොවන්න තුරුණු දිවිය ගොඩනගන්න



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

**ප්‍රීතිමත් මහලු ජීවිතයක් ගත කිරීමට නම් සාර්ථක තරුණ ජීවිතයක් ගත කළ යුතු ය.**

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, ඒ මම පසු කලෙක තරුණ වියේ පසු වූයේ, කාල වර්ණ කෙස් කළඹින් යුක්ත වූයේ , භද්‍ර යෞවන වියෙහි පළමු වයසෙහි යුක්ත වූයේ දෙමාපියන්ගේ අකමැත්ත පිට දෙනෙතින් කඳුළු වගුරුවමින් හඬන කල කෙස් රැවුල් බා කසාවත් හැඳ ගිහිගෙයින් නික්ම පැවිදි වුණෙමි" යනුවෙන් දේශනා කරති.

මෙයින් පෙනෙන්නේ බුදුන් වහන්සේ සිය ජීවිතයේ නිවැරැදිම තීරණය භද්‍රයෞවනයෙහි දී ගත් බවයි. ධනය උපයමින් දිවි ගෙවීම හෝ ආධ්‍යාත්මය පෝෂණය කරමින් දිවි ගෙවීම යෞවන වියෙහිම කළ යුතු වෙයි. මහලු වූ විට ධනය ඉපයීමට නොහැකි වන්නා සේ ම මහලු වූ විට සිත දමනය කිරීම ද කළ නො හැකි ය. ගසක්, ගොවියාට අභිමත අයුරින් සකසා ගත හැකි වන්නේ එහි කුඩා සමයේ දී ය. එපරිද්දෙන් සිත දමනය කළ හැකි වන්නේ ද කාය ශක්තිය පවතින සමයෙහි දී ය. කාය ශක්තිය ඉක්ම වූ විට සිත වැඩීමට නො හැකි ය.

බුදු දහම පරලොව ජීවිතය ගැන පමණක් උගන්වන දහමකි. සසර බියකරු බව පෙන්වන දහමකි. වැනි වදන් දහම නොදත් අඥානයින්ගේ මුවින් පිටවෙනු පෙනේ. බුදු දහම අධ්‍යනය කළ පුද්ගලයා ධර්මය වහා අවබෝධ කරගෙන ගැටලුවලින් තොර සාර්ථක ගිහි ජීවිතයක් සකසා ගනියි. මිනිසත් බව ලබන සත්වයා මාර්ග දෙකක යා යුතු ය. පළමු මාර්ගය ජීවිතය පවත්වා ගැනීමයි. දෙවැනි මාර්ගය ආධ්‍යාත්මය දියුණු කිරීමයි. ජීවිතය පවත්වා ගැනීමට, අඹුදරුවන් පෝෂණය කිරීමට, සමාජ මෙහෙවරෙහි යෙදීමට ධනය ඉපයිය යුතුය. උපයා ඇති ධනය නිවැරැදිව පරිභෝජනයට ගත යුතු ය. ධනය ඉපයීමටත්, ධනය පරිභෝජනයටත් බුදු දහමින් උපදෙස් ලබා දී ඇත. ඒවා අනුගමනය කරන්නෝ මෙලොවත් පරලොවත් ජයගනිති. තරුණ සමය විනෝදයෙන් ගත කිරීමට, ශරීරය පිනවීමට සහ වෙනත් නිෂ්ප්‍රයෝජන කටයුතුවලට ඇතැම්හු කළමනාකරණයකින් තොරව ධනය වැය කරති. ශරීර ශක්තිය දිනෙන් දින පිරිහෙමින් මහලු වියට පා තැබූ විට සරණක් සොයති. අන් අයගේ පිහිටම අපේක්ෂා කරති. බුදුන් දවසත්, වර්තමානයේත් මෙවැනි පිරිස් සමාජයේ ජීවත්වනු පෙනේ.

යමකු හෝ යම්දෙයක් විනාශවීමටත්, අසාර්ථකවීමටත් බලපාන හේතු ඇත. මෙහි දී ජීවිතය අසාර්ථකවීමට රහමෙර පානය කිරීම, නොකල්හි වීථිසංචාරයේ යෙදීම, උත්සව, සංදර්ශන පිණිස යාම, ප්‍රමාදයට සහ ධනය විනාශයට හේතුවන සූදු කෙළියෙහි යෙදීම, පාප මිත්‍රයන් හා එක්වීම, අලස බවින් කාලය ගෙවීම යන කරුණු හය හේතුවන බව පෙන්වා දෙයි.

මහලු වියෙහි සතුටින් ජීවිතය ගත කිරීමට නම් භෝග විනාශ මුඛ සයෙන් හෙවත් දොරටු සයෙන් සම්පූර්ණයෙන් මෑ ඈත් විය යුතු ය. එය සාර්ථක තරුණ ජීවිතයකට මුල පිරුමක් වන අතර ප්‍රීතිමත් මහලු දිවියක ආරම්භය ද වෙයි. මේ මාර්ගයේ ගමන් කරමින් ධනය උපයා දරුවන් වෙනුවෙන් ඒවා ආරක්ෂා කර තබා දෙමාපියන් කළුරිය කළ පසු ඇතැම් දරුවෝ ඒවා රිසි අයුරින් වියදම් කරමින් තරුණ දිවිය විනෝදයෙන් ගත කිරීමට උත්සාහ දරයි.

එලෙස ජීවත් වෙයි. ඔවුන් නොදැනුවත්ව ම ධනය පිරිහී යයි. ඒ වන විට ඔවුන්ගේ ශරීර ශක්තිය ද පිරිහී ගොස් ඇත. එවැනි අවස්ථාවල ඔවුන්ට උරුම වන එකම ධනෝපාර්ජනය සහ දිවි රැකීමේ රැකියාව වන්නේ අනුන්ට අතපා යමක් ඉල්ලා ගනිමින් ජීවත්වීම ය. බුදුන් වහන්සේ එවැනි පවුලක් උදෙසා දේශනා කොට වදාළ ගාථා ධර්මයක් ධම්මපදයේ දක්වා ඇත. එය මහලු ජීවිතය ගත කළ යුතු ආකාරය සහ තරුණ දිවිය ඒ වෙනුවෙන් කැප කළ යුතු ආකාරය පෙන්වා දෙන්නකි.


දඹදිව බරණැස් නුවර මහා ධනයකට හිමිකම් කියූ සිටුවරයෙකුගේ පුතකු ලෙස මහධන සිටුවරයා අසූකෙළක් ධනයකට හිමිකම් කියමින් ම උපත ලබයි. එම නගරයේ ම අසූ කෝටියක් ධනය හිමි තවත් සිටු පවුලක මහධන සිටුවරයා විවාහ කරගත් සිටුදේවිය ද උපත ලබයි. දෙදෙනාම තරුණ වියට පා තැබූ පසු දෙපිරිසේ දෙමාපිය ආශිර්වාදය මැද දෙදෙනා විවාහ ගිවිස ගනියි. කාලයාගේ ඇවෑමෙන් දෙදෙනාගේම දෙමාපියන් කළුරිය කිරීමෙන් පසු සියලු ධනය ඔවුන්ට හිමි වෙයි. කිසිදු වෙහෙසකින් තොරව ධනය හිමි වූ සිටුවරයා පාපමිත්‍ර සේවනය හේතුවෙන්, සුරාවට පෙළඹී දෙ අසූකෝටියක් වූ ධනය අහිමි කරගනියි. තමා සමීපයේ සිටි සියලු මිතුරන් ද සිටුවරයා අත්හැර දමයි. ඒ වන විට දැඩි ශාරීරික දුබලතාවලින් පිරි සිටුවරයා සහ සිටුදියණිය අන් අයගේ පිහිට පතමින් වීථිවල හැසිරෙන අයුරු දැක බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලා අමතා තරුණ වියෙහි කළ යුතු කටයුතු නො කර වයසට ගිය පසු ඒ ගැන සිතමින් පසුතැවෙන පුද්ගලයා මසුන්ගෙන් හිස් වුණු දිය සිඳුණු විලක් අසලට වී පසුතැවෙන පියාඹා යාමට නොහැකි කොස්වාලිහිණියකුට උපමා කර දක්වයි

ධම්මපදයේ එන මේ ගාථා ධර්මයෙන් තරුණවියෙහි දී බඹසර විසීම හෝ ධනය ඉපයීම කළ යුතු බව පෙන්වා දෙයි. යමෙකු මේ දෙකින් එකක්වත් නො කර තරුණ සමය ගත කරන්නේ නම් ඔහු දිය සිඳුණු විල සමීපයේ සාගින්නෙන් පෙළෙමින් සුසුම්ලන කොස්වාලිහිණියකුට සමාන කර ඇත. වැසි සමයේ මසුන් අල්ලා ගත යුතුවාක් මෙන් ම තරුණ වියෙහි දී කය වෙහෙසා ධනය ඉපයිය යුතු ය. ආයෝජන කළ යුතු ය. පවත්නා ධනය සුරැකිය යුතු ය. බුදු දහම පරලොව ගැන උගන්වන දහමක් පමණක් නොවන බව මෙයින් තහවුරු කරයි. ධනය ඉපයීම, ධනය වියදම් කිරීම සහ ජීවිතයේ එක් එක් අවධි ගත කළ යුතු ආකාරය ද පැහැදිලිව උගන්වයි.

මිනිස් ජීවිතයක් සාර්ථක කර ගැනීමට බුදු දහමේ පවතින මග පෙන්වීම් වෙනත් කිසිදු දාර්ශනික මග පෙන්වීමක දක්නට නැත. අන් අයට හිංසාවක් හෝ පීඩාවක් හෝ නො වන අයුරින් සහ තම චිත්ත සන්තුෂ්ටිය රැකෙන අයුරින් මග පෙන්වීම් කර ඇත. එක් මග පෙන්වීමක් අනුව සාර්ථක ජීවිතයක් ගොඩනගා ගැනීමට නම් නොපසුබස්නා උත්සාහය, නිවැරැදි සිහිකල්පනාව, කයින් වචනයෙන් සහ සිතින් නිවැරැදි දේ කිරීම, විමසා බලා කටයුතු කිරීම, හික්මීම, දැහැමිව ජීවත්වීම, ජීවිතය සාර්ථකව ඉදිරියට ගෙන යන කටයුතුවල අලස බවින් තොරව යෙදීම යන කරුණු හත තම ජීවිතයට සමීප කර ගත යුතු බව දක්වයි.

සිය ධනය කොතරම් තිබුණත් තම උත්සාහයෙන් ධනය උපයා ජීවත්වීමට වෙරදැරීම නිසාම කුම්භඝෝෂක කුමරුට සිටුතනතුරු පවා හිමි වෙයි. අලස නොවී කටයුතුවල යෙදීමෙන් ජීවිත සාර්ථක කරගත් පුද්ගල චරිත බුදුන් දවසත්, අදත් දක්නට ලැබෙයි. තරුණ වියෙහි කොතෙක් ධනය තිබුණත් මහලු වූ විට ඇතැම්හු අපමණ දුක් විඳිති. ප්‍රීතිමත් ජීවිත ගත නො කරති. ඒ තරුණ වියෙහි නිසි ධන කළමනාකරණයක් සහ ධාර්මික දිවිපෙවතක් ගත නො කිරීමේ හේතු ය. එ බැවින් ජීවිතයේ ආරම්භයේ සිට ම ප්‍රීතිමත් මහලු දිවියක් උදෙසා සැලසුම් සැකසිය යුතු ය. ගෙය ගිනිගත් විට ළිං හෑරීමෙන් පලක් නො වෙයි. යන උපමාව නිතර සිහියේ තබා ගැනීම ප්‍රීතිමත් මහලු දිවියක් සැලසුම් කර ගැනීමට උපකාර වනු ඇත.

# යහපත් සමාජයකට බෞද්ධ ආචාර ධර්ම



වෙසක් අමාවක පෝදා

## දම් දෙසුම





ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ
පීඨාධිපති දර්ශන විශාරද
මහාචාර්ය

**මොරගොල්ලාගම උපරතන හිමි**

**බෞද්ධ පින්වතුන් බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුක්තව වැඩි වශයෙන් ආමිෂ හා ප්‍රතිපත්ති පූජාවන්හි නියැළෙන කාල පරිච්ඡේදයකට අපි එළඹ සිටිමු. එනිසාවෙන් ම බෞද්ධයන් විසින් සිදු කරන පුදපූජා සහ බෞද්ධ ආචාර මාර්ගය පිළිබඳ යම් විමසීමක් කිරීම කාලෝචිතයැයි සිතමි.**

බුද්ධ දේශනය සම්පූර්ණයෙන්ම ආගමක් නොව දර්ශනයකි. එහෙත් එම දර්ශනය තුළින් සකස්වුණු සාමාජයීය ලක්ෂණ ආගමික සංස්කෘතිය වශයෙන් හැඳින්විය හැකි ය. මේ අනුව බෞද්ධයා තුළ මුල්බැසගෙන ඇති බෞද්ධ සංස්කෘතික ලක්ෂණ බෞද්ධ ආගම වශයෙන් වෙන් කළ හැකි ය. සමාජයක් ගොඩනැඟීමේදී සත්‍ය වශයෙන්ම ඒ හා සබැඳි යහපත් යැයි සම්මත සාර ධර්ම පද්ධතියක් නොමැති නම් එම සමාජයේ ගොඩනැගීම් කෙලෙස සිදුවේදැයි සිතාගැනීම වත් අපහසුය. බෞද්ධයා තුළ මුල් බැසගෙන ඇති උත්සව, පෙරහර, බුද්ධ පූජා, බොධි පූජා, දානාදි පින්කම් ඔවුන්ගේ සංස්කෘතිය පිළිබඳ හෙළිදරව් කිරිමකි.

බුදු දහමේ ඉගැන්වෙන පරම නිෂ්ඨාව වන නිවන සාක්ෂාත් කර ගත හැක්කේ සාධාචාරය මගින් මිස දුරාචාරය මගින් නොවේ. ඒ ආවසානික නිෂ්ඨාව දෙසිනි. එපමණක් නොව මෙලොව පරලොව දෙකේ සැපවත් ජීවිතයක් ගත කළ හැක්කේ ද සදාචාරය මගිනි. එම සාධාචාර ධර්ම පින් සහ පව් වශයෙන් බුදු දහමේ උගන්වා තිබේ. ඒ අනුව විවිධාකාර වූ පුද පූජා, පින්කම් වශයෙනුත් ඊට ප්‍රතිවිරුද්ධ දේ පව්කම් වශයෙනුත් සඳහන් කළ හැකිය. මිහිඳු හිමියන් ලක්බිමට වැඩමවන විට විවිධාකාර වූ පුද පූජා හා ඇදහිලි ක්‍රම රාශියක් මිනිසුන් අතර තිබූ නමුත් උන් වහන්සේ ඒවා එකහෙලාම අසාර දේ ලෙස ප්‍රතික්ෂේප කොට බැහැර කළේ නැත. ඒ වෙනුවට නව අර්ථකථන සමග ඒවා යළිත් මිනිසුන්ට හඳුන්වා දුන් අතර එම පුද පූජා අඩු වැඩි වශයෙන් අද දක්වාත් මිනිසුන් අතර දක්නට ලැබේ. බුදුරජාණන් වහන්සේ කිසියම් ක්‍රියාවක හොඳ, නරක විමසීමේ දී වඩාත් නිවැරදි මිම්මක් ධම්මපදයෙන් හඳුන්වා දී තිබේ.

තංච කම්මං කතං සාධු
– යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනො
– විපාකං පටිසෙවති
නතං කම්මං කතං සාධු
– යං කත්වා අනුතප්පති
යස්ස
අස්සමුඛො රොදං
– විපාකං
පටිසෙවති

මෙය මෙලොව, පරලොව සහ පුද්ගල මානසිකත්වය ගැන සිතා කළ දේශනාවකි. ඉන් ප්‍රකට වන්නේ යමක් කොට පසුතැවිලි නොවේ ද, එහි විපාකය ලැබෙන විට සතුටුදායක ප්‍රතිඵල ගෙනදේ ද, එම කර්ම කිරීම යහපතකි. එය සාධාචාරයයි. පසුතැවිලි ගෙන දෙන, දුක් විපාක ගෙන දෙන කර්ම කිරීම අයහපතකි. එය දුරාචාරයකි.

මෙම දේශනාවෙන් බුදු දහමේ ආචාර මාර්ගය පිළිබඳව අපට යම් අවබෝධයක් ලබාගත හැකි ය. පැහැදිලිවම බුදු දහම හා සබැඳි මෙම සියලුම පුද පූජා බෞද්ධ පින්වතුන් සිදු කරනු ලබන්නේ මානසික සුව සහනය සඳහා ය. ඉන් දුක් විපාක ගෙන දේ නම් අයහපත් නම් කවර කලෙක වත් ඔවුන් ඒවාට නොපෙළ ඹෙනු ඇත. මින් වඩාත් පැහැදිලි වන කරුණක් වන්නේ බුදු දහමේ ඉගැන්වෙන ආචාර ධර්ම පින්, පව් වශයෙන් මෙන්ම නිර්වාණගාමි ප්‍රතිපාදාවේ එක් පැතිකඩක් වශයෙන් ද විග්‍රහ කළ හැකි බවයි. බෞද්ධයා විවිධාකර වූ පුද පූජාවන් සිදු කරනු ලබන්නේ ලෞකික අර්ථ සිද්ධිය අපේක්ෂාවෙන් නොව හුදෙක් පරලොව ශුභ සිද්ධිය සලසා ගෙන ම ය. එහිදි හෙතෙම ප්‍රථමයෙන්ම කරනු ලබන්නේ පංච ශීලය සාමාදන් විමයි.

තෙරුවන් වන්දනා කිරීම පින්කමක් වන අතරම සමසතළිස් භාවනා ක්‍රම අතුරින් භාවනා ක්‍රමයක් ද වෙයි. සිත සමාධි ගත කර ගැනිමට අවශ්‍ය කරන භාවනාවක් ඉන් සිදුවේ. මේ අනුව බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආචාර මාර්ගය බුද්ධිගෝචර සහ විචාරාත්මක එකක් බව පෙනෙයි. සියලු බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනාව ලෙස මෙම ආචාර මාර්ග කෙටියෙන් හකුළුවා දැක්විය හැකිය.

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උප සම්පදා
සචිත්ත පරියොදපනං
එතං බුද්ධාන සාසනං

මෙයින් ප්‍රකාශ කෙරෙන්නේ කායික, වාචයික, මානසික වශයෙන් සිදුකෙරෙන ත්‍රිවිධ වූ පාපයන් හෙවත් දුරාචාර නොකිරීමත්, කුසල් එක්රැස් කිරීමත් සිත දමනය කිරීමත් සියලු බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනාව බවයි. නිර්වාණගාමී ප්‍රතිපදා මාර්ගයේ ප්‍රථම පියවර වන්නේ ශීලයයි. ඉන් චරිත සංවර්ධනයක් සිදුවෙයි. එහෙත් ශීලයෙන් පමණක් නිවන් අවබෝධ කළ නොහැකි ය. සමාධියෙන් සිදුකරනු ලබන්නේ සදාචාරාත්මක හික්මීම පදනම්කොට ගෙන සකසාගත් ආධ්‍යාත්මය සංවර්ධනය කර ගැනිමයි. මෙහිදි අත්‍යවශ්‍යම දෙය වනුයේ ප්‍රඥාවයි. ඒ අනුව පෙළෙහි ශීල, සමාධි, ප්‍රඥා යනු ත්‍රිශික්ෂාව හැටියටත් එය විස්තර කිරීමේ එක් මාධ්‍යයක් ලෙස ආර්යය අෂ්ඨාංගික මාර්ගයත් ඉදිරිපත් කර ඇත. විසුද්ධි මාර්ගය ලියැවෙන්නේ දේවතාවකු විසින් නගන ලද පැනයකට ලැබෙන පිළිතුරු ගාථාව පදනම් කරගෙන ය. එනම්,

සිලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො,
චිත්තං පඤ්ඤං ච භාවයං
ආතාපි නිපකො භික්ඛු
සො ඉමං විජටයේ ජටං


කෙලෙස් තවන, වීර්ය ඇති භික්ෂුව ශිලයේ පිහිටා සිතත් ප්‍රඥවත් වඩා මේ අවුල ලිහන්නේයැයි, ඉන් පැවසෙයි. මෙහිදි ශීලය වශයෙන් ගැනෙන්නේ කාය, වාක් දෙකේ සංවරයයි. සිත වැඩිම යනු සාමාධිය යි. ප්‍රඥාව යනු විදර්ශනාව වැඩිමයි. මෙහිදි පැන නගින ගැටලුවක් වන්නේ මෙවන් ධර්ම පාර්යායක් තුළ මෙම ආගමික පුද පූජාදිය කෙලෙස අර්ථවත් කළ හැකිද? යන්නයි. ඒ පිළිබද විචාරයක යෙදෙන්නෙකුට තර්කානුකූලව විමතියක් ඇතිවිය හැකිය.

නිවන් අවබෝධ කිරීමට විදර්ශනා ප්‍රඥාව අවශ්‍ය වන්නා සේම පින් සිදු කර ගැනිමෙන් ඊට සුදුසු පරිසරය සකසා ගෙන තිබිය යුතු ය. කෙතරම් බණ භාවනා කළත් පින් මදි නම් ඔහුට නිවන් අවබෝධය දුරස් වනු ඇත.

> ‘නිවන් අවබෝධ කිරීමට විදර්ශනා ප්‍රඥාව අවශ්‍ය වන්නා සේම පින් සිදු කර ගැනිමෙන් ඊට සුදුසු පරිසරය සකසා ගෙන තිබිය යුතු ය. කෙතරම් බණ භාවනා කළත් පින් මදි නම් ඔහුට නිවන් අවබෝධය දුරස් වනු ඇත.’

මීළඟ බුදුසරණ කලාපය පොසොන් පුර අටවක පෝදා මැයි 30 වන සෙනසුරාදා

# ජීවිතයට දැඩි වෙහෙසක් දැනෙන්නේ ඇයි?



බලපිටිය ශ්‍රී ලංකා ප්‍රාචීන
භික්ෂු විද්‍යාලයේ
මහෝපාධ්‍යාය, රාජකීය පණ්ඩිත,
දර්ශනපති
**බලපිටියේ සිරිසීවලි හිමි**

**පෘථග්ජන බවෙන් මිදී ආර්ය ශ්‍රාවකයෙකු වීමට නම් අපි පළමුවෙන්ම කළ යුත්තේ මේ කෙලෙස් දහසය යටපත් කිරීමයි. ඊළඟට නැති කිරීමයි. ප්‍රහීන කිරීමයි. අවසානයේ දී නැත්තටම නැති කිරීමයි.එය මහත් අසීරු කාර්යයක් වේවි.**

ආරද්ධ විරිය හෙවත් පටන් ගන්නා ලද උත්සාහයෙන් යුතුව සතිසම්පජඤ්ඤය හෙවත් මනා සිහි බුද්ධියෙන් කටයුතු කරනව නම් ඒ අසීරු කාර්ය ඔබට කළ හැකියි. අවශ්‍ය වෙන්නේ පටන් ගැන්ම හා සිහි බුද්ධියෙන් වැඩ කිරීම විතරයි. මොකද? කෙලෙස් නැති කරන, ප්‍රහීන කරන ක්‍රමය බුදුරජාණන් වහන්සේ අපිට පෙන්වා දී තිබෙනවා.ඒ ක්‍රම අතරෙන් වඩාත් පහසුම ක්‍රමය මජ්ඣිම නිකායේ සබ්බාසව සූත්‍රයේදී දේශනා කළා. සබ්බාසව සූත්‍රයට අනුව කෙලෙස් ප්‍රහීන කිරීම සඳහා ක්‍රම හතක් තියෙනවා.

දස්සනා පහාතබ්බා - දැකීමෙන් කෙලෙස් නැති කිරීම

සංවරා පහාතබ්බා - ඉන්ද්‍රිය සංවරයෙන් කෙලෙස් නැති කිරීම

පටිසෙවනා පහාතබ්බා - අවශ්‍යතා ඇසුරු කරමින් කෙලෙස් නැති කිරීම

අධිවාසනා පහාතබ්බා - ඉවසීමෙන් කෙලෙස් නැති කිරීම

පරිවජ්ජනා පහාතබ්බා - දුරු කිරීමෙන් කෙලෙස් නැති කිරීම

විනොදනා පහාතබ්බා - බැහැර කිරීමෙන් කෙලෙස් නැති කිරීම

භාවනා පහාතබ්බා - සිත වැඩීමෙන් කෙලෙස් නැති කිරීම

අපගේ සිතේ පවතින සිතිවිලි පළමුවෙන්ම හරිහැටි හඳුනා ගත යුතුයි. තේරුම් ගත යුතුයි. මෙය තවත් සරුව පැහැදිලි කරනව නම් ඒ ඒ මොහොතේ සිතේ පවතින සිතුවිලිපිළිබඳ සිහියෙන් සිටිය යුතුයි. මොකද? අපේ සිතට මෙනෙහි කළ යුතු යහපත් හොඳ සිතිවිලිත් ඇති වෙනවා. මෙනෙහි නොකළ යුතු අයහපත් නරක සිතුවිලිත් ඇති වෙනවා. මේ සිතිවිලි යහපත් ඒවා ද, අයහපත් ඒවාදැයි හඳුනා ගත හැක්කේ සිතේ ඇතිවෙන, නැති වෙන සිතුවිලිගැන සිහියෙන් සිටියොත් විතරයි. සිතිවිලි හඳුනා ගත්තට පස්සේ කළ යුත්තේ යහපත් සිතිවිලි මෙනෙහි කිරීමයි. අයහපත් සිතිවිලි මෙනෙහි නොකිරීමයි.

**ආර්ය ශ්‍රාවක ප්‍රතිපදාව 02**

සිතිවිලි හරියාකාරව හඳුනා නොගත්තා නිසා බොහෝ වෙලාවට මෙනෙහි නොකළ යුතු අයහපත් නරක සිතුවිලිනැවත නැවතත් මෙනෙහි කරනවා. මෙහිදී "දස්සනා" යනු අයහපත් නරක සිතුවිලිඅයහපත් නරක සිතිවිලි ලෙසම දැකීමයි. ඒ සිතුවිලිවල අයහපත් බව තේරුම් ගෙන වටහා ගැනීමයි. "පහාතබ්බා" යනු ඒ අයහපත් නරක සිතුවිලිමෙනෙහි නොකර සිටීමයි.

අයහපත් සිතිවිලි නැවත නැවත මෙනෙහි නොකර සිටින විට, ඒවා ඉක්මණින්ම සිතෙන් බැහැර වෙනවා. සිතේ රැඳෙන්නේ නැහැ.

දැන් ඔබට ප්‍රශ්නයක් ඇති වෙයි මොනවද අපි මෙනෙහි නොකළ යුතු සිතිවිලි කියා. එයට බුදුරජාණන් වහන්සේම ලබා දීපු උත්තරයක් තියෙනවා. "මහණෙනි, මෙනෙහි නොකළ යුතු ධර්මයෝ (සිතුවිලි) මොනවාද? මහණෙනි, යම් ධර්මයන් මෙනෙහි කරන්නා වූ යමෙකුට නූපන්නා වූ කාම ආශාව උපදී ද, උපන්නා වූ කාම ආශාව වැඩි ද,නූපන්නා වූ භව ආශාව උපදී ද, උපන්නා වූ භව ආශාව වැඩි ද, නූපන්නා වූ අවිද්‍යා ආශාව උපදී ද, උපන්නා වූ අවිද්‍යා ආශාව වැඩි දමේ ධර්මයෝ මෙනෙහි නොකළ යුතුයි.

මෙම කාම, භව හා අවිද්‍යා ආශ්‍රවයන්ට වත්ථූපම සූත්‍රයේ දැක්වූ කෙලෙස් දහසයම ඇතුළත්. මෙම කෙලෙස් දහසය දැන, දැක හඳුනාගෙන නැවත නැවත මෙනහේ නොකිරීම දස්සනා පහාතබ්බයයි.

මෙනෙහි කළ යුතු සිතිවිලි මෙනෙහි කළ යුතුයි. ඒ මොනවාද? "මහණෙනි, යම් ධර්මයන් මෙනෙහි කරන්නා වූ යමෙකුට නූපන්නා වූ කාම ආශාව නූපදී ද, උපන්නා වූ කාම ආශාව පහ වේ ද,නූපන්නා වූ භව ආශාව නූපදී ද, උපන්නා වූ භව ආශාව පහ වේ ද, නූපන්නා වූ අවිද්‍යා ආශාව නූපදී ද, උපන්නා වූ අවිද්‍යා ආශාව පහ වේ ද මේ ධර්මයෝ මෙනෙහි කළ යුතුයි" තවදුරටත් දස්සනා පහාතබ්බය පුරුදු පුහුණු කරනව නම් කාමය, භවය හා අවිද්‍යාව පිළිබඳ ඇති ආශාව නැති වන සිතිවිලි විතරක් මෙනහේ කිරීම ප්‍රමාණවත් නැහැ. ඒ සඳහා මෙනෙහි කළ යුතු තවත් විෂය ක්ෂේත්‍රයන් රාශියක් තියෙනවා. ඉන් කිහිපයක් දක්වන්නම්.


රූපය, වේදනාව, සංඥාව, පෙතීම, ඇසීම ආදියේ යථා ස්වභාවය මෙනෙහි කරන්න ඕන. උදාහරණයක් හැටියට පැහැදිලි කරනව නම්, රූපය ලෙස හඳුන්වන බාහිර ලෝකයේ තියෙන්නේ ඇත්තටම වෙනස් වන ස්වභාවයක් නේ. වෙනස්වෙනව නම් ඒවා අනිත්‍යයි නේ. අනිත්‍ය නම් දුකයි නේ. දුකයි නම් තමාගේ යැයි ගත යුත්තක් නැහැ නේ. රූපයේ ඇති මෙන්න මේ යථා ස්වභාවය මෙනෙහි කළ යුතුයි. අනෙක් ඒවා ගැනත් මේ විදියටම මෙනෙහි කළ යුතුයි.

සිත තුළ හට ගන්නා සිතිවිලිත්, ඒ හා බැඳුණු සිත් ආදියත් හඳුනාගෙන මෙනෙහි කළ යුතුයි. ඒ සිත් වහ වහා වෙනස් වන හැටිත්, නැති වෙමින් නැවත නැවත ඇති වන හැටිත් මෙනහි කළ යුතුයි. එහෙම දීර්ඝ කාලයක් මෙනෙහි කරන කොට එය නුවණින් දකින්න පුළුවන් වෙනවා. "දස්සනා" කිව්වේ ඒ තත්වයයි.


දුක් ඇති වෙන්නේ තෘෂ්ණාව නිසයි. ඇලීම් ඇති වෙන්නේ ද තෘෂ්ණාව නිසාමයි. ඇලීමක් හෝ ගැටීමක් නැත්නම් දුකක් ද නැහැ. මේ බව අප හොඳින් තේරුම් ගත යුතුයි. නුවණින් දැකිය යුතුයි. දුකට හේතුව බාහිර ලෝකය නොව අපේම තෘෂ්ණා සහගත සිත බව හඳුනා ගත යුතුයි. තෘෂ්ණා සහගත සිත හඳුනා ගැනීම දුක්ඛ සමුදයේ දැකීමයි. එවිට දුක ඇති වෙන්නේ තෘෂ්ණාව නිසා නම්, තෘෂ්ණාව නැති කළ විට දුක ද නැති කළ හැකි බව වැටහෙනවා. ඒ වැටහීම දුක්ඛ නිරෝධයයි. දුක නැති කරන්නා තමා තුළ මනා දැක්මක් හා ක්‍රියා පිළිවෙතක් ඇති කර ගත යුතුයි. එම දැක්ම තුළින් තම දුර්වලතා වටහා ගෙන, ඒවා ක්‍රමක්‍රමයෙන් දුරු කරමින් ප්‍රබලතා ඉස්මතු කර ගත යුතුයි. ප්‍රබලතා වැඩීම තුළින් සිතේ සමාධිය ඇති කර ගන්න පුළුවන්. එයින් ඥානදර්ශනය ඇති වෙනවා. මේ මාර්ග සත්‍යයේ දැකීමයි. මේ මට්ටමට සිත සකස් වීමේ දී ශරීරය ස්ථිරයි සදාකාලිකයි යන හැඟීමඇති සක්කායදිට්ඨිය ද, බුද්ධාදී අටතැන්හි සැකය උපදවන විචිකිච්ඡාව ද, වැරදි ව්‍රත හා සීලයන්ට යොමු වන සීලබ්බතපරාමාසය ද පහව යනවා ඒකාන්තයි.

අපට ඇස, කණ, නාසය, දිව, ශරීරය හා මනස කියලා ඉන්ද්‍රියයන් හයක් තියෙනවා. මේ ඉන්ද්‍රියන්වලට කැමැති හැටියට අපි හැසිරෙන්න, ජීවත් වෙන්න පුරුදු වුවත් කෙලෙස්වලට බැඳෙනවා. කෙලෙස්වලට ඇලෙනවා. ගැලෙනවා. උදාහරණයක් හැටියට පැහැදිලි කරනව නම්, ලස්සන ලස්සන රූප පස්සේ යන්න ඇස කැමතියි. ඒ කැමැත්තට ඉඩ දීල ලස්සන රූප පස්සේ ගියොත් අප නතර වෙන්නේ බොහෝ අකුසල් රැස් කරගෙනයි. සාමාන්‍ය ජීවිතේ මහා කරදර ගොඩක පැටලිලයි. ඒ නිසා අනිවාර්යයෙන්ම ඇස සංවර කර ගත යුතුයි. අනෙත් ඉන්ද්‍රියන් පහත් ඒ විදියමයි. ඒ නිසයි මේ ඉන්ද්‍රියන් හය අපි සංවර කර ගත යුත්තේ. නැතිනම් ජීවිතය පුරාම දැඩි වෙහෙසකින් හා දැවිල්ලකින් තමයි ජීවත් වෙන්න වෙන්නේ. ඉන්ද්‍රියන් හය සංවර කර ගත්ත නම් වෙහෙසක් හා දැවිල්ලක් නැති බව බුදුරජාණන් වහන්සේම දේශනා කරල තියෙනවා.

> "අපේ සිතට මෙනෙහි කළ යුතු යහපත් හොඳ සිතිවිලිත් ඇති වෙනවා. මෙනෙහි නොකළ යුතු අයහපත් නරක සිතුවිලිත් ඇති වෙනවා. මේ සිතිවිලි යහපත් ඒවා ද, අයහපත් ඒවාදැයි හඳුනා ගත හැක්කේ සිතේ ඇතිවෙන, නැති වෙන සිතුවිලිගැන සිහියෙන් සිටියොත් විතරයි."



# අද දිනයේ අපේ වගකීම



ශ්‍රී ලංකා බෞද්ධ හා
පාලි විශ්වවිද්‍යාලයේ
හිටපු මහෝපාධ්‍යාය සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය,
කොළඹ කොටුව ශ්‍රී සම්බුද්ධාලෝක විහාරාධිපති,
දක්ෂිණ ලංකාවේ උප ප්‍රධාන සංඝනායක
**ආචාර්ය ඉත්තදෙමලියේ ඉන්දසර නා හිමි**

**ලෝක සෞඛ්‍ය සංවිධානය මේ වන විට කොරෝනා (කෝවිඩ්-19) වයිරසය ගෝලීය වසංගතයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත. මේ රෝගය ලෝකය පුරා ලක්ෂ පනහක පමණ ජනතාවට ආසාදනය වී ඇත. ආසාදිත රෝගීන් 325,000ක් පමණ මේ වන විට මිය ගොස් ඇත.**

තවමත් ලෝකය පුරා රටවල රෝගය පැතිරෙමින් තිබේ. ඇතැම් රටවල ශීඝ්‍රයෙන් පැතිරෙමින් පවතී. එබැවින් තව කොපමණ පිරිසකට රෝගය ආසාදිත වේද හෝ කොපමණ පිරිසකට ජීවිතය අහිමි වේද යන්න හෝ කිසිවකුට පුරෝකතනයක් කළ නොහැකිය.

මෙයට පෙර වසූරිය වසංගත රෝග තත්වයක් ලෝකය පුරා පැතිරිණි. 17-18 සියවස්වලදී යුරෝපය ඇතුළු රටවල් ගණනාවක විශාල පිරිසක් වසූරිය හේතුවෙන් මරණයට පත් වූ බව වාර්තා වේ. වසූරිය හේතුවෙන් 20 වන සියවස දක්වාම ජනතාව මිය ගියහ. වසූරිය ලෝකයෙන් තුරන් කළ බව ලෝක සෞඛ්‍ය සංවිධානය නිවේදනය කරන විට එම රෝගයෙන් මිලියන 3 ක පමණ ජනතාව මිය ගොස් තිබුණි. කොලරාව ද සියවස් ගණනාවක් මුළුල්ලේ මේ වන විටත් ලෝකයේ පවතින වසංගතයකි.

## ඉතිහාසයේ මාරාන්තිකම වසංගතය

මිනිස් ඉතිහාසයේ මාරාන්තිකම වසංගතය ලෙස වාර්තා වී ඇති 'ස්පාඤ්ඤ උණ' වසංගතය 1920 දී ලොව පුරා මිලියන 500 ක ජනතාවට එනම් ලෝක ජනගහනයෙන් තුනෙන් එකකට ආසාදනය විය. මරණ සංඛ්‍යාව ඇතැම් තැනෙක මිලියන 17 සිට 50 අතර ප්‍රමාණයක් ලෙස වාර්තා වන අතර එය මිලියන 100ක් තරම් විශාල සංඛ්‍යාවක් වූ බව ද කියැවේ. වසංගතවලට දුප්පත්කමක් පොහොසත්කමක්, උගත්කමක් නූගත්කමක්, ආගමක්, ජාතියක්, පළාතක්, තත්වයක් ආදී කිසිවක් අදාළ නොවේ. කවර කෙනෙකු වුවද ආරක්ෂක ක්‍රම පිළිපැදිය යුතු වේ. සාම්ප්‍රදායික නීතිරීතිවලට එකඟ නොවේය කියා හෝ තම ප්‍රතිපත්තිවලට නොගැළපේය කියා හෝ මේ නොපිළිපැද සිටිය නොහැකිය.

බුදුරජාණන් වහන්සේ එක්තරා අවස්ථාවක දී ස්වාමීන් වහන්සේලාට පවා දේශනා කර ඇත්තේ තමන් ජීවත්වන දේශයේ රජය පනවනු ලබන නීතිරීතිවලට අනුවර්තනය වී ජීවත් වන ලෙසයි.

## අවනත වීම

"අනුජානාමි භික්ඛවෙ රාජානං අනුවත්තිතුං". කාලීනව සමාජයේ යහපැවැත්ම වෙනුවෙන් ගනු ලබන තීරණවලට සෑම පුද්ගල ඒකකයක්ම අවනත විය යුතු වෙයි. අනෙක් අයගේ ප්‍රතිචාර කවරේදැයි විමසීමට වඩා තමන්ගේ නිවැරදි ප්‍රතිචාරය දැක්විය යුතුය.

"අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ" යන පාඨයෙන් අවධාරණය කරන්නේ තමන් මුලින්ම මානව හිතවාදී චින්තනය ගොඩනඟා ගත යුතු බවයි.

> බුදු දහමේ ඉගැන්වීම් සමාජගත වී සියලු පුරවැසියන්ට සාමයෙන් ජීවත්වීමේ සමාජ පරිසරයක් ගොඩනැංවෙන බව පෙනේ. හැම දෙන ඉවසීමෙන් කොරෝනා වයිරසය සමග ජීවත්වීමට සිදුව ඇති මේ යුගයේ අපේ වගකීම තේරුම් ගෙන කටයුතු කළහොත් සෞභාග්‍ය සම්පන්න අනාගතයකට අප හැමදෙනාටම හිමිකම් කිවහැකි වනු ඇත.

බුදුදහමෙහි හඳුන්වා දී ඇති පංචශීල ප්‍රතිපත්තිය බුද්ධිමත්ව අධ්‍යයනය කිරීමෙන් සමාජයට ඉමහත් සේවාවක් තනි පුද්ගලයෙකුට කළ හැකිය. එහි නිශේධාත්මක අර්ථය මෙන්ම ධනාත්මක ප්‍රවේශය අවබෝධ කරගත යුතුය. ප්‍රාණඝාතයෙන් වැළකීම තුළින් ගොඩනැඟෙන මෛත්‍රියෙන් තමාට බාධා හිරිහැර හා සතුරන්ගෙන් තොරව සුවසේ ජීවත්වීමට සුදුසු පරිසරයක් ගොඩනැඟෙනවාත් සමගම සමාජයේ සෙසු පිරිසගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම සහ එම අයිතියට ගරු කිරීමද සිදු වේ. කොරෝනා පැතිරෙන ක්‍රමවේද වැළැකීමට ලබා දී ඇති උපදෙස් පිළිපැදීම යනු එක පැත්තකින් අනෙක් අයගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීමක් බව තේරුම් ගත යුතුය. මේ දේ කළ හැකි වනුයේ පුද්ගල සංවරය තුළිනි. පුද්ගල සංවරය අද දිනයේ වඩාත් වැදගත් වේ. පුද්ගල සංවරය නැති තැන ඉවසීම ද පලා යයි. පුද්ගල සංවරය සහ ඉවසීම අන්‍යොන්‍ය වශයෙන් බැඳුණු ආධ්‍යාත්මික ගුණ ධර්මයෝ වෙති. මේ අප එම ආධ්‍යාත්මික ගුණධර්ම දියුණු කළ යුතු වකවානුවකි. අද දිනයේ එය අපේ වගකීමක් බව කිවයුතු නොවේ.

## සමාජ සංවරය

මෛත්‍රී, කරුණා, මුදිතා සහ උපෙක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ ද පුද්ගල සහ සමාජ සංවරය දියුණු කිරීමට යොදා ගත හැකි බෞද්ධ ඉගැන්වීමකි. අන්‍යොන්‍ය සුහදශීලිත්වය මිත්‍රත්වය වර්ධනය කර ගැනීමට මෛත්‍රිය හොඳ උපකරණයකි. කථා කරණ වචනයකින් කරණු ලබන ක්‍රියාවකින් තවත් කෙනෙකුගේ හදවත වේදනාවකට පත් නොකළ යුතුයි.

එයට මිත්‍රශීලිත්වය සමග කරුණාව තිබිය යුතු වේ. වෙනත් කෙනෙකුගේ පීඩාවක දී අපේ හදවතේ ගැස්මක් ඇති විය යුතුයි. ඒ ගැස්ම වන්නේ උදව් උපකාර කිරීමට ඉදිරිපත්වීමයි.

සමාජය තුළ ඇතිවන අසහනය, නොසතුට, අතෘප්තිකර බව ආදිය නැති කර ලීමට නම් පුද්ගල අවශ්‍යතා ඉටු කළ යුතු බව සමාජ මනෝ විද්‍යාඥයෝ පෙන්වා දෙති. ඇල්ෆ්‍රඩ් මාර්ෂල් සමාජ මනෝ විද්‍යාඥයා පවසන ආකාරයට අසහනය නොසතුට සහ අතෘප්තිකර භාවය සමාජයෙන් ඉවත් කිරීමට නම් ඒ සමාජයේ පළමුව ආහාර පාන සුලභවීම ද දෙවනුව ආරක්ෂාව තහවුරුවීම ද සිදු විය යුතුය. බලාපොරොත්තු නොවන ව්‍යසනකාරී තත්වයන්හි දී මේ අවශ්‍යතා ඉටු කර ගැනීමට යම් පමණකින් අසමත් වෙයි.

එහි දී මුළු මහත් සමාජයම එම තත්ත්වය අවබෝධ කර ගනිමින් දරා ගැනීමට ශක්තිය ගොඩනගා ගත යුතුය. ඒ සඳහා පාලක පක්ෂය සහාය විය යුතුවේ. එම නිසා රජු දසරාජ ධර්මවලින් සමන්විතව පාලනය කළයුතු බව බුදුදහමෙහි නිර්දේශ කර ඇත. පසුගිය කාලයේ ලිච්ඡවි පාලන ක්‍රමයට ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය කරන්නේ යයි ද, දසරාජ ධර්ම අනුගමනය කරන්නේ යයි ද හඬ ගා කීව ද එවැනි සමඟි සම්පන්න පාලන ක්‍රමයක් ආගම දහම ආරක්ෂා කෙරෙමින් රටේ අභිවෘද්ධියට පැවතියාදැයි යන්න විමසුම් ඇසින් බලන්නෙකුට තේරුම් ගත හැකිය.

සෘජු හා නිවැරැදි තීරණ ගන්නා නායකයෙක්


> "දානං සීලං පරිච්චාගං
> අජ්ජවං මජ්ජවං තපං
> අක්කෝධෝ අවිහිංසා ච
> ඛන්තී ච අවිරෝධතා"

රාජ්‍ය නායකයාගේ දසරාජ ධර්ම අනුගමනය කොරෝනා වයිරසය පැතිරෙන මේ යුගයේ දී පැහැදිලිව දැක ගත හැකිය. ව්‍යසනයකට මුහුණ දුන් අවස්ථාවකදී තම ජනතාව ජීවත් කරවීම පිණිස ගත හැකි සෑම යහපත් මාර්ගයක්ම ගනිමින් අර්ථවත්ව ක්‍රියා කිරීම නායකයාගේ වගකීම වේ. තම පාක්ෂිකයාගේ පමණක් නොව තම රටේ මුළු මහත් ජනතාවම තමන්ගේ දරුවන්ය යන හැඟීමෙන් ක්‍රියා කළ යුතු වෙයි. ඒ යුතුකම ඉටු කෙරෙන යුගයක් අද අපට දැකගත හැකිය. රාජ්‍ය නායකයා තපස් ගුණයෙන් යුතුව සරල ජීවිතයක් අනුගමනය කරමින් ආදර්ශ සම්පන්නව ජීවත්වීම ද දැකිය හැකිය. තම බලය අහිමිවේය යන බියකින් සෘජු තීරණ නොගැනීම එකල සිදු විය. නමුත් මෙකල සෘජුව හිඳගෙන නිවැරදි තීරණ ක්‍රියාත්මක කරනු පෙනේ.

දශක ගණනාවක් මුළුල්ලේ ජාතික උරුමයන් වශයෙන් පැවැති පෞරාණික සිද්ධස්ථාන සතුරු හස්තයන්ට ග්‍රහණය වෙද්දී නොඇසුණා කන් ඇතිව සිටි යුගය අවසන් වෙමින් පවතී. හොඳම උදාහරණය පොතුවිල් මුහුදු මහා විහාරය පිහිටි භූමිය ක්‍රමයෙන් සිදු වූ සංවෘතයට නිත තබා ආරක්ෂා කිරීමට වත්මන් නායකත්වය සෘජු තීරණයක් ගැනීම නිසාය. එය පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව පිළිබඳ ලැදියාව අති හැමදෙන ගේම අමන්දානන්දයට හේතු වෙයි. මෙවැනි නායකත්වයකට සහයෝගය දැක්වීම ද අද අපගේ වගකීමක් වෙයි.

බුදුදහමේ ඉගැන්වීම් සමාජගත වී සියලු පුරවැසියන්ට සාමයෙන් ජීවත්වීමේ සමාජ පරිසරයක් ගොඩනැංවෙන බව පෙනේ. හැම දෙන ඉවසීමෙන් කොරෝනා වයිරසය සමග ජීවත්වීමට සිදුව ඇති මේ යුගයේ අපේ වගකීම තේරුම් ගෙන කටයුතු කළහොත් සෞභාග්‍ය සම්පන්න අනාගතයකට අප හැමදෙනාටම හිමිකම් කිවහැකි වනු ඇත.

# තමන්ට තමන් පිළිසරණ වන්න



**මේ ලෝකයට බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙන්නේ ඉතාමත් කලාතුරකින්. එසේ පහළවන උන්වහන්සේ ලෝක සත්ත්වයා කෙරෙහි මහා කරුණාවෙන්, අනුකම්පාවෙන් ලෝ සතුනට දුකෙන් නිදහස් වීමට මග පෙන්වීම සිදු කරනවා.**

බුදුරජාණන් වහන්සේ නමකගේ කාර්යභාරය වන්නේ මේ ලෝක සත්ත්වයාට මේ ලෝක වශයෙන් සැපය, සතුට ළඟා කරගන්නා ආකාරය, පරලොව ජීවිතය සුවපත් කර ගන්නා ආකාරය කියාදීම මෙන් ම, දිගින් දිගට යන මේ සංසාරයේ ඉපදෙමින් මැරෙමින් යන සත්ත්වයාට සසරින් නිදහස් වීමට ඇති මාර්ගය පෙන්වීම යි. බුදුරජාණන් වහන්සේ නමක් මේ ලෝක සත්ත්වයාගේ හිතසුව පිණිස මෙන් ම, පරලොව ජීවිතය සුවපත් කර ගැනීමටත් ලොව්තුරා නිවන් සුවය සඳහා මග පෙන්වීම සිදු කරනවා. එනිසයි භාග්‍යවතුන් වහන්සේට සත්ථාදේව මනුස්සානං කියන විශේෂනා නාමය පාවිච්චි කරන්නේ. ඒ දෙවි මිනිසුන්ට ශාස්තෘන් වහන්සේ කියන අදහස යි

## ජීවිත සුවපත් කිරීම

ශෘස්තෘවරයෙකුගේ කාර්ය භාරය වන්නේ තමන්ගේ අනුගාමිකයන්ගේ ජීවිත සුවපත් කරලීම යි. බුදුරජාණන් වහන්සේ මූලිකව ම ඉපදි ඉපදී මැරි මැරී යන ජීවිතය සුගතිගාමි කර ගන්නා ආකාරය දේශනා කළ අතර, සුගතියේ ඉපදුණත් ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී දුක්වලින් නිදහස්වීමක් නො වන බව අවධාරණය කර ඒ දුකින් නිදහස් වීමට මේ සසර ගමන නවතාලීම සඳහා කටයුතු කරන්නට අපට මග පෙන්වා වදාළා.

සත්ත්වයා දිගින් දිගට ම සංසාරයේ සැරි සරන්නේ සත්ත්වයන්ගේ සිතු තුළ කෙලෙස් නිස යි. කෙලෙස් තිබෙන කෙනෙක් මරණින් මතු අනිවාර්යයෙන් නැවත උපතකට යනවා. යම් කෙනෙක් කෙලෙස් දුරු කළොත් ඒ නිකෙලෙස් උතුමාට මරණින් මතු උපතක් නැහැ. එසේම කෙලෙස් සහිත වීම නිසා තමයි සත්ත්වයා ඉපදෙමින් මැරෙමින් ඒ අතර කාලයේ විවිධ දුක්වලට ගොදුරුවෙමින් යන්නේ.


## දුකට වගකිවයුතු තමන් ම ය

කෙලෙස් හට ගන්නේ තමාගේ සිතේ. තමාගේ හිතේ හටගන්නා කෙලෙස්වලට අනුරූපීව නම් දුක් හටගන්නේ ඒ හටගන්නා දුකට මූලික ම වගකිවයුත්තා තමන්ම යි. මේ ලෝකයේ ජීවත්වන අප හැම දෙනාගේ ම වගකීම වන්නේ තමන් විසින් නිර්මාණය කර ගන්නා මේ දුක ඇතිවන ක්‍රමය නවතා ගැනීම යි. දුක ඇතිවන්නේ කෙලෙස් නිසානම්, කෙලෙස් ඇතිවීම පාලනය කර ගැනීම යි තමන්ට ඇති එකම පිළිසරණ. සිත තුළ කෙලෙස් පහළ වූ වහාම පව් සිදුවන්නේ නැහැ. කෙලෙස්වල ස්වභාවය තමයි සත්ත්වයා සසරට ඇද දැමීම. සසරට ඇද දමන සත්ත්වයා සුගතියට යන්නේ පින් කළ විට යි. දුගතියට යන්නේ පව් කළ විට යි. ඒ අනුව තේරුම් ගනිමු පින්, පව්වල යටින් දිවෙන බලවේගය වන්නේ අකුසල හෙවත් කෙලෙස් සහිත වීම බව.

එසේනම් දුකෙන් නිදහස් වීමට කැමැති පුද්ගලයා මුලින් ම කළයුත්තේ තමාගේ සිත තුළ හටගන්නා කෙලෙස් නවතා ගැනීම යි. කෙලෙස් පාලනය කර ගත්තොත් ඔහුට පුළුවන් ඒ කෙලෙස්වලින් ආරක්ෂා වෙන්න. සාමාන්‍ය කෙනෙකුට කෙලෙස් පාලනය එකවර ම කරන්න අමාරුයි. කෙලෙස් පාලනය කරන්නට කලින් කෙලෙස්වල තිබෙන භයානක බව පාලනය කළයුතු වෙනවා. කෙලෙස් පව් බවට පත්වෙන්නේ ඒවා සිතින්, කයින්, වචනයෙන් ක්‍රියාත්මක කරන විටයි.

පිනත්, පවත්, සංස්කාරයන්. සංස්කාර කියන්නේ ප්‍රතිසන්ධි විඤ්ඤාණයට උපකාරයක් වන ආහාරයක්. ප්‍රතිසන්ධි විඤ්ඤාණයෙන් තමයි සත්ත්වයා සසරට ඇද දමමින් උපතක් සකස් කරන්නේ. ඒ අනුව සිතින්, කයින්, වචනයෙන් කර්ම රැස්කර ගත්තේ නැති වුණොත් ඒ සත්ත්වයාට සසර ඉපදීමට අවශ්‍යවන කර්ම සැකසෙන්නේ නැහැ. ඒ නිසා ඉපදීම අවම කරගෙන, අඩු කරගෙන නවතා ගන්න පුළුවන්කම තිබෙනවා.

ඒ වගේම කයයි, වචනය යි, සිතයි කියන තුන් දෙරින් නරක ක්‍රියාකාරකම් හෝ හොඳ ක්‍රියාකාරකම් නවතා දැමුවට එයින් අදහස් කරන්නේ නැහැ ඔහුගේ හිත සම්පූර්ණයෙන් කෙලෙසුන්ගෙන් නිදහස් වුණා කියලා. ඔහුගේ සිතේ අනුශය වශයෙන් රාග, ද්වේෂ, මෝහය තිබෙන්නට පුළුවන්. අනුශය වශයෙන් රාග, ද්වේෂ, මෝහ තිබෙන පුද්ගලයාට නැවතත් ඒවා පදනම් කරගෙන අකුසල් ක්‍රියාත්මක වෙලා පින් හෝ පව් කෙරෙන්නට පුළුවන්.



කොළඹ බෞද්ධාලෝක මාවත
නාරද බෞද්ධ ධර්මායතනාධිපති
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත

**තලල්ලේ චන්දකිත්ති හිමි**

## සිත නිදහස් වන දිනය

එසේනම් විදර්ශනා නුවණින් අනුශය වශයෙන් සිත තුළ කිඳා බැසගෙන තිබෙන ඒ රාග, ද්වේෂ, මෝහ කියන කෙලෙස් ධර්මයන් මුලින් උපුටා දැමූ දවසටයි සිත සම්පූර්ණයෙන් කෙලෙස් වලින් නිදහස් වෙන්නේ. ඒ සිත කෙලෙස් වලින් නිදහස් වූ දවසට තමයි සිත නැවත සසරට නො වැටී තිබෙන්නේ. නැවත සසරට නො වැටෙන ආකාරයේ සිත් තිබෙන පුද්ගලයා නියම ආකාරයට තමන්ගේ සිත රැක ගත්තා වෙනවා. තමාට තිබෙන එකම පිළිසරණ තමා කියා කියන්නේ ඒ සිත හොඳින් රැක ගත්තොත් පමණයි. මේ සිත රැක ගැනීම සඳහා අවශ්‍ය කරන වැඩපිළිවෙල බුදුරජාණන් වහන්සේ දේශනා කළා. ඒ ආර්ය අෂ ධාංගික මාර්ගය, සත්තිෂ බෝධිපාක්ෂික ධර්ම ආදීයෙන් විස්තර කර දී තිබෙනවා. මේ දහම් මග ලෝකයට මනාව විවර කර පෙන්වා දී තිබෙන විට අපේ වගකීම වන්නේ ඒ මග ගමන් කිරීම යි.

## මග විමසන්නා ගේ වගකීම

බුදුරජාණන් වහන්සේ වදාළා ඔබ ඔබේ කාර්ය භාරය කර ගන්න. තථාගතවරුන් කියන්නේ මාර්ග උපදේශකයන් පමණයි. මාර්ග උපදේශකවරුන්ගේ කාර්ය භාරය වන්නේ මග විමසන්නාට මාර්ගය නිසිලෙස පැවසීම පමණ යි. මාර්ගය විමසන්නාගේ වගකීම වන්නේ විමසූ මග කියාදුන් මාර්ගෝපදේශකයාට වැඳ වැඳ සිටීම නොවේ. ඒ කියාදුන් මාර්ගයේ නිසිලෙස ගමන් කොට ඒ අදාළ ස්ථානයට ළඟා වීමයි.

මේ ලෝකයේ ජීවත්වෙන හැම කෙනා ම සැපයට කැමැතියි. දුකට අකමැති යි. අපි හැමෝ ම උත්සාහ කරන්නේ සැප විඳීමට යි. දුකෙන් ඈත් වීමට යි. ඒ නිසා ඔබ ඔබට නිසි ලෙස ආදරය කරනවානම්, සෙනෙහස දක්වනවා නම්, මෛත්‍රී සහගතනම් කිසිදු මොහොතක ඔබේ සන්තානය දුකට ඇද දමන්නට, වේදනාකාරී ස්වභාවයට පත් කරන්නට පෙළෙඹෙන්නේ නැහැ. හැම මොහොතකම සිත සතුටින් තබා ගන්න වැයම් කරන්න. සිත සතුටින් තබා ගන්න නම් සිත තුළ නිරන්තරයෙන් කුසලය බලවත් වෙන්න ඕනේ. කුසලය දියුණුවෙන සිතක් තමයි කයින්, වචනයෙන් යහපත් දේ කරන්නට පෙළෙඹෙන්නේ. සිත, කය , වචනයෙන් හොඳ දේ කරන පුද්ගලයා මෙලොවත් සතුටු වෙනවා. පරලොවත් සතුටු වෙනවා. මා විසින් පින් කළා කියා දෙ ලොව ම සතුටු වෙනවා. මා කළ පින නිසා මට සුගතියට යන්න ලැබුණා කියා මැනවින් සතුටු වෙනවා.

ඒ අනුව ඔබ ඔබට ආදරේ නම් ඔබ ඔබට පිළිසරණ වෙනවානම්, ඔබ කළ යුත්තේ මේ ලෝකයේ යහපත් කියන දේ සිදු කරනවා. ඒත් ඒ දේට නො ඇලී සිටිනවා. හොඳ දෙයට අනුරූපී විපාකයක් ලැබුණ විට එය පරිහරණය කරනවා. එයට ගිජු නො වී සිටිනවා. මේ සියල්ල අත හරින්නට දවසක් එනවා කියා අවබෝධයෙන් කල්පනා කරන පුද්ගලයාට දුකක් නැතිව එය අත්හැර ගන්නට හැකියාව තිබෙනවා. මේ මානසිකත්වය නිසිලෙස ගොඩනගා ගැනීම යි කෙනෙක් තමාට පිළිසරණ වුණා කියන්නේ. අපි මරණාසන්න මොහොතේ දී අපේ සිතට ගොදුරු වෙන්නේ අම්මා, තාත්තා විසින් අපේ සිතට දපු සිතිවිලි නොවේ. දෙවියන්, බ්‍රාහ්මණයන් දැමූ සිතිවිලි නොවේ. අප විසින් ම ගොඩනගා ගන්නා සිතිවිලි අනුව තමයි අපේ මෙලොව ජීවිතයේ සතුට රැඳෙන්නේ. පරලොව ජීවිතයේ සුගති, දුගති ඉපදීම තීරණය වන්නේ.


## වාසනාව රැඳී තිබෙන්නේ තමන් අතයි

එබැවින් ඔබටයි ඔබේ මෙලොව ජීවිතය වාසනාවන්ත කර ගැනීමට හැකියාව තිබෙන්නේ. පරලොව ජීවිතය සුවපත් කර ගැනීමට හැකියාව තිබෙන්නේ. ඒ වගේම සියලු සාංසාරික දුකෙන් එතෙර ව ලැබෙන අමා නිවන් සුව ශාක්ෂාත් කර ගැනීමට හැකියාව තිබෙන්නේත් ඔබට යි. එනිසා ඔබ ඔබට සැබැවින් ම ආදරේ නම්, සියලු ජාති පව්වලින් වළකින්න. ඒ වගේම පින් දහම් වැඩි වැඩියෙන් කරන්න. ඒ තුළ ඔබ සුවපත් වෙනවා වගේම දුර්ලභව ලැබුණ බුද්ධ ශාසනය තුළින් පරම පවිත්‍ර නිර්මල ධර්මය අසා ඒ ඇසූ ධර්මයට අනුකූලව ජීවිතය ගත කර නිර්වාණ මාර්ගයේ ගමන් කරමින් කෙලෙස් ප්‍රහානය කිරීමට වැයම් කළොත් සැබවින් ම ඔබ ඔබට පිළිසරණක් කරගත් පුද්ගලයෙක් වෙනවා.

නයනා නිල්මිණී



# ප්‍රමාද වී පසු නොතැවෙන්න



ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය
රාජකීය පණ්ඩිත දර්ශනපති
කන්දේගම
දීපවංසාලංකාර හිමි

**බුදු දහමේ ඉගැන්වෙන ශ්‍රේෂ්ඨ ඉගැන්වීම් අතර සීලය ප්‍රධාන තැනක් ගනී. විශේෂයෙන් ම බුදු දහමේ සීල, සමාධි, ප්‍රඥ යනුවෙන් ත්‍රිශික්ෂාවක් ඉගැන්වේ.**

ත්‍රිශික්ෂාව නම් මනුෂ්‍යයන් විසින්, සත්පුරුෂයන් විසින් පුරුදු පුහුණු කළ යුතු තත්ත්වයන් හැටියටයි හඳුනා ගැනීමට පුළුවන්කම ලැබෙන්නේ. එහි ප්‍රධාන අංගය හැටියට, භාග්‍යවතුන් වහන්සේ උගන්වන්නේ සීලයයි. එනම් සීලයෙන් තොර සමාධියක් අපට දකින්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. සමාධිය තුළින් ලබා ගන්නා වූ ප්‍රඥවටත් සීලයයි පදනම බවට පත්වන්නේ. “යම් කිසි ගොඩනැගිල්ලක් සකස්වෙනවා නම්, එහි පාදම ශක්තිමත් විය යුතු වෙනවා. ඒ වගේ ම ආර්ය ශ්‍රාවකයා එසේත් නැති නම් යම් කිසි පුද්ගලයෙක් ආර්ය භාවයට පත්වීම සඳහා උත්සාහයක් ගැනීමේ දී ඔහු තුළ ගොඩනගා ගත යුතු ප්‍රධාන ලක්ෂණය වන්නේ සීලයයි.

බුදුරජාණන් වහන්සේගේ තවත් ඉගැන්වීමක් වන්නේ, මේ ලෝකයේ මනුෂ්‍යයන් ගොඩනගා ගත යුතු ආර්ය ධනයන් හතක් පිළිබඳව. ඒ ආර්ය ධනයන් හත අප හඳුන්වන්නේ සප්ත ආර්ය ධනය යනුවෙනි. සප්ත ආර්ය ධනය, එනම් ශ්‍රේෂ්ඨ වූ උසස් වූ ධනයන් හතක්. මේ ලෝකයේ කොයි කවුරුත් මේ ධනයන් හත සම්පූර්ණ කර ගැනීමට උත්සාහවත් විය යුතු වෙනවා. එහි පළමු ධනය වන්නේ සද්ධා ධනං, සීල ධනං පළමු ධනය ශ්‍රද්ධාව, ශ්‍රද්ධාව තුළින් සීලය ගොඩනැගෙන්නේ. ත්‍රිශික්ෂාවන් හි මුල සීලය හැටියට හඳුන්වනවා. සීලය ගොඩනගන්නට නම් ශ්‍රද්ධාව තිබිය යුතු වෙනවා. ශ්‍රද්ධාව පසුබිම් කරගෙනයි, සීලය ගොඩනැගෙන්නේ. සීලය පදනම් කරගෙනයි සමාධිය ගොඩනැගෙන්නේ. ඒ තුළිනුයි ප්‍රඥවට යා හැකි වන්නේ.

ඒ වගේ ම දස රාජ ධර්ම අතර බුදුරජාණන් වහන්සේ දෙවැනි තැන් හි ලා හඳුන්වනවා. “දානං සීලං පරිත්‍යාගං” කියා. සීලය බලවත් වෙනවා, පාලනයක් ගෙනයෑම තුළ දී. නායකත්වයක් දැරීම තුළ දී තමන්ට තමන්ගේ ඉන්ද්‍රියයන් යම් සංයමයකින් තබා ගත නොහැකි නම් ඔහු අසාර්ථක පුද්ගලයෙක් බවට පත්වෙනවා. ඒ නිසා රාජ්‍ය කරන රජ දරුවන් පවා ඉන්ද්‍රිය සංවරය පිණිස සීලය ආරක්ෂා කළ යුතු වෙනවා. “කාය වාචානං සමොදනං සීලං” සීලයේ ප්‍රධාන ඉලක්කය වන්නේ කය, වචනය දෙකෙහි සංවරය බවයි. මනාසික ඒකාග්‍රතාවය භාවනාවෙන් ඇති කරන විට, සීලය කයෙහි සංවරයත්, වචනයෙහි සංවරයත් අපේක්ෂා කරනවා. ඒ නිසා දස රාජ ධර්මය උගන්වන තැන දී, දස පාරමිතා උගන්වන තැන දී බුදුරජාණන් වහන්සේ සීලය අනිවාර්ය අංගයක් හැටියට පුරුදු පුහුණු කළ යුතු බවට දේශනා කර තිබෙනවා.

ඒ වගේ ම බුදුරජාණන් වහන්සේගේ දේශනා තුළින් අපට දැනගන්නට පුළුවන් සීලය බිඳගත් කෙනෙකුට කිසිදු ආර්ය මාර්ග තත්ත්වයකට ළඟාවිය නොහැකි බව. ඒ නිසයි උපසම්පද භික්ෂූන් වහන්සේලා තමන්ගේ අතින් යම් අඩුපාඩුවක් සිදු වූ වේ නම්, වැඩිමහල් භික්ෂුවකට ඒ බව දන්වා එයින් පිරිසුදු විය යුතු වන්නේ. මේ කාර්යය නැතිනම්. පවිත්‍රත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ය. ඒ නිසා ගිහි වේවා, පැවිදි වේවා කිසියම් සීලයක පිහිටා සිටීම අනිවාර්යය අංගයක් වෙනවා. නැතිනම් කායික වශයෙනුත් වාචික වශයෙනුත් පුද්ගලයා තුළින් දුශ්චරිත බිහි වීමේ ප්‍රවනතාව ඉහළ තලයට පත්විය හැකියි. දිනක් බුදුරජාණන් වහන්සේ චුන්ද හිමියන් අමතා සිදු කරන ප්‍රකාශය ඉතාම බලවත් “චුන්දය ශ්‍රාවකයන්ට හිතවත් වූ ඔවුන්ට අනුකම්පා කරන යම් ශාස්තෘවරයෙක් මේ ලෝකයේ සිටී ද, ඒ ශාස්තෘවරයා විසින් තම ශ්‍රාවකයන්ට කළ යුතු යුතුකම් සියල්ලක් ම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් ද ඔබට දේශනා කරයි. චුන්දය අර තිබෙන්නේ රුක් මුල්ය. ශූන්‍යාගාර ය. එබැවින් ධ්‍යානය සඳහා යොමු වන්න. ධ්‍යානය නම් භාවනාව යි. භාවනාවෙහි නිරතවන්න. පමා නොවන්න එසේ නොකර පසුබට වන ඔබට අනාගතයේ දී විපිලිසර තත්ත්වයක් ඇති කර නොගන්න කියා. එසේ නැතිනම් චුන්දය පමා නොවන්න. පමා වී පසුතැවෙන්න එපා. යන්නෙන් බුදුරජාණන් වහන්සේ චුන්ද හිමියන්ට දේශනා කරනවා.” මෙම කාරණාවෙන් අපට පැහැදිලි වන්නේ අපගේ ශාස්තෘන් වහන්සේ අප කෙරෙහි මොනතරම් අනුකම්පාවකින්, මොනතරම් උවමනාවකින් අපව මේ සසර දුකින් මුදවීම සඳහා අනුශාසනා කර තිබෙනවා ද? මඟ පෙන්වා තිබෙනවා ද? චුන්දය පමා නොවන්න, පමා වී පසුතැවෙන්න එපා යනුවෙන් කරන කාරුණික දේශනය අපි කොයිකාටත් තදින් සිතට දැනෙන කාරණාවක්. ඒ නිසා සීලය පිරීමට අදින් අධිෂ්ඨාන කර ගන්නට ඕනේ. තමන්ගේ ජීවිතය එක සිල්පදයක් හෝ ආරක්ෂා කර ගැනීමට පෙළඹෙන්නේ නම් එය විශාල ආධ්‍යාත්මික ශක්තියක් බවට පත්වෙනවා. බාහිරෙන් අපට සිදුවන්නට තිබෙන උවදුරු වළක්වා ගැනීමේ හොඳ පළිහක් බවට සීලය පත්වෙනවා. ජීවන දැකීමට අවශ්‍ය වන නිර්වාණ මාර්ගය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හොඳ පහන් ආලෝකයක් බවට ද පත්වෙනවා.

> සිල් රකින කෙනෙකුට ඕනෑම අතුරු ආබාධයකින් වැළැක්වීම සඳහා එය හොඳ පළිහක් බවට පාවිච්චි කරන්නට පුළුවන්. සීලයක් පිරූ කෙනෙකුට ඕනෑම මොහොතක දී තමන්ට උවදුරක් කරදරයක් එනවිට ඒ සීලය මෙනෙහි කරලා සත්‍යක්‍රියාවක් කරන්නට පුළුවන්කමක් ලැබෙනවා.

දිනක් දෙදෙව් ලොවට අධිපති ශක්‍ර දෙවියෝ බිමට දන ගසා වන්දනා කරන අවස්ථාවේ දී මාතලී දිව්‍ය පුත්‍රයා මෙලෙස අසන ලදී. දෙදෙව් ලොවට අධිපති වූ ඔබතුමා මොකද මේ මනුෂ්‍ය ලොවට වන්දනා කරන්නේ යැයි කියා. ඒ අවස්ථාවේ දී ශක්‍ර දෙවියෝ මාතලී දිව්‍ය පුත්‍රයාට මෙසේ ප්‍රකාශ කරනවා. “මාතලී, මේ මනුෂ්‍ය ලෝකයේ යම් කිසි ගිහියෙක් පින්කම් කරමින්, සිල්වත් ව සිටිමින් කටයුතු කරන උපාසකයෙක් වේද? ඒ උපාසකයා ධාර්මික ජීවන උපාය ක්‍රමයන් අනුගමනය කරමින් අඹු දරුවන් පෝෂණය කරමින් ඉන්නවා ද? මාතලී මම ඒ තැනැත්තන්ට වන්දනා කරනවා” යැයි ශක්‍ර දෙවියෝ සඳහන් කරනවා.

මෙයින් පැහැදිලි වන්නේ සීලයක් පුරන කෙනෙක් දෙවියන් ඉදිරියේ යදින්නට යන්නේ නැහැ. ගිහි වේවා පැවිදි වේවා යම් කිසි කෙනෙක් දෙවියන්ගෙන් යදිමින්, දෙවියන්ගෙන් ඉල්ලමින් සිටිනවා කියන්නේ ඔහුට තමන් පිළිබඳව ප්‍රතිපත්ති පුරලා ආධ්‍යාත්මික ශක්තියක්, එසේ නැතිනම් අභිමානයක් නැති පුද්ගලයෙක් බවට පත්වෙලා තිබෙනවා. එයයි අප සඳහන් කළේ සිල් රකින කෙනෙකුට ඕනෑම අතුරු ආබාධයකින් වැළැක්වීම සඳහා එය හොඳ පළිහක් බවට පාවිච්චි කරන්නට පුළුවන්. සීලයක් පිරූ කෙනෙකුට ඕනෑම මොහොතක දී තමන්ට උවදුරක් කරද-රයක් එනවිට ඒ සීලය මෙනෙහි කරලා සත්‍යක්‍රියාවක් කරන්නට පුළුවන්කමක් ලැබෙනවා. වට්ටක ජාතකය සත්‍යවාදීකමේ ප්‍රතිමූර්තියක් . ඒ නිසා කොයි කවුරුත් කායික වශයෙනුත්, මානසික වශයෙනුත් සුවපත්වීම සඳහා සීලය පිරීම අත්‍යවශ්‍ය වෙනවා.

සීලයේ අනුසස් ලෙස ගත් විට උපදින සෑම භවයක දීම මනා වූ රූපසම්පත්තියක් ඇතිව උපදින්නට හැකියි. විශේෂයෙන් ම කාමමිච්ඡාචාරය වැනි දුසිරිත්වලින් වැළැකී බ්‍රහ්ම චරියාව වැනි සුසිරිත්වල යෙදෙන අයෙක් උපදින සෑම භවයකදී ම ඉතාමත් ම ශෝභා සම්පන්නයි.

ඉතාමත් ම උපදිසම්පත්තියෙන් යුක්ත පුද්ගලයන් හැටියට උත්පත්තිය ලබනවා. ඒ වගේ ම කීර්තිය, ප්‍රශංසාව, නම්බුනාම මේ සියල්ලත් සීලයේ අනුසස් ලෙස සසර පුරාවට ම උරුම කර ගන්නට පුළුවන්. ඒ නිසා ඔබ කල්පනාවට ගන්නට ඕනෑ තමන් මෙතෙක් ආරක්ෂා කළ යම් සිල්පදයක් වේ නම්, ඒ සීලය දිවි දෙවැනි කොට ආරක්ෂා කරන්න අවශ්‍යයයි.

බුදුරජාණන් වහන්සේ වරක් අප කෙරෙහි විශ්වාසයක් තබනවා. එනම් මගේ ශ්‍රාවකයෝ නම් ජීවිත හේතුවක් නිසාවත් ශික්ෂා ගරුත්වය ඉක්මවා යන්නේ නැහැ යන්නයි. ඒ නිසා මොනම අමාරු අවස්ථාවකදී වුවත් දිවි දෙවැනි කොට සිල්වත් වන්නට, සිල්පද ආරක්ෂා කරන්නට අධිෂ්ඨාන කර ගන්න. සැබවින් ම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් බවට පත්වන්නට උත්සාහ කරන්න.

දීපා පෙරේරා

බුදු සරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
වෙසක් අමාවක 2020.05.22

## නායකත්වයේ ආදර්ශය

බෞද්ධ සමාජය පන්සිල් සුරකින සමාජයකි. පන්සිල් ගරු කරන සමාජයකි. එය අර්ථවත් කරන්නේ මානුෂීය ගුණ ධර්මයන්හි විකාශනය යි. ඒ මානුෂීය ගුණ සුවඳ, සිල් සුවඳ අපගේ චර්යාවන්ගේ සේ ම ආකල්පයන්හිද විය යුතු ය. එසේ නො වන සමාජය අදැහැමි ය.

ඒ අනුව තමන් සිටින්නේ කොතැන ද යන්න තම තමන් ම අවබෝධ කරගත යුතු ය. තමන්ගේ සිතුම් පැතුම්, හැසිරීම් ඒ සමාජය තුළ විද්‍යාමාන වන බව අවබෝධ කරගත යුතු ය.

මෙහිදී නායකත්වයට වෙසෙස් වටිනාකමක් හිමිවේ. ජීවිතයේ විවිධ අවස්ථාවන් හි අප සැම විවිධාකාරයට නායකත්වය දරමු. පවුලක නම්, එහි පියා මවට හා දරුවන්ට නායකයා ය. පියා නො මැතිනම් මව නායකත්වය දරන්නී ය. වැඩිමහල් සහෝදර සහෝදරියන් විසින් බාල සහෝදර සහෝදරියන්ට නායකත්වය දෙනු ලබන්නේ ය. කුඩා සමාජ කණ්ඩායම් තුළ, පන්සල, පාසල, රැකියා ආයතනය, ගොවිබිම, ආදී ස්ථානවල සේ ම බස්රිය දුම්රිය තුළ පවා නායකත්වයක් දැකිය හැකි ය.

කකුළු මව ඇදට යමින් සිය කකුළු දරුවන්ට කෙළින් යන්නට උගන්වනවා වැනි යැයි කතාවක් අපේ ජන වහරේ එයි. කකුළු අම්මා මොන තරම් උත්සාහ කළ ද, ගමන් විලාසය වෙනස් නො කළේ නම් කිසි දිනෙකත් දරුවන්ට කෙළින් ඇවිදින්නට නොහැකි වනු ඇත. මේ සරල කියමන තුළ ම අපට බොහෝ දේ උගත හැකි ය. කුඩා දරුවෙක් ලෙස මෙලොව බිහි වූ ද පටන් ආරම්භ කරන ජීවිතය තුළ කවර හෝ නායකත්වයක් දරන්නේ නම්, තමන් ආදර්ශවත් විය යුතුම ය. බෝසත් චරිතය පුරාම, අපගේ සම්බුදු පියාණන් වහන්සේගේ චරිතය පුරාම ඇත්තේ ආදර්ශය යි. උන්වහන්සේ වදාළ ශ්‍රී සදහම් මග යන බොහෝ බෞද්ධයන් ඒ ආදර්ශය සිය ජීවිතාදර්ශය බවට පත්කර නො ගන්නේ ඇයි ද යන්න ගැටලුවකි.

එය වහ වහාම විසඳා ගැනීම කාලීන අවශ්‍යතාවයකි. ඒ මානුෂීය ගුණධර්ම පිරිහෙමින් යන ස්වභාවයක් සමාජය තුළ විද්‍යාමාන වන නිසා ය. ආහාරයේ සිට, ඇඳුමේ පැළඳුමේ සිට උඩු යටිකුරු වූ ස්වභාවයක් පෙනෙන්නට තිබුණි. මේවා බෞද්ධ ආචාර ධර්මවලට පටහැනි ය.

කොරෝනා වසංගත උවදුරත් සමඟ බොහෝ දෙනෙක් මේ තත්ත්වයෙන් මිදුණ බව පෙනුණ ද ඇතැමෙක් තවමත් පාඩම් ඉගෙනගෙන ඇතිබවක් නො පෙනේ. ඊට හොඳම උදාහරණ මේ වසංගත සමයේ ම අපට දැකගත හැකි වුණි. තැනෙක ඇඳිරි නීතිය කඩ කරන්නන් ය. තවත් තැනෙක මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ය. මත්වතුර අලෙවිසල් අසල පෝලිම් ගැසුණු පිරිස් හැසිරුණු ආකාරය, කළ ප්‍රකාශ ජනමාධ්‍ය ඔස්සේ දැක ගන්නට ලැබුණි. මොවුන්ගෙන් බොහෝ දෙනෙක් පියවරු ය. පවුලට නායකත්වය දෙන්නෝ ය. ඉදින් පියා මත් වූ කල දරුවන්ට යන කල කියා කුමට ද?


කවර නායකත්වයකට වුවද සිහි කල්පනාව අත්‍යවශ්‍ය ය. දුර දක්නා නුවණ, ප්‍රශ්න ගැටලු විසඳා ගැනීමට හා ඉදිරි අභියෝගයන්ට මුහුණ දීමට හැකිවීම, ප්‍රතිපත්තිගරුක බව අත්‍යවශ්‍ය ය. වරදෙහි දැඩි බව සේ ම මෘදු පැවතුම් ඇත්තෙක් විය යුතු ය. අවංක විය යුතු ය. ඍජු විය යුතු ය. වරද නිවැරද හඳුනා ගත හැකි විය යුතු ය. සියලු දෙනාට මෛත්‍රී සහගත විය යුතු ය.

අද අප ජාතියක් ලෙස මේ රටට සමාජයට අපගේ යුතුකම් ඉටු කළ යුතු ව තිබේ. අපට ආදර්ශවත් නායකත්වයක් ලැබී තිබේ. ඒ අනුව රටට යහපත් අනාගතයක පෙර ලකුණු තිබේ. ලෝකයක් දණ ගැස් වූ වසංගතයක් ඉදිරියේ අපිට නැඟී සිටින්නට හැකිව තිබීම ම උදාහරණයකි. ඒ නායකත්වය අනුව යමින් පුරවැසියන් ලෙස අපේ යුතුකම් ඉටු කරනවා නම්, යහපත්, අනලස් මිනිසෙක් ලෙස වගකීම් දරනවා නම් ජාතියක් ලෙස නැඟී සිටීම අසීරු නොවේ. ඒ සඳහා අවශ්‍ය අධිෂ්ඨානය හා වීර්යය යි.



# රෝගීන් අතර නිරෝගී වීම සැපයකි

**පුරා වසර හතළිස් පහක් පුරා බුදුරජානන් වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය සාරාංශ ගත කළ විට සෑම සත්ත්වයෙක් තුළම ප්‍රධාන ලක්ෂණ හතරක් ඇති බව තහවුරු වෙනවා.**



**පොල්පිටිමූකලානේ පඤ්ඤසිරි හිමි**

එනම් ජාති, ජරා, ව්‍යාධි, මරණ යන ධර්මතාවයන්. ඉපදීම, වයසට යාම, ලෙඩවීම, මරණයට පත්වීම යන ලක්ෂණ හතරෙන් ගැලවීමට හැකි සත්ත්වයෙක් මේ විශ්වයේම නැහැ. ඉහත කරුණු අතරින් මේ දිනවල අපට වඩාත් සමීප ව දැනෙන්නේ ව්‍යාධිය හෙවත් ලෙඩවීමයි. එයට හේතුව අද මුළු ලෝකයම කොවිඩ් 19 හෙවත් කොරෝනා වසංගතයෙන් පීඩා විඳීමයි. මෙය ලෝකයේ මුලින්ම ඇතිවූ වසංගතය නොවේ.

ලෝක ඉතිහාසයේ මෙවැනි වසංගත විශාල ප්‍රමාණයක් ඇති වී තිබෙනවා. බුදුරජාණන් වහන්සේගේ කාලයේදී විශාලා මහනුවර ඇති වූ රෝග භය, අමනුෂ්‍ය භය, දුර්භික්ෂය නිසා තුන් බියක් හටගත් බව අප දන්නවා. එකල අභිවාතකනම් දරුණු රෝගයක් පැතිරුණු අතර එය පාලනය කිරීම සඳහා වර්තමානයේ භාවිතා කරන සමාජ දුරස්ථකරණය භාවිත වී තිබෙනවා. අභිවාතක රෝගය වැළඳුණු රෝගීන් බිත්තියක් බිඳගෙන හෝ වහලයේ උළු ගලවාගෙන ගිය බව සඳහන්වෙනවා.

මහාවංශයේ 36 වෙනි පරිච්ඡේදයේ සඳහන් වන ආකාරයට සිරිසඟබෝ රජතුමාගේ පාලන සමයේදී "රක්තාක්ෂි" නම් උවදුරක් ඇතිවී තිබෙනවා. එය අමනුෂ්‍ය බලපෑමක් නිසා ඇති වූ රෝගයක්. රජතුමා ඒ අවස්ථාවේදී උතුම් උපෝසථ ශීලයේ පිහිටා අමනුෂ්‍යයන් දමනය කර රට නිදහස් කරගත් ආකාරය මහාවංශයේ සඳහන් වෙනවා. තවත් අවස්ථාවකදී නියංසාය දුරු කිරීමට එතුමා විසින් මහාසෑයේ දැඩි අධිෂ්ඨානයක් සිදු කරනවා. අවසානයේ රටට වැසි ලැබී සෞභාග්‍යය උදා වූ බව එහි සඳහන් වෙනවා.

ලෝකයේ බලවතුන් අතර ශ්‍රීලංකාව ඉතා කුඩා රටක් ලෙස මේ වසංගත ව්‍යාප්තිය වළක්වා ගැනීමට කටයුතු කර තිබෙන ආකාරය ඉතා විශිෂ්ටයි. මේ නිසා අපට සැනසුම් සුසුමක් හෙළීමට හැකියාවක් තිබෙනවා. මේ මොහොතේදී අමනුස්සකමින් පිරුණු මිනිසුන් කොපමණ සිටියත් අප අතර තවමත් සත්පුරුෂ ගුණසම්පන්න දෙවියන් වැනි අන් අය වෙනුවෙන් කැපවුණු තමදිවි පරදුවට තබා කටයුතු කරන උත්තම පුරුෂයන් සිටින බවද තහවුරු කළා. ඒ අතර ප්‍රධාන පුරවැසියා වන ජනාධිපතිතුමා ප්‍රමුඛ අනෙකුත් රාජ්‍යතාන්ත්‍රිකයන් ද විශේෂඥ වෛද්‍යවරුන් හෙද හෙදියන්, සුළු සේවකයන්ද, හමුදාපති ඇතුළු සියලු හමුදා නිලධාරීන්ද, පොලිස්පති ඇතුළු සියලු පොලිස් නිලධාරීන්ද, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ආදී පිරිසද ජනමාධ්‍ය හා මහාසංඝරත්නය ඇතුළු සියලු ආගමික නායකයින්ද සිහිපත් කළ යුතුය. අප රට තුළ යම් ආකාරයක රෝග පැතිරීමක් සිදු වී තිබෙන්නේ වෛද්‍ය උපදෙස් නිසි පරිදි පිළි නොපැදීම නිසාම බව ප්‍රඥ ගෝචර පිරිසට පැහැදිලි වෙනවා.

එදා බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි ජාති, ජරා, ව්‍යාධි, මරණ යන විශ්වීය ධර්මතාවලින් අපට ගැලවීමට පුළුවන් කමක් නැහැ. ගිරිමානන්ද සූත්‍රයේදී මේ බව මනාව පැහැදිලි කෙරෙනවා. ආරෝග්‍ය පරමාලාභා" නිරෝගිකම උතුම්ම ලාභයයි. කොතරම් ධනය, බලය තිබුණද රෝගයකට යටත් වීමට සිදුවෙනවා. පංචකාමයෙන් උන්මාදයට පත් වී සදාතනිකව ජීවත් වීමට සිටි සියලු දෙනා තුෂ්නිම්භූත භාවයට පත් කරමින් මුළු ලෝකයම උඩු යටිකුරු කිරීමට මේ වයිරසයට හැකි වී තිබෙනවා. පෘතුගාලයේ ධනවත්ම බිලියනපතියකු හා බැංකු හිමිකරුවකු වන අන්තෝනියෝ පියර් මහතා කොරෝනා ආසාදනය වීම හේතුවෙන් මරණයට පත්වුණා. "කොපමණ මුදල් තිබුණත් නොමිලයේ ලැබෙන හුස්ම ගැනීමට බැරිවීම නිසා මගේ පියා මියගියා" යනුවෙන් ඔහුගේ දියණිය ප්‍රකාශ කර තිබුණා. මිනිසා මානව පරිණාමයේ සිට අද දක්වා ආ ගමන් මගේදි ස්වභාව ධර්මයට එරෙහිව යාම නිසා ස්වභාව ධර්මය විසින්ම මිනිසාට පාඩම් උගන්වා තිබෙනවා. තවදුරටත් ස්වභාව ධර්මයට හානි සිදු කළහොත් සදහටම මිනිසා පෘථිවියෙන් අතු ගා දැමීමට සොබාදහම කටයුතු කරනු නොඅනුමානයි. මේ ගෝලීය වසංගත තත්ත්වය නිසා වාහන ගමනාගමනය අඩුවීම හේතුවෙන් පරිසර දූෂණය අවම වී තිබෙනවා. වෙනදා කොටු වී සිටි කුරුල්ලන්, වන සතුන් ස්වභාව සෞන්දර්ය විඳිමින් නිදහසේ සැරිසරන අයුරු පෙනෙනවා. එමෙන්ම මේ වසංගතය නිසා පවුලේ සාමාජිකයන් සමග වැඩිවේලාවක් එක්ව ජීවත්වීමට, වගා කටයුතු කිරීමට, නිවෙස් වල තිබූ අඩුපාඩු සකස් කිරීමට, පින් දහම් කිරීමට, පොත් කියවීමට අවස්ථාව ලැබුණා. මේ අවස්ථාවේදී මිනිසුන්ට ජීවිතය ගැන නැවත සිතීමට හොඳ අවස්ථාවක් ලබා දී තියෙනවා. ලද දෙයින් ජීවත්වන ආකාරය ඉගෙන ගැනීමට සිදුවීම, දිනකට විශාල ආහාර ප්‍රමාණයක් ඉවතට දමන රටකට ආහාර අරපිරිමැස්ම පුරුදු වීම, මත්පැන් බිඳක් තොල නොගා දිනයක් ගෙවා ගන්නට බැරි වූ පුද්ගලයන්ට කහට කෝප්පයෙන් යැපීමට සිදුවීම මෙහිදි සිදු වූ යහපත් සිදුවීම්. මේ සරල දිවි පැවැත්ම ජීවිතාන්තය දක්වාම පවත්වාගෙන යාමට අවශ්‍යයි. මේ වසංගතතත්ත්වයෙන් බේරීමට ඇති ධර්මානුකූල පිළිවෙත වන්නේ පිරිත් සජ්ජායනයයි. එදා විශාලා මහනුවර තුන් බිය දුරුකිරීම සඳහා බුදුරජාණන් වහන්සේ රතන සූත්‍රය දේශනා කළා.

එබැවින් රතන සූත්‍රය, ඛන්ධ පිරිත, අංගුලිමාල පිරිත ආදී දේශනා උදේ සවස දේශනා කර සත්‍ය ක්‍රියා කිරීම වැදගත්.

සුසුඛං වත ජීවාම
ආතුරේසු අනාතුරා
ආතුරේසු මනුස්සේසු
විහරාම අනාතුරා

රෝගීන් අතර නිරෝගීව සිටීම සැපයක්. රෝග පීඩා තිබෙන මනුස්සයන් අතර අප නිරෝගීව සිටිය යුතුයි.

අයන්ති විතාන

# ඔලබොඩුවේ ධම්මික හිමියෝ ප්‍රධාන අධිකරණ සංඝ නායක පදවි ලබති



අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා හා හිටපු අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන මහතා විසින් විජිනිපත පිළි ගන්වමින්

මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මහනුවර මල්වතු මහා විහාර පාර්ශවයේ පූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍ර වරප්‍රමුඛ ගරුතර සානුනායක කාරක මහා සංඝ සභාව විසින් ඔලබොඩුව රාජමහා විහාරයේ භාරකාර, ඉතාලිය මිලානෝ නුවර ලංකාරාමාධිපති, වීදියගොඩ ශ්‍රී සාමග්‍රී සංඝ සභාවේ ගරු ප්‍රධාන ලේඛකාධිකාරී ඔලබොඩුවේ ධම්මික ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත "සද්ධර්මකීර්ති ශ්‍රී විනයාචාර්ය" යන ගෞරව නාම සම්මුතිය සහිතව බස්නාහිර පළාතේ කොළඹ කළුතර දෙදිසාවේ ධාන අධිකරණ සංඝනායක පදවිය පිරිනමා ඇත.

පසුගිය පෙබරවාරි මස 27 වන දින ඒ පිළිබඳ ශ්‍රී සන්නස් පත්‍ර ප්‍රදානෝත්සවය මහනුවර මල්වතු මහා විහාරීය රාජපූජිත මංගල උපෝසථාගාරයේදී මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ මහානායක අතිපූජ්‍ය තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

ශ්‍රී සන්නස් පත්‍රය ගරුතර අභිනව නාහිමිපාණන් වහන්සේට පිළිගැන්වීම රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව පසුගිය මැයි මස 06 වෙනි බදාදා පෙරවරුවේ ත්‍රෛනිකායික මහානායක, අනුනායක ස්වාමීන්ද්‍ර වරප්‍රමුඛ ගරුතර මහා සංඝ රත්නයේ වැඩමවීමෙන්, අග්‍රාමාත්‍ය, බුද්ධ ශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සුරතින් මෙවර රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව අරලියගහ මන්දිරයේදී සිදු කරන ලදී.

එම අවස්ථාවේදී උන් වහන්සේට විජිනිපතද පිළි ගන්වන ලදී. ඒ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ රෝහිත අබේගුණවර්ධන හිටපු ඇමැතිවරයා විසිනි. ඓතිහාසික ඔලබොඩුව රාජ මහා විහාර භාරකාර, ඉතාලිය මිලානෝ ලංකාරාමාධිපති, වීදියගොඩ සාම ශ්‍රී සංඝ සභාවේ ගරු ලේඛකාධිකාරී, තනතුරු දරමින් උන්වහන්සේ ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් මහත් වූ දායකත්වයක් සපයති. 2006 වසරේදී ඉතාලියේ මිලානෝ නුවර ලංකාරාමාධිපති ධුරයට පත් වෙමින් ද 2007 දී ඔලබොඩුව ජයවර්ධනාරාම විහාරයේ භාරකාරත්වයට පත් වෙමින් ද සිදු කළ සේවාවට අමතරව උන් වහන්සේ මිලානෝ ලංකාරාම ඉංග්‍රීසි දහම් පාසල ද ආරම්භ කරමින් අන්තර්ජාතික සේවාවන් ද සිදු කළහ.

එමෙන්ම ඔලබොඩුව ශ්‍රී සුමංගල ඉංග්‍රීසි – සිංහල දහම් පාසලේ ද ප්‍රධානාචාර්ය ධුරයට පත් වෙමින් විශාල කාර්යභාරයක් ඉටු කළහ. මිලානෝ බිලූම් ජාත්‍යන්තර පාසලේ ආගමික උපදේශක, ඉතාලි බෞද්ධ සංගමයේ උපදේශක, යුරෝපා බෞද්ධ සංගමයේ ථේරවාදී ආගමික උපදේශක – යුරෝපා බෞද්ධ සංගමයේ සම්බන්ධීකරණ ධුරය, සියම් නිකායේ වීදියගොඩ පාර්ශ්වයේ ශ්‍රී සාමග්‍රී සංඝ සභාවේ ලේඛකාධිකාරී ධුරය, තලගල විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ භාරකාර මණ්ඩලීය සභික ධුරය දරමින් මහත්ම වූ ශාසනික මෙහෙවරක නිරත වෙති.

ඔලබොඩුව රාජ මහා විහාරයේ අභිනව සුවිශාල ධර්ම මන්දිරය, දෙමහල් සංඝාවාසය සහිත ධාතු මන්දිරය, අටවිසි බුද්ධ මන්දිරය සහිත බෝධි ප්‍රාකාරය, ෂඩ් මහා දේවාල මන්දිරය, දහම් පාසල් ගොඩනැගිල්ල, උපොසථාගාරය නවීකරණය කිරීම ද ධම්මික හිමියන්ගේ තවත් සේවාවන් රැසකි.

## පඤ්චායුධ ජාතකය



මෙවර බුදුසරණ කවරයේ දක්වෙන්නේ පඤ්චායුධ ජාතක කතාවේ අවස්ථාවකි. එම කතා පුවත සැකෙවින් මෙසේ ය.

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි දී වීර්යයෙන් පසුබසිනා ලද භික්ෂුවක් අරබයා පෙර නුවණැත්තෝ සුදුසු තැන වීර්යය කළ ආකාරය දක්වමින් අතීත පුවත ගෙන දේශනා කළ සේක. බරණැස් නුවර බඹදත් රජුට දාව උපන් කුමරු පංචායුධ කුමරු නමින් ප්‍රසිද්ධ විය. පියරජතුමාගේ නියමයෙන් ගන්ධාර රට තක්සලා පුර දිසාපාමොක් ඇදුරුතුමන් වෙතින් සිප්සතර උගත්හ. ශිල්ප නිමවා බෝසතාණෝ ආපසු සිය රට යාම සඳහා පංචායුධ සන්නද්ධව වන මඟට පිවිසියේ ය. ඒ දුටු නුවර වැසියෝ දුටු දුටුවන් අල්ලාගෙන කන යකෙක් සිටින බැවින් නොයන්නයි වැළැක් වූහ.

ඒ වදන් ගණනකට නොගත් බෝසතාණෝ සිංහයකු මෙන් වනයට පිවිසිය හ. බිහිසුණු යක්ෂයා ඉදිරියට එනු දැක විෂ කැවූ හීයෙන් විද මරණයට පත් කරමි'යි කියා හීයක් විද්දහ. ඊතලය යක්ෂයාගේ රෝමවල ඇලී ගියේ ය. එසේ විදින ලද ඊතල පනහම ඇලී ගියේ ය. යක්ෂයා ඊතල සියල්ල ම බිම හෙළීය. ඒ අවස්ථාවේ දී පංචායුධ කුමරු කඩුවෙන් ගැසීය. කඩුව ද ඇලී ගියේ ය. එවිට කුමරා මගේ බලය බලවයි කියා දකුණතින් ගැසීය. එය ද එසේ ම ඇලුණේ ය. වමතින්, දකුණු පයින්, වම් පයින් පහර දුන්නේ ය. සියල්ල ඇලී ගියේ ය. හිසෙන් ද පහර දුන්නේ ය. පස් තැනින් ඇලී ගිය ද නිර්භීතව කතා කරන්නට විය. මට ගොදුරුව සිටිමින් කතා කරන්නේ කුමන හේතුවෙන්දැයි යක්ෂයා ඇසී ය.

එවිට බෝධිසත්වයෝ "තෝ මා කැවෙහි නම් මාගේ උදරයෙහි වජ්‍රායුධයක් ඇත. එය ළය පෙදෙසෙන් ඇනී පිට පැත්තෙන් නැගෙයි. ඒ කල් හී අප දෙදෙනා ම නැසෙන්නේ ය. ඒ නිසා බිය නොවෙමි'යි කීහ. ඒ වදනින් බියට පත් යක්ෂයා "ඔබ පුරුෂ සිංහයෙකි" ඔබගේ මස් නොකමි. පලා යව යැයි හැර දැමීය.

පෙර අකුසලයෙන් යක්ෂයෙක් ව ඉපිද නැවතත් අකුසල් කිරීමෙන් අඳුරෙන් අඳුරට යන්නේ යැයි ද, ප්‍රාණඝාතයෙන් මන්දයුෂ'කව මියගොස් සතර අපායේ උපත ලබන්නේ යැයි ද බෝසතාණෝ ආදීනව දක්වා යක්ෂයා දමනය කොට සුවසේ සිය රට පැමිණියහ. දැහැමින් රාජ්‍ය පාලනය කරමින් පින්දහම් පුරා ආයු කෙළවර පරලොව ගියහ.

වීර්යය හළ භික්ෂූන් වහන්සේ අරහත් වූහ. ඒ සමයෙහි යක්ෂයා නම් මෙකල අංගුලිමාල තෙරණුවෝය. පංචායුධ කුමාරයා නම් තමන් වහන්සේ ම යැයි ද භාග්‍යවතුන් වහන්සේ සිවුසස් දහම් දෙසූ සේක.

දීපා පෙරේරා



# ජීවිතයට වටිනාකමක් දෙන්න

**මනුෂ්‍යයෙක් ගැන කතා කරන්නේ නම් උපත හා සමගින් ලෙඩවීම, දිරාගෙන යෑම, මරණය, අප්‍රියයන් හා එකතුවීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමැති නම් ඒ දෑ නොලැබීම, රූප වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ, ස්කන්ධ පංචකය නම් වූ මේ ජීවිතය ම දුකකි.**

දුක කියන කතාව මතුවෙන්නේ මුලාව නම් වූ, චතුරාර්ය සත්‍ය ධර්මය කෙරෙහි ඇති අනවබෝධය නිසා ය. චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කර ගත්තා වූ රහත් උතුමෙකුට හෝ ඒ මඟට පිළිපන් ගිහි හෝ පැවිදි හෝ වේවා, ශ්‍රාවකයකුට දුක හඳුනාගෙන දුකෙන් නිදහස් වීමේ මඟට පත්විය හැකියි. මේ බව තේරුම් ගත්තා වූ ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා බුද්ධ ශ්‍රාවකයන් විසින් කළ යුතු වන්නේ කුමක් ද? භාග්‍යවතුන් වහන්සේ විසින් මහා සතිපට්ඨාන සූත්‍ර දේශනාවෙහි පැහැදිලි කළ අයුරින් ඒ ඒ අවස්ථාවන්හි ශරීරය හා ක්‍රියාවන් පවත්වන විට මනා වූ සිහිය හෙවත් සතියෙන් යුක්තව ජීවිතය පවත්වා ගත යුතු බවයි.

සතිය, සිහිය නම් කුමක් ද? පඨවි ආදී හේතූන් ප්‍රත්‍යය කරගෙන සකස්වන පණ ඇති හෝ පණ නැති හෝ වේවා හැම පුද්ගලයෙක් ම වස්තුවක් ම හේතූන් ම විසිරී යන විට නැතිවෙනවා. එසේ නම් මේ ලෙඩ දුක් හෙවත් ව්‍යාධීන්ට මුහුණ පෑම නම් ශරීර අභ්‍යන්තරය තුළ මේ පඨවි ආදී ධාතූන්ගේ විසිර යෑම සිද්ධවීමයි. කොරෝනා උවදුරෙහි ලක්ෂණ හැටියට පෙන්වා දෙන්නේ සෙම්ප්‍රතිශ්‍යාව, කැස්ස, උගුරේ වේදනාව, ආශ්වාසය ප්‍රාශ්වාසයේ අපහසුව හෙවත් ස්වසන පද්ධතියේ දුර්වලතාවයයි. මේවා බෞද්ධ දර්ශනයට අනුව ධාතූන්ගේ නොගැලපීම හෙවත් විසිර යෑමේ ප්‍රතිඵලයකුයි.


අප අනවබෝධයෙන් "මම", "මගේ" කියා තෘෂ්ණාවෙන් බැඳී ඇසට රූප, කනට ශබ්ද ආදී වශයෙන් ආරම්මනයන් "මම", "මගේ" කරගෙන ලෝභ, ද්වේෂ, මෝහ ආදී කෙලෙස් සිදු කරගන්නවා. භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ අයුරින් සියල්ලම හට ගත්තා සේ ම නැතිවෙනවා, නම් අවබෝධයෙන් යුතුව කායික, වාචසික සංවරය නම් වූ සීලයේ පිහිටා ජීවිතය පවත්වන්න. එයට හේතුව ඔබ "මම", "මගේ" කියන තම කය හා අපි සිතින් හා අතින් අල්ලා ගන්නා වූ හෙවත් උපාධානය කර ගන්නා වූ බාහිර වස්තූන් ද හට අරගෙන බිඳී නැතිව යනවා. මෙන්න මේ අවබෝධය අප හඳුන්වන්නේ පස් පව් දස අකුසල්වලින් බැහැරවී සීල සමාධි ප්‍රඥ ගුණ වඩන මඟට පත්වුණා වූ සත්පුරුෂ වූ පුද්ගලයෙක් හැටියටයි.

එවැනි පුද්ගලයාගේ මනස අභිජ්ජා දෝමනස්ස නම් වූ දැඩි ආශාවන්ගෙන් හා ගැටීම්වලින් නිදහස්ව පවතින විට ඒ සිත සංසුන් වූ මනසක් ඇති සිතක් හැටියට ධර්මයේ පෙන්වා දෙනවා. මෙය භාවනාව සමාධිය, ධ්‍යානය සංසිඳුනු බව ආදී වශයෙන් ධර්ම කතාව පෙන්වා දෙනවා. මනස තද ආශාවන්ගෙන් හා ගැටීම්වලින් බැහැර වූ තැන සංසිඳීමකට, සමාධියකට, නිවුණු බවකට පත් වන්නේ නම්, එය හදවත, මොළය, පේශීන්, ලේ ගමනා ගමනය ඔස්සේ මුළු ශරීර පද්ධතියම නීරෝගී කරන්නට, ශක්තිමත් කරන්නට හේතුවක් බවට පත්වෙනවා. මෙය වර්තමානයේ වෛද්‍ය විද්‍යාවේ නිතර කතා කරන ප්‍රතිශක්තිකරණයයි. තද ආශාවන්ගෙන් හා ගැටීම්වලින් සිත ව්‍යාකූල වන විට එය මොළයට බලපායි. ලේ ගමනා ගමනය ඔස්සේ මුළු ශරීරය ම දුර්වල කරයි. එහි ප්‍රතිඵල ඔබ අප සරල ලෙස දැක තිබෙන්නේ විවිධාකාර කායික රෝග වශයෙනුයි. වර්තමානයේ හඳුන්වන දියවැඩියාව, අධිරුධිර පීඩනය, කොලෙස්ටරෝල් හෙවත් මේද බහුලතාවය, ආශ්වාස ප්‍රාශ්වාස පද්ධතියේ දුර්වලකම් මේ සියල්ලටමත් හේතූන් හැටියට සිතෙහි ව්‍යාකූල බව එය මොළය ඔස්සේ ශරීරය පුරා ක්‍රියාත්මක වීම හඳුන්වා දිය හැකියි.

එසේ ම සංසුන් වූ මනසක් ඇති කරගන්නා වූ පුද්ගලයකුගේ මොළයේ ක්‍රියාකාරීත්වය ලේ ගමනා ගමනය ඔස්සේ ශරීරය පුරාම පිරිසුදුවත්, නිවැරැදිවත් ව පැවැතීම නිසා ප්‍රතිශක්තිකරණය හෙවත් රෝගයන්ට මුහුණ දී අනවශ්‍ය වෛරසයන් දමනය කර ගැනීමේ හැකියාවක් පවතින බව ඉතාම පැහැදිලි වේ. යම් කෙනෙක් ප්‍රබල ලෙස බාහිර වෛරසයන්ට මුහුණ දෙන්නට හුරු වූ විට, කය තරමක් හෝ නීරෝගී ව පවත්වා ගත හැකි බව සාමාන්‍ය පිළිගැනීමයි.

නමුත් වෙන යම් අතුරු ආබාධයන්ට ද මුහුණ දිය හැකියි. එළියේ සිඟමන් යදිමින් හැසිරෙන අයෙකු විශේෂ වෛද්‍ය පහසුකම් නැති වුවත් කෙසේ හෝ ජීවත්වන බව සඳහන් කළ හැකියි. නමුත් ඔවුන් තුළ පවත්නා විවිධාකාර රෝගාබාධයන්ගෙන් පිරිපුන් වී ඇති බව පැහැදලියි. නමුත් මනස පිරිසුදු කර ගත් පුද්ගලයකුට බාහිර ශරීරයේය ප්‍රසන්නතාවය පටන් නීරෝගීතාව, දීර්ඝායුෂ සම්පත්තියත් ලබා දිය හැකි බව පැහැදිලියි.

මහා කාරුණික තථාගත බුදුරජාණන් වහන්සේ මේ ජීවිතයේ යථා ස්වභාවය පෙන්වා මතු කොට දැක්වූයේ සතිය නම් වූ සිහිය පවත්වා ගන්නටයි.



බත්තරමුල්ල
සිරි සුදස්සනාරාම
සදහම් සෙනසුනෙහි
ප්‍රධාන අනුශාසක ආචාර්ය
**මිරිස්සේ ධම්මික නා හිමි**

එනම්, මේ ලෝකයේ විනාශ නොවන කිසිවක් හට නොගන්නේ ය. මේ රෝග උවදුරට පත් වූ අපේ ශරීර ද හට අරගෙන බිඳී යන්නේ ය. මේ බව දැනගෙන සිත පිරිසුදු කරගෙන සංසුන් වූ මනසක් ඇති කර ගැනීම අවශ්‍යයයි. උපත හා සමඟින් ම රෝගයන්ටත් උරුමකම් කියනවා නම්, සිහිය පවත්වා ගැනීමෙන් බලවත් ලෙස රෝගයන්ට මුහුණ නොදෙන ස්වභාවයන්ටත් රෝගයන්ට පත් වුණත් ඒවායින් නිදහස්වීමටත් සිත කලබල නොකරගෙන ක්‍රියාවට පත්විය හැකියි. භාග්‍යවතුන් වහන්සේ ගිරිමානන්ද සූත්‍රයේ දී දේශනා කළේ පිත, සෙම, වාතය නම් තුන් දෙස් ම කිපීමෙනුත්, ඍතු භේදයන් නිසාත්, තමාගේ වැරැදි හැසිරීම නිසාත්, කර්ම විපාක නිසාත් ලෙඩ දුක් ඇති විය හැකි බවයි.

අප විසින් කළ යුතු වන්නේ මේ බව දැනගෙන සීල, සමාධි, ප්‍රඥ ගුණ වඩන නිවැරැදි ජීවිතයක් පවත්වා ගැනීමයි. ලෙඩ දුක්වලට කොහොමත් උරුම නම්, සංසුන් වූ මනසකට තරමකින් හෝ බාහිර විපත්වලින් ඇතිවන ලෙඩදුක් වළක්වා ගැනීමට පුළුවනි. උදහරණයක් ලෙස වර්තමානයේ වෛරස් උවදුර පවතින විට වෛද්‍ය විද්‍යාව හෝ සෞඛ්‍ය අංශ පෙන්වා දෙන අයුරින් සමාජයේ දුරස්ථව සිටීම ඒ වගේ ම තමා සතියෙන් යුක්තව අන් අයට රෝග පැතිරවීමට ඉඩ නොදීම තමාත් අන් අයගෙන් රෝගයට හසුවීම, ගැලවීම, වෛද්‍ය පහසුකම් ලබාගැනීම ආදිය වෙනුවෙන් යොමුවීමයි. එයට හේතුව අනන්ත සංසාර ගමනේ අප්‍රමාණ දුක් විඳ දුර්ලබව ලබාගත් මනුෂ්‍ය ජීවිතය රැක ගත යුතු නිසායි. එය උතුම් නිසායි.

දුර්ලබව ලැබූ මේ මනුෂ්‍ය ජීවිතය ධර්මාවබෝධය පිණිස ප්‍රයෝජනයක් ගත යුතුයි. නැවත සතර අපායකට නොයන මාර්ගය සාද ගත යුතුයි. මේ ජීවිතය ම දුකින් නිදහස් වීම නම් වූ සත්‍යාවබෝධය ලබාගත නොහැක්කේ නම්, අඩුම තරමෙ සම්‍යග් දෘෂ්ඨිකව සුගතියවත් උරුම කර ගත යුතුයි. ඒ වගේ ම ලෞකික ලෝකය තුළ තමා හා වෙසෙන ප්‍රියයන්ට යුතුකම් කළ යුතු සේ ම හැකි නම් ලෝකයක් කෙරෙහිත් තමාට හැකි අයුරින් යුතුකම් කරමින් උපකාර කරමින් පරාර්ථ චර්යාව ද කළ යුතුයි.

සසර පැවැත්ම හා ජීවිතයේ යථා ස්වභාවය නුවණින් දැක ලෙඩ දුක් සැදෙන්න මත්තෙන් සිහියෙන් යුක්තව කටයුතු කළ යුතුයි. ව්‍යාධීන්ට මුහුණ දුන් විට ජීවිතයේ යථා ස්වභාවය නුවණින් දැක එයට ප්‍රතිකාර කරමින් සංසුන් වූ මනසක් ඇති කර ගැනීම හැබෑවට ම තමාට මනසින් වගේ ම කයින් ද නීරෝගී වීමේ හැකියාවක් පවතිනවා.

මහා කාරුණික ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දීර්ඝ සසරින් දුකින් නිදහස් වන්නට පෙන්වා දුන් ධර්ම කතාව වර්තමානයේ කොරෝනා උවදුරින් වැළකෙන්නත්, එය ලෝකයෙන් බැහැර කරන්නත්. අන් අයට රෝගය පැතිර නොයෙන්නට උදව් උපකාර කරන්නටත්. මේ ධර්මය අපට ගළපා ගත හැකියි..තමාට තමාගේ ජීවිතය වටිනා සේ ම හැම ජීවිතයකට ම වටිනාකමක් තිබෙනවා. එය ජාතියක්, ආගමක්, රටක්, සංස්කෘතියක් වශයෙන් නොබිඳුණු මහා කාරුණිකයාණන් වහන්සේගේ මහා කාරුණික දර්ශනයයි. වර්තමානයේ මේ රෝග උවදුර ඉදිරියේ මෙම ව්‍යසනයෙන් වැළකීම පිණිස අප විසින් කටයුතු කළ යුතු වන්නේ එසේ නොවේ දැයි ඔබ ම සිතා බලන්න.

දීපා පෙරේරා

# බුදු සිරිතයි පරිසරයයි



**දෙව්දහ නුවර ලුම්බිණී නම් වූ සල් උයනේ, ඉතාමත් රමණීය පරිසරයක දී මහා මායා මව්තුමියගේ කුසින් සිදුහත් බෝසතාණන් වහන්සේගේ උප්පත්තිය සිදුවීම, මතු බුදු පදවියට පත්වෙන උතුමාණන් මොන තරම් නම් පරිසරයේ ම කොටසක් ද යන්න පැහැදිලි ය.**

ඉන් අනතුරුව සිද්ධාර්ථ චරිතය දෙස බැලීමේ දී, සිදුහත් කුමරුට මාස තුනක් ගතවන නිමේෂයේ සුදෙවුන් පිය මහ රජතුමාණෝ ඉතාම ඉහළින් පවත්වන්නට යෙදුණු රාජ්‍ය උත්සවය සුවිශේෂී ය.

සිදුහත් පුතු නින්දේ පසු වන්නේ යැයි සිතූ කිරි මව්වරු වප් මඟුල දෙස මොහොතකට නෙත් යොමු කළහ. ඒ ඇසිල්ලේම වෘක්ෂය මුදුණේ පළක් බැඳගෙන බවුන් වඩන පුංචි දරුවා දුටුවහ. බෝසතාණන් වහන්සේ ඉතා කුඩා වයසේ වුව ද, පරිසරයත් සමඟ පෙර බවවලදී තිබුණු ශක්තිය මතු කරගනිමින් ආනාපානසතිය වැනි භාවනාවක් වැඩීමට තරම් ශක්තිමත් වූහ.

සිද්ධාර්ථ කුමාරයාණන් අධ්‍යාපනය ලබන සමයේ, සර්ව මිත්‍ර බමුණාතන් මේ දරුවා හදන්නේ පරිසරයත් සමඟ ය. එතුමාණෝ, කුමරුට පරිසරයේ ඉගෙනුම් න්‍යායන් ලබා දුන්හ. මෙහිදී සිදුහත් චරිතයේ අපූර්ව කතාවක් සිහිපත් වේ. දෙව්දත් කුමරු දුනු ඊතල මානා විද බිම දැමූ හංසයා සුවපත් කර ගැනීමට සිදුහත් කුමරු සමත් විය. දෙව්දත් කුමරු හංසයාගේ අයිතිය ඉල්ලා කලබල කරන මොහොතේ කුමරු පැවසුවේ 'මේ සතා මියගියා නම් අයිතිය ඔබටයි. ඒත් දැන් මේ සතා ජීවත් වෙනවා. ජීවත් කළේ මමයි. එනිසා මේ සතා අයිති මටයි.' යනුවෙන් ය. මෙසේ සොබා දහමේ තිබෙන ගහකොළ සමඟ සතා සිවුපාවා සමඟ සිදුහත් කුමරු අපූර්ව බැඳීමක් ඇති කර ගත්තේ ය.

එමෙන් ම එකල අධ්‍යාපන ක්‍රමවේදයේ තිබුණු උපනිෂද් සහ වේදංගවලින් ජල ගෝලය, වායුගෝලය මෙන්ම පෘථිවිය තුළ තිබෙන්නා වූ සියලු අංශ පිළිබඳව මනා අවබෝධයක් ලැබුණි. එමඟින් පරිසරය සමඟ, ජීවත් වීමට මහා පිටුබලයක් ලැබුණි. විශේෂයෙන් උපනිෂද්තුළ මේ ස්වභාවය ධර්මයේ තිබෙන්නා වූ කරුණු පිළිබඳ ව ඉගැන්වීම සිදු කෙරේ. ඍග්, යුජර්, සාමන්, අතර්වන් වැනි වේදයන් ද ස්වභාව ධර්මය මුල් කරගත් ඉගැන්වීම් ය.

සුද්ධෝධන මහ රජතුමා හැම මොහොතකම උත්සාහ කළේ සිදුහත් කුමරු මාලිග තුනකට සීමා කර කාමභෝගී ජීවිතයකට යොමු කරවීමට ය. එහෙත් සිදුහත් කුමරු සෑම මොහොතකම උත්සාහ කළේ පරිසරයත් සමඟ ජීවත් වීමට ය. මහල්ලෙක්, ලෙඩෙක්, මල මිණියක්, පැවිදි රුවක් යන සතර පෙර නිමිති පිළිබඳ ව ජන්නගෙන් අසා අවබෝධයක් ලබා ගත්තේ ඒ අනුව ය. පරිසරයේ වෙනස්වීම් පිළිබඳ, මිනිසුන්ගේ වෙනස්වීම් පිළිබඳ එතුමාණෝ අධ්‍යයනය කළහ. තමන්ගේ රජ මාලිගයෙන් එපිට ඉඳුල් ආහාර ටික අහුලාගෙන ආහාරයට ගන්නා මිනිසුන් දෙස එතුමාණෝ ඉතා හොඳින් බලා සිටියහ. 'ඇයි මෙසේ වෙනසක්' එතුමා කල්පනා කළේ ය. පිරිසකට ඉතා රසමසවුළු ආහාරයට තිබේ. පිරිසක් ඉඳුල් අහරින් කුස පුරවා ගතිති.

එතුමා මේ ගැන අධ්‍යයනය කළේ ය. කුමරු අභිනිෂ්ක්‍රමණයට යොමු වන්නේ මේ පරිසර සාධකත් සමඟිනි.

එදා ගිහි ගෙයින් නික්මුණු බෝසතාණෝ දූෂ 'කර ගිරි නම් වූ පර්වතය වෙත ගමන් කොට පරිසරයේ තිබෙන විවිධ සාධක අධ්‍යයනය කළහ. හොල්මන් තිබෙනවා යැයි කී තැන්වලට උන්වහන්සේ ගමන් කළහ. ඒ හොල්මන් නොවන බවත්, ගසක සෙළවීමක්, සිව්පාවෙකුගේ ක්‍රියාවලියක් බව එතුමාණෝ දුටුවහ. ගංගාවේ ගීතය, පිරිත් ස්වරයක් බඳු ගහ කොළ සෙළවෙන ශබ්දය, පරිසරයේ නාද පිළිබඳව උන් වහන්සේ අසා සිටියහ. අධ්‍යයනය කළහ. වැඩ සිටි ගහ මුල සමීපයට වැටෙන ආහාරයෙන් පමණක් යැපෙමින් ආශ්වාසය, ප්‍රශ්වාසය පිළිබඳව විශාල පර්යේෂණයක් කළහ. පවත්තඵලභෝජී චර්යාව ලෙස අපි එය හඳුන්වමු.

ඒ ලෙස උන්වහන්සේ විශාල කැප කිරීම් කළහ. ඇතැම් අවස්ථාවල වස වර්ති මාරයා සුදෙවුන් රජතුමා ඉදිරියේ පෙනී සිටිමින් පැවසුවේ සිදුහත් රජු මරණයට පත් වූ බවත්, හුමදන කටයුතු කරන ලෙසත් ය. රජතුමා කිසිදු සැකයකින් තොරව පැවසුවේ 'මගේ පුතා බුදු වී මිස කිසි දිනෙක වීර්ය අත් නොහරින්නේ ය. ඔබ බිය නොවන්න' යනුවෙනි.

පරිසරයත් සමඟ ම ජීවත් වුණු බෝසතාණන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාව පිළිබඳව පරිසරයෙන් ම ඉගෙනුම ලැබූහ. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප යන මාර්ගාංග දෙක උන්වහන්සේ සොයාගත්හ. ඒ වන විට ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග හයක් තිබුණි. සීල කොටස හා සමාධි කොටස ය. සීලයට අයිති සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන අංග ත්‍රිත්වය ම තිබුණි. 'පස්වග මහණුන් තරම් සිල්වත් වෙන කිසිවෙක් නොවේ.' යැයි බුදුරජාණන් වහන්සේ ම දේශනා කළහ. ඒ වගේ ම අසිත, කාලදේවල, ආලාර කාලාම, උද්ධකරාමපුත්‍ර වැනි අය සප්ත සමාපත්ති, අෂ්ට සමාපත්ති උපදවාගෙන සිටියහ.



මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ
ශ්‍රී රෝහණ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක හා
විධායක කාරක සභික ශාස්ත්‍රපති
**දෙඩම්පහළ ශ්‍රී රාහුල හිමි**

ඒ නිසා සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන අංග තුනම තිබුණි. උන් වහන්සේ සොයා ගත්තේ ප්‍රඥ කොටස ය. ඒ සඳහා උන්වහන්සේට පිහිට වූයේ පරිසරයයි. පරිසරයෙන් කරන ලද අධ්‍යයනයෙනුයි උන්වහන්සේ විසින් විශ්ව ශක්තියට යොමු වී සම්මා දිට්ඨි, සම්මා සංකප්ප තුළින් චතුරාර්ය සත්‍ය අවබෝධ කරගනු ලැබුවේ.

ඊළඟට සිදුහත් බෝසතාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වන්නේ ද බෝධීන් වහන්සේගේ සෙවණේ ය. පරිසරයත් සමඟ තිබුණු බැඳීම මොන තරම් ද යන්නට මෙය ඉතාම වටිනා කරුණකි. මහරහත් පදවියට පත්වීමට, පච්චේක බුද්ධත්වයට වෘක්ෂයක් අවශ්‍ය වන්නේ නැත. එහෙත් කිසිදු බෝධි සත්ත්වයන් වහන්සේ නමකට වෘක්ෂයක් නොමැතිව ලොව්තුරා බුදු පදවිය ලද නොහැකි ය.

බෝසතාණන් වහන්සේ සම්බුදු පදවිය ලැබ පන්සාළිස් වසක් මුළුල්ලේ සැවැත් නුවර මුල් කොට ගනිමින් වැඩ වාසය කළහ. ඒ සෑම මොහොතක ම උන්වහන්සේ විවේක ගත්තේ වන ලැහැබ් අසබඩ ය. පක්ෂීන් හා සිව්පා සතුන් සමඟ ය. විශේෂයෙන් මිනිසුන් අතර ගැටුම් ඇති වූ මොහොතක, තමන්ගේ භික්ෂු පූජාව තුළ ගැටුම් ඇති වූ මොහොතක උන්වහන්සේ වනයට යොමු වූහ. ඝෝෂිතාරාමයේ, විනයධර හා ධර්මධර භික්ෂූන් වහන්සේ අතර ඇති වූ මත භේදකාරී අවස්ථාවේ උන්වහන්සේ පාරිලෙය්‍ය වනයට වැඩම කොට පාරිලෙය්‍ය වඳුරාගෙන් සත්කාර ලබමින් පරිසරයත් සමඟ ජීවත් වූ හ.

එ පමණක් නොවේ උන්වහන්සේ ධර්ම දේශනාවන් හි දී ගත් නිදර්ශන හැම විටෙක දීම පරිසර සාධක ලෙස පෙන්වා දීමට පුළුවන. සිද්ධිවාචක ආනුරෝප්‍යතාවය යැයි අපි ඊට කියමු. එයින් අදහස් කරන්නේ තිබෙන දෙයක්ම, පවතින දෙයක්ම නිදසුන් කොට ගත් බව ය. අහසේ තිබෙන මල්, හාවුන්ගේ අං, ඉබ්බන්ගේ පිහාටු වැනි නිදසුන් කිසිවක් උන්වහන්සේ පාවිච්චි කළේ නැත. උදහරණ ලෙස මිනිසෙකුගේ විඤ්ඤාණය නිරුද්ධ වී ගිය පසු, ආයු, උෂ්මාව ශක්තීන් දෙක නැති වී ගිය පසු මේ ශරීරය දර කඳක් සේ යැයි බොහෝ දෙනා විස්තර කරති. එහෙත් බුදුරජාණන් වහන්සේ විස්තර කරන්නේ 'කලිංගරං' යනුවෙනි. මිනියක් ආදාහනය කොට ඉතිරිවන අඟුරු කොටයක් හා සමානයි යනුවෙනි. ආදාහනයකට දර කොටයක් ගත් කල, එහි පිළිස්සී ඉතිරිවන කොටසක් තිබේ. එය කිසිවෙක් ලිපෙහි දැමීමට ගෙන යන්නේ නැත. ඒ අනුව මිය ගිය පසු මේ ශරීරය කිසිදු ප්‍රයෝජනයකට ගත නොහැකි තත්ත්වයකට පත්වන බවට නිදසුන් දැක්වූයේ එලෙසිනි. මේ ලෙස බුදුරජාණන් වහන්සේ සොබා දහමෙන් ගත් නිදසුනකට වඩා මේ දෙය නිදසුන් කොට ගත්තා නම් සුදුසුයි කියන්නට කිසිවෙකුටත් නොහැකි ය. එවැන්නෙක් අද වනතුරුත් පහළ වී නොමැත.

උන්වහන්සේ මුළු සංඝ සමාජය ම මහා සාගරයට සමාන කළහ. මේ පරිසරයේ පවතින දිය බුබුළ, මිරිඟුව වැනි දේ ජීවිතයට සමාන කර දැක්වූහ.

අද ලෝකය විද්‍යාත්මක දැනුමෙන් ඉතාම ඉහළට ගොස් ඇත. දියුණුවක් ලබා ඇත. එහෙත් කිසිවෙකුටත්, ජීවිතය නම් තණ අග රැඳි පිනි බිඳුවක් වැනි නොවේ යැයි කිව නොහැකි ය. එය වර්තමානයේ කොරෝනා වයිරසය ඉදිරියේ ලෝකයටම ප්‍රත්‍යක්ෂ වී තිබේ. එපමණක් නොවේ. උන්වහන්සේ තම ශ්‍රාවකයින් වහන්සේ භාවනාවට යොමු කරන සෑම විටෙකම වන ලැහැබ භාවනා මධ්‍යස්ථානයට උචිත තැන බවට පත් කළහ.. ගිරි ගුහා, ලෙන්, ගස් බෙන, සුසාන භූමි වැනි තැන් නිර්දේශ කළහ. සුනාපරන්ත දේශයට යන පුණ්ණ හාමුදුරුවන් අමතා බුදුරජාණන් වහන්සේ දේශනා කළේ එය දරුණු මිනිසුන් සිටින භයානක තැනක් වන බව ය. එහෙත් පුණ්ණ හාමුදුරුවෝ එහි යෑමට අවසර ඉල්ලූහ. ඒ මනුෂ්‍ය ප්‍රජාව ද මේ සොබා දහමේ ම කොටසකි. ඒ අය ජය ගන්නා සැටි බුදුරජාණන් වහන්සේ ඉගැන්වූහ. ආලවක දමනය, නාලාගිරි දමනය, අංගුලිමාල දමනය, චිංචිමානවිකාව වැනි අයගේ සිදුවීම්වලට මුහුණදුන් ආකාරය, කරරෝම – රුචිරෝම දමනය, ශ්‍රී ලංකාවට වැඩම කොට මහියංගනයේ හා නාගදීපයේ ඇති වූ තත්ත්වයන් සමනය කළ ආකාරය අපට විශාල පාඩමක් උගන්වයි. ඒ සොබා දහමත් සමඟ ජීවත් විය යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳවයි.


උන්වහන්සේ නදී ග්‍රාම, භෝජ ග්‍රාම ආදී ගම්මාන පසු කරගෙන පැමිණ ඒ තැන් පිළිබඳව ඉතා රමණීය වර්ණනාවන් කළහ. අවසානයේ දී මල්ලව රජ දරුවන්ගේ උපවත්ත සල් උයනේ මහා පරිනිර්වාණයට පත් වූහ. උන්වහන්සේ තම ශ්‍රාවක ජනතාව සොබා දහමේ කොටසක් බවට පත් කළහ.

මිනිසුන්ට සොබා දහමට ආදරය කරන්නට ඉගැන්වූහ. පරිසරයට විරුද්ධ වන සෑම මොහොතකම සොබා දහම ද මිනිසාට විරුද්ධ වන බව පැහැදිලි කළහ. භයානක ප්‍රතිඵල ලැබෙන බව දේශනා කළහ. රතන සූත්‍රය, බොජ්ඣංග සූත්‍රය ආදී සූත්‍ර දේශනාවන් හඳුන්වා දෙමින් පැමිණෙන රෝගාබාධයන්ට ස්වභාව ධර්මයෙන් ම විසඳුම් ලබා ගන්නා ආකාරය, ආදරය, මෛත්‍රිය, කරුණාව තුළින් විසඳුම් ලබා ගන්නා ආකාරය කියා දුන්හ. අවසානයේ සොබා ධර්මයෙන් ම මිදුණ තැන නිර්වාණය තිබෙන බව දේශනා කොට වදාළහ.

රමණී සුබසිංහ

# සම්මා සම්බුද්ධත්වයට පෙර නිමිති පෙන් වූ

# පංචමහා සිහින



**අපගේ භාග්‍යවතුන් වහන්සේ සම්බුද්ධත්වයට පත්වෙන තෙක් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී ධර්මයන් සම්පූර්ණ කරලයි මනුලොව උපත ලැබුවේ.**


බෝසතාණන් වහන්සේ ගිගිගෙයින් නික්ම ගොස් දුෂ්කරක්‍රියා සිදු කර එය නිවන් මග නො වන බව තේරුම් ගෙන ආර්ය අෂ්ඨාංගික මාර්ගය සොයාගෙන ඒ ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ පිළිවෙත් පුරා සම්බුද්ධත්වයට ආසන්න වී තිබෙන වෙසක් පුන් පෝ දිනට කලින් රාත්‍රියේ විශේෂ සිහින පහක් දුටුවා.

අංගුත්තර නිකායේ මහාසුපින කියන සූත්‍ර දේශනාවේ ඒ සිහින පහ සහ ඒ සිහින පහේ අර්ථ සඳහන් වෙනවා. අප මහා බෝසතාණන් වහන්සේ වෙසක් දිනට කලින් දින රාත්‍රියේ ඒ සිහින පහ දුටුවාට පස්සේ උන්වහන්සේට තේරුම් ගියා අනිවාර්යයෙන් ම මම හෙට උදාවෙන වෙසක් පුන් පොහෝ දිනයේ සම්බුද්ධත්වයට පත්වෙනවා. එයට පෙර නිමිත්තක් ලෙසයි මම මේ සිහින පහ දුටුවේ කියලා. මහා අර්ථයක් ඇති ශ්‍රේෂ්ඨ සිහින කියන අර්ථයෙන් .තමයි මහා සුපින කියා ඒ සූත්‍රදේශනාවට කියන්නේ.

බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වය ලබා සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ සිටිද්දී භික්ෂු සංඝයා උදෙසා ඒ සිහින එකින් එක පැහැදිලි කරමින් ඒ සිහිනවල අර්ථ භික්ෂු සංඝයාට මනාකොට පැහැදිලි කළා. භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවක සඟරුවනට තෝරා දුන් ආකාරය තමයි මෙම සූත්‍ර දේශනාවේ සඳහන් වෙන්නේ. ඒ දේශනාව මෙසේයි.

මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයට පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ මේ මහා පෘථිවිය මහා සා යනාසනයක් විය. හිමාල පර්වත රාජයා කොට්ටය විය. වම් අත පූර්ව දිශාවෙහි සයුර ඉක්මවා පිහිටියේ ය. දකුණු අත බටහිර දිශායෙහි සයුර ඉක්මවා පිහිටියේ ය. මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූයේ ම මේ පළමුවෙනි මහා සිහිනය පහළ වූයේ ය.

තවද මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ තිරිය නම් තෘණ වර්ගයක් සිය නාභියෙන් මතු ව උඩට නැගී ගොස් අහස් තලයෙහි වැද සුවිසල් ව පැතිර ගියේ ය. මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ ම මේ දෙවෙනි මහා සිහිනය පහළ වූයේ ය.



පොල්ගහවෙල මහමෙව්නා භාවනා අසපු සංචිතයේ නිර්මාතෘ සහ අනුශාසක

**කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි**

මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ට සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ කළු හිස් ඇති සුදු පැහැ ඇති පණුවෝ පාදයන් දෙපසින් නැගී දණහිස තෙක් පිරී වසා සිටියා හු ය. මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූයේ ම මේ තුන් වෙනි මහා සිහිනය පහළ වූයේය.

තවද මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට සම්බුද්ධත්වයෙන් පෙරම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ නා නා පැහැයෙන් යුතු පක්ෂීහු හතර දෙනෙක් සිව් දිශාවෙන් පියඹා අවුත් පාමුල වැතිර සියල්ලෝ ම සුදු පැහැයට පත් වූවාහු ය. මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ ම මේ සිව්වෙනි මහා සිහිනය යි.

තවද මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ මහත් වූ අසූචි පර්වතයක් මුදුනෙහි අසූචි නො තැවරෙමින් සක්මන් කරමින් සිටිය හ. මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ ම මේ පස්වෙනි මහා සිහිනය පහළ වූයේ ය.

මහණෙනි, යම් හෙයකින් තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට සම්බුද්ධත්වයෙන් පෙරම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූයේ මහා පෘථිවිය මහා සයනාසනයක් වූයේ ද, හිමාල පර්වත රාජයා කොට්ටය වූයේ ය. වම් අත පූර්ව දිශායෙහි සයුර ඉක්මවා පිහිටියේ ද, දකුණු අත බටහිර දිශාවෙහි සයුර ඉක්මවා පිහිටියේ ද, පා යුග දකුණ සයුර ඉක්මවා පිහිටියේය ද, මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කරන ලද්දේ ද, ඒ අභිසම්බෝධියට නිමිත්ත වශයෙන් මේ පළමු වැනි මහා ස්වප්නය පහළ වූයේ ය.

මහණෙනි, යම් හෙයකින් තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධි සත්ත්ව වූයේ කළු හිස් ඇති සුදු පැහැ ඇති පණුවෝ පාදයන් දෙපසින් නැගී දණහිස් තෙක් පිරී වසා සිටියාහු ද, මහණෙනි, බොහෝ සුදුවත් හඳින ගිහි ශ්‍රාවකයෝ තථාගත දිවි හිමියෙන් සරණ ගත වූවාහු වෙත් ද, ඒ අභිසම්බෝධියට නිමිත්ත වශයෙන් මේ තුන්වෙනි මහා ස්වප්නය පහළ වූයේ ය.

මහණෙනි, යම් හෙයකින් තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ නා නා පැහැයෙන් යුතු පක්ෂීහු සතර දෙනෙක් සිව් දිශාවෙන් පියඹා අවුත් පාමුල වැතිර සියල්ලෝ ම සුදු පැහැයට පත් වූවාහු ද, මහණෙනි, මේ වර්ණයෝ සතරකි. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, හා ශුද්‍ර වර්ණයන් ය. ඔවුහු ගිහි ගෙයින් නික්ම තථාගතයන් වහන්සේ වදාළ ධර්ම විනයෙහි පැවිදිව අනුත්තර වූ අරහත්ඵල විමුක්තිය සාක්ෂාත් කරත් ද, ඒ අභිසම්බෝධියට නිමිත්ත වශයෙන් මේ සිව් වැනි මහා ස්වප්නය පහළ වූයේ ය.

මහණෙනි, යම් හෙයකින් තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ මහත් වූ අසූචි පර්වතයක් මුදුනේ අසූචි නො තැවරෙමින් සක්මන් කරමින් සිටියේ ද, මහණෙනි, තථාගතයන් වහන්සේ සිවුරු, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් පිරිකර ආදිය ලබන්නා හු වෙති. එහිලා තථාගතයන් වහන්සේ ඒ සිවුපසයට නො ඇලී, මුසපත් නො වී, නො බැසගෙන, ආදීනව දකිමින් , ඇල්ම දුරු කරන ප්‍රඥාවෙන් යුතුව නො ඇලෙමින් පරිහරණය කරත් ද, ඒ අභිසම්බෝධියට නිමිත්ත වශයෙන් මේ පස්වැනි මහා ස්වප්නය පහළ වූයේ ය.

මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුද්ධත්වයට සම්බුද්ධත්වයෙන් පෙර ම අනභිසම්බුද්ධ වූ බෝධිසත්ව වූයේ මේ පංච මහා සිහිනයෝ පහළ වූහ.

මේ සිහින පහේ දී බෝසතාණන් වහන්සේ දුටු පරිදි ම ඒ අර්ථ තේරුම් ගත් ආකාරයට උන්වහන්සේ සියලු කෙලෙස් ප්‍රහාණය කර මාර පාරාජය සිදු කර, නිකෙලෙස් හද මඬලක් දරාගෙන උතුම් සම්මා සම්බුද්ධත්වයට ගුරු උපදේශ නො මැතිව ශාක්ෂාත් කළහ. ඒ චතුරාර්ය සත්‍ය ධර්මය පරිපූර්ණ වශයෙන් අවබෝධ කරගත් භාග්‍යවතුන් වහන්සේ ඒ සිහිනවල අර්ථ තේරුම් ගත් ආකාරයෙන් ම ආර්ය අෂ්ඨාංගික මාර්ගය දෙව් මිනිසුන්තුළ පතළ කර හැරිහ. මේ සිහිනවල අර්ථ මනා කොට භාග්‍යවතුන් වහන්සේ ගේ ශාසනය තුළින් පිළිඹිබු විය.

නයනා නිල්මිණී



# වසනවලින් ගොඩ එන්න දින චරියාව වෙනස් කරන්න

**පසුගිය කාලයේ ලෝකයේ දිවි ගෙවූ බහුතරයක් ලෝක ධර්මතා වටහා ගත් බවක්, අවබෝධයෙන් කටයුතු කළ බවක් පෙනුණේ නැහැ. බුදු දහමේ කරුණු මහ ඉහළින් අදහන අප පවා ඒ ගැන අවබෝධයෙන් කටයුතු කෙළේ නැහැ.**

අප කළ ඒ වරදේ ස්වභාවය තරම තමයි අද මේ අපි විඳවන්නේ. මඳක් සිතා බලන්න. අප ආහාර පිණිස පවා ගත්තේ මොනවාද කියා, බහුතරයක් පිරිස් ශරීරයට අහිතකර ලෙසයි ආහාර ගැනීම් සිදු කෙළේ. පුළුවන්තරම් වස විස ආහාරයට ගත්තා. ටිකක් හිතල බලන්න. කී දෙනෙක් පසුගිය අවුරුදු කීපය ඇතුළත පස්පංගුව බොන්න ඇත්ද? දැන් මොකද මේ වෙනිවැල්ගැට, කොත්තමල්ලි, පෙරුම්කායම්, හොය හොය දුවන්නෙ. පිටරටවලට පවා යවනවා දුම් අල්ලන්න හට්ටි පිටින්. ඒ කියන්නෙ අපි ඇත්ත නැත්ත හඳුනනවා කියන එකනේ. අපි දන්නවා නියම පිළියම මොකක්ද කියන එක.

භික්ෂූන් වහන්සේ කෙතරම් දැනුවත් කළත් ධර්ම දේශනා කළත් මේ තරම් බණ අහන ශ්‍රී ලංකාවේ, ලෙඩවීම, මරණයට පත් වීම යන ධර්මතා ගැන අප අවධානය යොමු කෙළේ නැහැ. තම තමන්ගේ වැඩ කටයුතු, තමන් නිවැරැදි යැයි සිතන ලෙසින් කරගෙන ගියා.

ඒ ගමනේ තිබුණ වැරැද්දේ ප්‍රතිඵල තමයි අද මේ අපි විඳින්නේ. ධර්මානුකූලව සුළුවෙන් හෝ මේ ගැන අවධානය යොමු කරා නම් ප්‍රශ්නය මේ තරම් බරපතළ වෙන්නෙ නැහැ. ලෙඩවීම ගැන හිතුවනම් ඔය විදිහෙ ක්ෂණික කෑම බීම ගන්නවද? අපි කී දෙනෙක් බෙලිමල්, රණවරා අවුරුද්දකට සැරයක්වත් බොනවද කියල කල්පනා කරන්න. පොල්පලා, වැල්පෙනෙල වැල් පාග පාග කඩේට ගිහින් පාට කරපු පැණි බීම බෝතල් ගන්නවා.

වසර 34ක් විදේශ රටක සිටියත් අවුරුදු 10කට කලින් ලෝකය යන මේ ගමන වැරැදි බව අප තේරුම් ගත්තා .ඒ අනුව සතියට දවස් 3ක් පස් පංගුව පානය හුරු කළා. දහම් පාසල් දරුවන්ට පවා ඒ පානය හුරු කළා. ඒ අයට හොඳ ප්‍රතිශක්තියක් තියෙනවා.

සිංගප්පූරුව කියන රටින් අනෙක් රටවලට නැව් සිය ගණන් අපනයනය කළා. මේ වන විට රටට ආනයනය කරන තත්ත්වයට කරුණු සැලසෙමින් තිබෙන්නෙ.

අවුරුදු 100කට කලින් පැමිණි බව කියන 'ස්පාඤ්ඤ උණ' රෝගයෙන් පවා මේ තරම් ලෝකයට හානි වෙලා නැහැ. නමුත් අද තත්ත්වය ගැන හොඳින් අවධානයෙන් බලන්න.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ මධ්‍යම ප්‍රතිපදාව අනුව කටයුතු කළානම් මේ කිසි ලෙසකින් අපට විඳවන්නට වන්නේ නැහැ. අසීමිත සුඛ විහරණය, සුපිරි තත්ත්වයේ ආහාර පාන, ඉඳුම් හිටුම් අපට යම් ව්‍යසන අවස්ථාවකදී විශාල විපතක් ඇති කරනු ලබන බව අප තේරුම් ගත්තේ නැහැ. මේ අවස්ථාවේදී කොරෝනා රෝගය නිසා අපට රෝග හා මරණ බියක් ඇති වුණා. ඒ තැති ගැන්ම නිසා සමස්ත ලෝකයේම යම් පාලනයක් ඇති වුණා. එහෙත් ඒ ධර්මාවබෝධය නිසා නෙමෙයි. තාවකාලිකව ඇති වුණු බිය නිසයි.

සුපිරිදිවි පෙවෙත් අනුව ගෙවූ ජීවන රටාවන්ට මොකද දැන් වෙලා තියෙන්නෙ. කෝ රාත්‍රී සමාජ ශාලාවල එළිවෙනකල් විනෝද වුණු අය?

මීට පෙර ලෝකයට විපතක් වුණු විට ඇතැම් අයට ඒ බව දැනුණේ නැහැ. ඒත් දැන් ලෝකවාසී සියලු දෙනාටම මේ විනාශය දැනිලා තියෙන්නෙ.

දහම තේරුම් කරල දුන්නත් මිනිස්සු ලෙඩ වෙනවා මිය යනවා කියන එක කිසි කෙනෙකුට අවබෝධ කර ගන්න බැරි වුණා. දැන් ලෙඩේට බයේ, මරණයට බයේ යම් ආකාරයකින් අප පාලනය වෙලා ඉන්නවා. ඒත් යථාර්ථය බුදු රජාණන් වහන්සේ පෙන්වා දී වදාළ දහම තේරුම් ගෙන නෙමෙයි.

කොරෝනා රෝගය පැමිණියත් ඉතාලිය මොකද කෙරේ. ඒක කිසිම ගණනකට ගත්තේ නැහැ. ඒ අය කාලා බීලා නටලා රෑ එළි වෙනකල් විනෝද වුණා. රෝගය උත්සන්න වෙලා දවසකට දහස් ගණන් මියයද්දි තමයි ඒ අයගේ අවධානය යොමු වුණේ. එතකොට පරක්කු වැඩියි.

අද වන විට අපිට ජීවමාන විශාලා මහනුවර වගේ තත්ත්වයක් ඉතාලියේ හා ඇමරිකාවේ ඇති වෙලා තියෙනවා .

අපි දැන්වත් අපේ ජීවිත නිසි අවබෝධයෙන් යුතුව පවත්වාගෙන යා යුතු වෙනවා. අපේ දින චරියාව වහාම වෙනස් කළ යුතු වෙනවා.

අද අපේ දින චරියාව ගෙන බලන්න. දරුවන් උදේට ඇහැරෙනවා, කඩිනමින් සූදානම් වෙනවා. පාසල් වෑන් එකට දුවනවා. දරුවන් කී දෙනෙක් අඩුම ගානේ විනාඩියක් දෙකක් ආගම සිහි කර යනවාද? වැඩිහිටියන් ඒ වෙනුවෙන් දරුවන් හුරු කර නැහැ. පෝය දවසකට නැත්නම් ඉදල හිටල පන්සලට යනවා. එයින් පමණක් අපේ සාරධර්ම සකස් කර ගන්න අමාරුයි.

උදේට අවදිවෙලා පිළිවෙළකට සූදානම් පාසල් යන්න දරුවන් සූදානම් කළ යුතුයි. වේලාව ප්‍රමාණවත් නොවෙනවානම් තවත් විනාඩි 5ක් 10ක් දරුවන් කලින් අවදි විය යුතුයි. බුද්ධ වන්දනාව විනාඩි කිහිපයක් හෝ සිදු කර මවට පියාට වැඩිහිටියන්ට වැඳලා ආශිර්වාදය ලබාගෙන යන්න දරුවන් හුරු කළ යුතුයි.

දරුවන්ගෙන් කී දෙනෙකුට පුළුවන්ද තුන් සූත්‍රයෙන් එක සූත්‍රයක්වත් කටපාඩමින් කියන්න.

ආහාර ගන්නා ක්‍රමවේදය වැරැදියි කියා දැන දැනත් ක්ෂණික ආහාර ගැනීම නවතා දරුවන් නිසි ලෙසින් පෝෂණය කළ යුතුයි. එසේ නොවී අපට වසංගත තත්ත්වයන්ගෙන් ගැලවෙන්නට බැහැ. ලෝකයේම සමාජ රටාව වෙනස් කළ යුතු වෙනවා.

ආගමට දහමට මුල් තැනක් ලබා දිය යුතුමයි. අපි ආගම දහම අදහන හැටි සිතා බලන්න. සමහර ගෙවල්වල උදේ පාන්දර පිරිත් ඇහෙනවා. ගුවන් විදුලියෙන්. පිරිත් දාන අම්මල තාත්තල එයාලගෙ වැඩ, පොල් ගානවා, කෑගහනවා, දරුවන්ට බණිනවා, අම්මල තාත්තල රණ්ඩු වෙනවා. පිරිත් පැත්තකින් ඇහෙනවා. මොකක්ද ඒ පිරිතේ තේරුම.

විනාඩි කිහිපයක් හෝ තමන් අවබෝධයෙන් ආගම දහම සිහි කරන්න එයයි වැදගත් වන්නේ.

බුදුරජාණන් වහන්සේ මෛත්‍රිය උදෙසා දේශනා කර ඇත්තේ

'අච්චරා සංඝාත මත්තම්පි භික්ඛවෙ – භික්ඛු මෙත්තං චිත්තං භාවෙයිය – ඔවාද කරො ශාසන කරො'

'අසුරු සණක් හෝ භාවනාව සඳහා යොදවනවානම් අන්න එයා තමයි මගේ ශාසනයට අයත් වන තැනැත්තා.'

එම නිසා පැය ගණන් පිරිත් හඬපට යෙදීමට වඩා තමන් බුද්ධ වන්දනාව විනාඩි කිහිපයක් කරන්න.

ලෝකයේ විද්‍යුත් නාලිකා ඔස්සේ සිදු කළ නොහැකි විෂයයන් දෙකක් තිබෙනවා. එකක් ආගම. අනෙක භාෂාව මේ ධර්මතා නැත්නම් විෂයයන් අවධානයෙන් යුතුව අවබෝධ කර ගත යුතුයි.

ඉදිරියේදී තවත් විශාල අර්බුද රැසක් මතුවෙන්නට පුළුවන්. අපි ඒ සඳහා දැන් සිටම සූදානම් විය යුතුයි.

අද කී දෙනෙක් ගහ මරා ගන්නවද? වැට මායිමට රණ්ඩු වෙනවද? සමහර දේ බෙදා ගන්න බැරිව. අවබෝධය නැතිකම නේද ඒ. ලෝකයේ දහස් ගණන් මියයාම හරහාවත් අප මේ ධර්මතා ගැන අවබෝධයක් ඇති කර ගත යුතු වෙනවා.

ලෝකයේ සුපිරි බලවතුන්ට මොකද වෙලා තියෙන්නෙ. ට්‍රම්ප් පවා අද මුඛ ආවරණ දාගෙන ආරක්ෂා වෙලා ඉන්නෙ. බුදු රජාණන් වහන්සේ 'ආරෝග්‍ය පරමා ලාභා' යනුවෙන් දේශනා කරේ වසර 2600කට පෙරයි. ඒ ප්‍රකාශයේ සත්‍යතාව අද ලෝකයම වටහා ගෙන අවසානයි.

අපේ ශීඝ්‍රගාමී ජීවිතයේ වේගය අඩු කර ගත යුතුයි. ඒ සඳහා බුදුරජාණන් වහන්සේ අපට සිඟාලෝවාද සූත්‍රය, ව්‍යඝ්ගපජ්ජ සූත්‍රය වැනි දේශනා ගෙන හැර දක්වා තිබෙනවා. අප සැමවිටම මධ්‍යම ප්‍රතිපදාවෙන් කටයුතු කරන්නේ නම් අපට ගැටලු මතුවීම ඉතාම අඩුයි.

අද දුප්පත් පවුල්වලට ආහාර ගන්න වත්කම් නැහැ. ඒත් බලන්න ඇඳිරි නීතිය ඉවත් කළ සැණින් සුරාසල් ඉදිරිපිට තිබුණු පෝලිම්. ඒ පෝලිම්වල හිටපු අය දිහා බලන්න. ඇතැම් අය දිහා බලපුවහම එදා වේල හොයා ගන්න බැරි අය. ඒත් සුරාවට මුදල් තියෙනවා.

අප අවබෝධ කරගත යුතුයි මේ අර්බුදය ඉදිරියේදී තවත් අර්බුද රැසකට මුල පුරනා බව. මේ උවදුර නිසා දැනටමත් රැකී රක්ෂා හිඟයක් මතු වෙලා. ආහාර හිඟයක් ඇති වෙන ලකුණු පහළ වෙලා, ඒ වගේම වෙනත් ලෙඩදුක්වලට මුල් වෙන්නත් පුළුවන්. ජනතාවට සමාජ ප්‍රශ්න මතුවෙනවා. ඒවා වළක්වන්න බැහැ.



සිංගප්පූරුවේ මහා කරුණා බෞද්ධ සංගමයේ හා සිංගප්පූරුවේ ශ්‍රී ලංකාරාම විහාරස්ථානයේ ආගමික උපදේශක
**කෑගල්ලේ කරදෙටියන ගුණරතන හිමි**

තාරක වික්‍රමසේකර

තිස් වසරක යුද්ධය මැද
නාගදීපය රැකගත්
නා හිමියන්ගේ කතාව

4කොටස

# පද්මසිරිට සුනඛ ප්‍රහාරයක්



**නාගදීප විහාරාධිපතිව වැඩ සිටි රන්දෙඹේ සෝමසිරිතිස්ස නාහිමියන් අපවත් වී තෙමස් පූර්ණ පින්කම නිමිත්තෙන් කුල දරුවන් කිහිප දෙනෙක් පැවිදි කරවන්නට එහි නව විහාරාධිපති ධුරයට පත් බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති නා හිමියෝ කටයුතු කළහ.**

නවදගල බීටින් මහතාගේ බාලම පුත්‍රයා වූ පද්මසිරි නාගදීපයට පැමිණෙන්නේ ඒ අනුවය. පැවිදි වන්නට ගියද ඒ ගැන වගක් නොවූ පද්මසිරි විහාරස්ථානයේ සිටි තවත් ගැටවු තිදෙනෙක් හා දෙමළ ගැටවුන්ද සමඟ කණේරු මල් කැඩීමට ගියේය.

දෙමළ තරුණයින් ගස්වලට නැග කැඩූ මල් ඇහිලුවේ විහාරස්ථානයේ සිටි සිංහල ගැටවුන් විසිනි.

මල් එකතු කරමින් සිටියදී අශ්වයකුගේ පෙනුම ඇති දැවැන්ත කලු සුනඛයෙක් එක්වරම කැළෑවෙන් මතු විය. සුනඛයා මල් අහුලමින් සිටි පද්මසිරි වෙත කඩා පැන්නේය. ඒ දත් විලිස්සාගෙන මහ හඬින් බුරාගෙන ය. පද්මසිරි බිම ඇද වැටුණේ ය. සුනඛයා දත් විලිස්සාගෙනම පද්මසිරි බිම පෙරළා ගත්තේ ය. ගස් උඩ සිටි දෙමළ තරුණයින් පිරිස දති පති ගා ගස්වලින් බිමට පැන පොලු පහරදී සුනඛයා එළවා දැමූහ.

පද්මසිරිගේ ඔලුව තෝන්තු වී ඇත. අඩවන් වූ සිහියෙන් ඔහු හතර අත බැලූවද ඔහුට ක්ලාන්ත වන ලකුණු පෙනෙන්නට විය. සියල්ලෝම තැති ගත්හ. පද්මසිරිට අනතුරක් වේයැයි ඔවුහු සිතූහ. පද්මසිරි බිම දිග ඇදුණු ගමන් ය.

"යේක... අප්පිල දැන් මොකද කොරන්නෙ.." දෙමළ තරුණයෙක් ඇසී ය.

දයාවංශ පද්මසිරිගේ සිරුර පුරා පරීක්ෂා කරන්නට විය.

"බල්ලා කාලා නැහැ, අඩු ගානෙ සීරුම් පාරක්වත් නැහැ."

"අම්මෝ ඇති යන්තම්" සියල්ලෝම සැනසුම් සුසුම් හෙළූහ.

අසල පිහිටි කුඩා පැල්පතක් බඳු නිවසකට ගිය ඔවුහු වතුර පොල්කටුවක් ගෙනවිත් පද්මසිරිට බොන්නට දුන්හ. ඔහුගේ මුහුණට ද ටිකක් ඉස්සේ ය.

විනාඩියකින් දෙකකින් පමණ පද්මසිරි ප්‍රකෘති තත්ත්වයට පත් විය. පද්මසිරි නැගිට්ටේ ය.

"නායක හාමුදුරුවන්ට නම් මුකුත් කියන්න එපා" පද්මසිරි ලොකු ඉල්ලීමක් කෙළේ ය.

"මල්ලියාට.... අමාරුව ඇවිල්ල නැහැ නේද" තවත් දෙමළ තරුණයෙක් විමසුවේ ය.

පද්මසිරි සිනා සී ඇගේ තිබුණු වැලි ගසා දමා නැගිට්ටේ ය.

"අපි යං...." පද්මසිරි ඉස්සර විය.

කණේරු මල් රැගෙන දෙමළ තරුණයන් ඒවා අලෙවි කිරීමට විහාරයේ පිවිසුම් දොරටුව අසලට ගිය අතර පද්මසිරි ඇතුළු පිරිස සෙමෙන් සෙමෙන් විහාරස්ථානයට පැමිණ කිසිත් සිදු නොවූ අයුරින් කාමරවලට රිංගූහ.

එහෙත් සවස් වන විට පද්මසිරිට උණ ගැනුණි. වෙව්ලීමට තරම් වන අසනීපයක් ඔහුට ඇති විය. ඔහු කෙඳිරි ගාන්නට විය. කෙඳිරිය ඇසුණු සින්නදෙරේ පැමිණ පද්මසිරිගේ නළලට අත තබා උණ බලා වහා දිව ගියේය. ක්ෂණයකින් ධම්මකිත්ති නා හිමියෝ කාමරයට වැඩියහ. සින්නදෙරේද පසුපසින් පැමිණියේය.

"දෙයියෝ සාක්කි සහලෝලා උණනෙ" නළලට අත තබා බැලූ නා හිමියෝ කීහ.

උන් වහන්සේ ප්‍රේමරත්න, දයාවංශ සහ හෙක්ටර් කාමරයට කැඳවූහ.

"ඇත්ත කියපල්ල කොහොමද මේ හොඳට හිටිය පද්මසිරිට උණ ගැනුණේ"

පද්මසිරි අඩවන් ඇස් විවර කර දයාවංශ ඇතුළු තිදෙනා දෙස හොරැහින් බලා 'කියන්නට එපා' යැයි ඉඟි කරන්නට උත්සාහ කළද එය සාර්ථක සංඥාවක් නොවී ය.

හෙක්ටර් ගොත ගසන්නට විය.

"බ.... බ...බල්ලෙක්"

"ඔව්, ඔව්. ඉතින් බල්ලෙක් කැවද?" නායක හාමුදුරුවෝ ඇස් ලොකු කරමින් ඇසූහ.

> පද්මසිරිගේ ඔලුව තෝන්තු වී ඇත. අඩවන් වූ සිහියෙන් ඔහු හතර අත බැලූවද ඔහුට ක්ලාන්ත වන ලකුණු පෙනෙන්නට විය. සියල්ලෝම තැති ගත්හ. පද්මසිරිට අනතුරක් වේයැයි ඔවුහු සිතූහ. පද්මසිරි බිම දිග ඇදුණු ගමන් ය.

"නැ.. නැ...... පැන්නා, එච්චරයි.."

"මේක බලාගෙන ඉඳල හරියන්නෙ නැහැ"

සින්නදෙරේ දෙසට හැරුණු නායක හාමුදුරුවෝ, "තිරිනාවුකරසු දෙස්තර මහත්තය ගෙන්න ගන්න තිරික්කලේ ලැස්ති කරමු හනිකට" යනුවෙන් පැවසූහ.

එසේ පවසමින් නායක හාමුදුරුවන් පිටතට වඩිනු පද්මසිරිට යන්තමට පෙනුණි. හෙක්ටර්, ප්‍රේමරත්න හා දයාවංශද ඒ සමගම පිටත් වූහ. අඩවන් වූ පද්මසිරිගේ දෙනෙත් ඉදිරියේ පෙනුණේ සින්නදෙරේ පමණි.

වරක අඩ අවදියෙන් හා වරෙක නින්දෙන් මෙන් පද්මසිරිගේ සිත දෝලනය වන්නට විය.

දොරකඩ සිටි සින්නදෙරේ පද්මසිරි දෙස රෞද්‍ර බැල්මක් හෙළීය. ඔහු අත ලොකු දොර පොල්ලක්ද විය. ඒ සමගම නායක හාමුදුරුවන් කාමරයට වැඩම කරනු පද්මසිරි දුටුවේය. නායක හාමුදුරුවන් පිටුපසින් සිටි සින්නදෙරේ දොර පොල්ලෙන් නායක හාමුදුරුවන්ගේ හිසට දැත බඳා පොලු පහරක් එල්ල කරනු පද්මසිරි දුටුවේය. සින්නදෙරේ වියරු වැටුණකු මෙන් දත් හපමින් සිටියේය. පද්මසිරි ඇඳෙන් පැන හාමුදුරුවන් හා සින්නදෙරේද පෙරළාගෙන දිව්වේය.

"මෙන්න සින්නදෙරේ නායක හාමුදුරුවන්ට ගහනවෝ, බේරගනියෝ"

කාමරයෙන් එළියට පැන ආ පද්මසිරි විහාරස්ථානයේ මිදුලට පැන කෑගසන්නට විය.

"සින්නදෙරේ හාමුදුරුවන්ට ගහනවෝ, බේරගනියෝ"

විහාරයේ ඇතුළත මල් දෝතින් ගත් වන්දනාකරුවන් පද්මසිරි දෙස බලන්නට විය. පද්මසිරි කෑගසමින් විහාරයෙන් එළියට පැමිණ පාරදිගේ කෑගසමින් දුවන්නට විය.

"ඔන්න ඔය පොඩි කොල්ලව අල්ල ගනිල්ලා උණ විකාරෙන් දෙඩවලා පැනල දුවන්නේ" පද්මසිරිගේ පිටි පස්සෙන් කිහිප දෙනකුගේ හඬ ඇසිණි. ඒ සමගම වන්දනාකරුවන් කිහිප දෙනකුගේ ග්‍රහණයට පද්මසිරි අසු විය. සින්නදෙරේ පද්මසිරිව ඔසවා ගත්තේය. දයාවංශ හා හෙක්ටර්ද පිටි පස්සෙන් ගමන් කරන්නට විය.

පද්මසිරිගේ කෑගැසිල්ලට අවට නිහඬ වී ඇත. පද්මසිරි කාමරයට ගෙනවිත් ඇඳේ හාන්සි කරවා සින්නදෙරේ කාමරයෙන් ගියේ හෙක්ටර් එහි මුරට තබමිනි. ඒ සමගම පද්මසිරිට පියවි සිහිය ලැබුණි.

නාගදීප රෝහලේ වෛද්‍යවරයා වූ තිරිනාවුකරසු මහතා පන්සලට පැමිණියේ තවත් සේවකයකු සමඟ ය. කුමන වෛද්‍ය අවශ්‍යතාවයක් වුවත් පන්සලට පැමිණීමට ඔහු කටයුතු කළේය.

"පැවිදි පින්කමට තව දවස් දෙකයි මහත්තය තියෙන්නෙ, බලන්නකො මේ ළමයින්ට මේ දවස් ටිකවත් එක විදිහට ඉන්න බැරි හැටි" නායක හාමුදුරුවෝ වෛද්‍යවරයාට පවසන්නට වූහ.

"හරි, හරි, මම වෙලාවට සනීප කරල දෙන්නම්" වෛද්‍යවරයා සිනාමුසු මුහුණකින් නායක හිමියන් දෙස බැලුවේ ය. ඔහු ගෙනා බෙහෙත් කුප්පිවලින් එකක් ගෙන පද්මසිරිට එන්නත් කෙළෙ 'ය.

පසුදින පද්මසිරිගේ උණ ගතිය තරමක් අඩුව තිබුණි. එහෙත් පිටතට යාමට නායක හිමියෝ ඉඩ ලබා නොදුන්හ.

පද්මසිරිට එදින මහ කම්මැලි දිනයක් විය. පසුදින වන විට පද්මසිරිගේ උණ ගතිය හොඳටම බැස ගොස් තිබුණි. ඔහුට අමුතු ප්‍රබෝධයක්ද ඇති විය. පසුදින පද්මසිරිගේ පැවිදි පින්කමය.

පද්මසිරි කුස්සියට දුව ගොස් කෑමට විශේෂ යමක් ඇත්දැයි සොයා බැලුවේය. එක් එක් අය පින්කමේ විවිධ වැඩවල නිරතව සිටී. ඒ අතර චිත්‍ර ශිල්පියෙක් චිත්‍රයක් අඳිනු පද්මසිරිට පෙනුණි. මුළුතැන්ගෙයට ආසන්නව අඩි 5ක් 6ක් පමණ උසින් යුක්ත කළු පැහැති දැවැන්ත කබඩ් එකක් පද්මසිරි දුටුවේය. එහි දොර පලු දෙකක් වූ අතර පද්මසිරි එය විවෘත කෙළේය. කබඩ් එක තුළ තට්ටු 4ක් තිබුණු අතර සියලු තට්ටු පුරා පැරණි කැටයම් සහිත විසිතුරු පිඟන් බඳුන්වලින් පිරී තිබුණි. ඒවා නාගදීපයේ කාලාන්තරයක් තිස්සේ තිබෙන පැරණි පිඟන් බව බැලූ බැල්මට ම පෙනී ගියේ ය. දොර පලු දෙක වසා දැමූ පද්මසිරිගේ නෙත ගැටුණේ කබඩ් එක මත ඉහළින්ම තිබූ කැටයම් කළ රන්වන් පැහැති හක් ගෙඩියකි.

(මතු සම්බන්ධයි)

තාරක වික්‍රමසේකර

# සදහම් අරණ



සංස්කරණය
**නයනා නිල්මිණී**


## අනුබුදු මිහිඳු හිමි

මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙන් පැළලුප් නුවර අශෝකාරාමයේ දී තෙවන ධර්ම සංගායනාව පැවැත්වූ අතර ලක්දිවට වැඩමකර බුදු සසුන පිහිටුවන ලෙස මිහිඳු මාහිමියන්ගේ උපාධ්‍යායන් වහන්සේ මොග්ගලීපුත්ත තිස්ස හිමි හා මහා සංඝයා වහන්සේ ඉල්ලා සිටිය හ. මිහිඳු හිමි තම ධර්මදූත පිරිස වන ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල තෙරවරු හා සුමන සාමණේර සහ භණ්ඩුක උපාසක කැටිව මිස්සක පව්වට වැඩම කළහ.

මිහිඳු හිමියන්ගේ ලංකාගමනය සිදු වූයේ පොසොන් මස පුර පසළොස්වක දිනකදී ය. ලංකාවට වඩින විට මිහිඳු මා හිමියන් වහන්සේ දෙතිස් වියේ සිටි තරුණ හිමිනම කි. උන්වහන්සේ පුරා අවුරුදු 80 ක් ආයු වළඳා චේතිය ගිරියෙහි වස් විසූ සමයෙහි පිරිනිවන් පෑ සේක.

**ආර්.එම්. රිද්මි මෙලංකා**
අ.පො.ස උසස් පෙළ
ශාන්ත ඇග්නස් බාලිකා මහා විදුහල
රත්නපුරය

## අම්මා



දස මසක් කුසේ දරා සිට අම්මා මා මෙලොවට බිහි කළා ය. රතු ලේ කිරි කර පොවා මා පෝෂණය කළා ය. පිරිසුදු කර මා හද වඩා ගත්තා ය. රෝගී වූ විට දිවා රෑ නොබලා මා අසලින් ඇත් නොවී සුවවන තෙක් ම මා බලා ගත්තා ය. මලක් මෙන් මා රැක බලා ගත්තා ය. නිතර හැඩ වැඩ කළා ය. පොත්පත්වල ඇති දේ තේරුම් කර ඉගෙනීමට මා දිරි ගැන්වූවා ය. අම්මාගේ ලොකුම බලාපොරොත්තුව මා යහපත් පුරවැසියකු වනු දැකීමයි.

**සිතඟ තාරුකා**
06 වන ශ්‍රේණිය
සුවිශුද්ධාරාම දහම් පාසල, වැල්ලවත්ත

## අට ලෝ දහම



ලාභ, අලාභ, යස, අයස, නින්ද, ප්‍රසංසා, දුක, සැප මේ ලෝකවාසී සියලුම මනුෂ්‍යයනට මුහුණ පෑමට සිදුවන ධර්මතා අටකි. නොවැළැක්විය හැකි නම් මේ ධර්මතා කිසිදු මිනිස් කොට්ඨාසයක් වශයෙන් විශේෂත්වයක් නො ගනී. දුප්පත්, පොහොසත්, උගත්, නූගත්, උසස් පහත්, බාල මහලු සෑම මනුෂ්‍යයෙකුටම මේ ධර්මතාවයනට මුහුණ දීමට සිදු වේ.

ඒ පොදු ධර්මතා උපේක්ෂාවෙන් වැළඳ ගත යුතු ය. උද්දමයට හෝ කකම්පාවට පත් නොවී ඉවසීමෙන් නොසැලෙන මනසින් බුද්ධිමත් ව විඳ දරා ගත යුතු ය. බුදු වදන අනුව සදතනික අටලෝ දහම ම අනිත්‍යයි.මේ සදතනික අටලෝ දහමට යටත්ව සිටින අප කම්පා වීමෙන්, ශෝක වීමෙන් තොරව ධෛර්යමත් වීමත්, නිහතමානී වීමත් ජීවිතයට හුරු කර ගැනීමෙන් ඕනෑම අභියෝගයක් ජයගෙන හිත ඒකාග්‍රතාවයෙන් පවත්වා ගත හැකි ය.

**සඳලි උමේෂා කරුණාතිලක**
9 වන ශ්‍රේණිය
ශ්‍රී සද්ධර්මෝදය දහම් පාසල, තලකිරියාව

## සාරිපුත්ත මහරහතන් වහන්සේ

අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ අගසව් දෙනම අතරින් සාරිපුත්ත මහරහතන් වහන්සේගේ ගිහි කළ නම උපතිස්ස ය. ඔහුගේ මවගේ නම සාරි නම් බැමිණිය විය. මොහුගේ හොඳම මිතුරාගේ නම කෝලිත විය. මොවුන් දෙදෙනා දිනක් නගරයේ පැවැති 'ගිරග්ග සමජ්ජ' නම් සැණකෙළිය නරඹා මේ මනුෂ්‍ය භවයේ ඉපදී, නටමින්, ගයමින්, කාමයේ ඇලී ගැලී සිටීමෙන් කළකිරී සංජය පරිබ්‍රාජකයා ළඟ පැවිදි විය. ඔහු ළඟ තමා සෙවූ ධර්මය සම්පූර්ණ නොවීම නිසා වෙන වෙනම සත්‍ය සොයා ගියේ ය. බුදුරදුන්ගේ ශාසනයේ පැවිදිව අගසව් තනතුරු ලැබූහ.

**යූ.ජී. බුද්ධික දේශාන්**
06 වන ශ්‍රේණිය
ගා/ යටලමත්ත ම.විද්‍යාලය.

## දහම් පාසල

මගේ දහම් පාසල ශ්‍රී ගුණානන්ද දහම් පාසලයි. එය සුන්දර ගම්මානයක් වන මැදගොඩ ප්‍රදේශයේ පිහිටා ඇත. මගේ දහම් පාසලේ ගුරුභවතුන් දෙළොස් දෙනෙක් පමණ සිටිති. මගේ දහම් පාසල ඉතා අලංකාරවත් කෙත් යායකින් සහ අසිරිමත් දිය දහරාවකින් මැදි වී තිබේ. 'ගුණවත්' යනු සාරධර්ම හෙවත් හොඳ ගතිගුණයි, නැණවත් යනු නුවණ බුද්ධිය වැඩවීමයි. මෙම ගති ලක්ෂණ දෙකෙන් ම පරිපූර්ණ සිසු පිරිසක් අපේ ගුරුභවතුන් දහම් පාසලෙන් බිහි කර ඇත.. ගුරුවරුන්ට වැඩිහිටියන්ට ගරු කරන ආකාර ය, පන්සිල් පද පහේ සිටම අපට උගන්වා ඇත. මෙවන් සමාජයකට අපේ දහම් පාසල අගනා සම්පතකි.




**තිකිණි මල්ෂා මන්දකිණී**
7 වන ශ්‍රේණිය
ශ්‍රී ගුණානන්ද දහම් පාසල,
වරකාපොළ

## මගේ පාසල

මගේ පාසල මියුසියස් විදුහලයි. එය ආරම්භ කළ සුදු අම්මා මාරි මියුසියස් හිඟින්ස් මැතිනියයි. පාසල සෑදීමට ඉඩම පරිත්‍යාග කළේ පීටර් ද අබෙ මැතිතුමා ය. එය මුලින්ම සාද නිම කළේ කටුමැටි ගෙයක් ලෙස ය. ළමයින් දෙළොස් දෙනෙකුගෙන් පටන් ගත්තේ ය. මියුසියස් විදුහලේ අතීත නිල ඇඳුම වූයේ ළමා සාරියයි. එය බෞද්ධ කාන්තා විදුහලක් ලෙසයි පටන් ගත්තේ. මගේ පාසලේ වත්මන් විදුහල්පතිනිය නෙළුම් සේනාධීර මැතිනියයි. මම මගේ පාසලට ගොඩක් ආදරෙයි.


**රවිදි චමත්මා ජයතිලක**
4 වන ශ්‍රේණිය
බෝසත් දහම් පාසල, උඩහමුල්ල

### බුදු හාමුදුරුවෝ



**අජිත රක්ඛිත හිමි**
**මූලික ශ්‍රේණිය**
**ප්‍රඥනන්ද දහම් පාසල - මහරගම**

### ස්ථූපයක්



**නුවන්දි**
**04 වන ශ්‍රේණිය**
**සුවිශුද්ධාරාමය**
**වැල්ලවත්ත**

## පිහිට පතයි



අංක 58/2, හෝමාගම, මුල්ලේගම පදිංචි ඩී.ඒ. ඩී. ගාල්ලගේ යන අයට ඕ පොසිටිව් හෝ ඕ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කිරීමට කොළඹ මහ රෝහලේ වෛද්‍ය ආර්. ලැනරෝල් මහතා නිර්දේශ කර ඇති බව කියයි. වකගුඩුවක් පරිත්‍යාග කිරීමට කැමැති අයෙක් වේනම් දුරකතන 0723342042 හෝ 0767534028 දන්වන්යැයි ඉල්ලීමක් කෙරේ.

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

| | |
|---|---|
| සම්පූර්ණ නම | :- ...................................................... |
| පාසල / දහම් පාසල | :- ...................................................... |
| ඉගෙනුම ලබන ශ්‍රේණිය | :- ...................................................... |
| භාරකරුගේ නම | :- ...................................................... |
| ලිපිනය | :- ...................................................... |
| දුරකථන අංකය | :- ...................................................... |

**සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්,**

## පෝය ලබන සහ ගෙවෙන වේලාවන්


**වෙසක් අමාවක පෝය**
මැයි 21 බ්‍රහස්පතින්ද අපර භාග 09.36 න් අමාවක ලබා 22 සිකුරාද අපර භාග 11.08 න් ගෙවේ. සිකුරාද සිල්

**පොසොන් පුර අටවක පෝය**
මැයි 29 සිකුරාද අපර භාග 9.55 න් පුර අටවක ලබා 30 සෙනසුරාද අපරභාග 07.57 න් ගෙවේ. සෙනසුරාද සිල්

**පොසොන් පුර පසළොස්වක පෝය**
ජූනි 05 සිකුරාද පූර්ව භාග 03.15 න් පසළොස්වක ලබා 06 සෙනසුරාද පූර්ව භාග 00.42 න් ගෙවේ. සිකුරාද සිල්

**පොසොන් අව අටවක**
ජූනි 12 සිකුරාද අපරභාග 10.52 අව අටවක පෝය ලබා 14 ඉරිද පූර්වභාග 00.59 න් ගෙවේ. සෙනසුරාද සිල්.

# සිත නිරවුල් නම් මරණය සොඳුරුය



කොළඹ විශ්ව විද්‍යාලයේ
බෞද්ධ අධ්‍යයන අංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
රාජකීය පණ්ඩිත ආචාර්ය
**උඩුහාවර ආනන්ද හිමි**

**බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවෙසෙන සමයෙහි දිනක් උන්වහන්සේ හමුවට පැමිණි අනේපිඩු සිටුවරයා අමතා “ගෘහපතිය සිත අවුල් වූ කල්හි කායික කර්ම ද වාචසික කර්ම ද මානසික කර්මද අවුල් වෙයි. අවුල් වූ කාය කර්ම වචීකර්ම හා මනෝ කර්ම ඇති තැනැත්තාට යහපත් මරණයක් යහපත් කලුරිය කිරීමක් සිදු නොවේ” යනුවෙන් දේශනා කොට වදාළහ.**

අංගුත්තර නිකායේ තික නිපාතයේ සම්බෝධි වග්ගයේ එන අටවන සූත්‍රයෙහි මෙම බුද්ධානුශාසනය ඇතුළත් වේ. සිත හා පුද්ගල චර්යාව අතර සම්බන්ධය මෙන්ම එහි බලපෑම කෙසේ ද? යන්න මෙමගින් පැහැදිලි වේ. සිත අවුල් සහගත වූ කල්හී පුද්ගලයා විසින් සිදුකරනු ලබන කායික වාචසික හා මානසික කර්ම සියල්ල අවුල් සහගත වේ. මිනිසාගේ සිත මෙන්ම චර්යාවත් හේතුඵල සන්තතියකට අනුව ක්‍රියාත්මක වේ. එසේම ඒ සියල්ල අන්‍යොන්‍ය සම්බන්ධතාවෙන් යුක්ත ය. මෙය බුදු දහමෙහි එන නාම-රූප විශ්ලේෂණයෙන් පැහැදිලිකොට ඇත. සිත පිළිබඳ බෞද්ධ විග්‍රහය අතිශය විසිතුරු මෙන්ම අතිශය ගැඹුරු එකකි. සිත කිලිටි වූ විට පුද්ගලයා කිලිටි වේ (චිත්ත සංකිලෙසා සත්ත සංකලිස්සන්ති) සිත පිරිසිදු වූ විට පුද්ගලයා පිරිසිදු වේ (චිත්තවෝදානා සත්තා විසුජ්ඣන්ති). සිත කිලිටි වන්නේ ලෝභ දෝස මෝහ යනාදි සංකිලේස ධර්මවලින් ය. සිත තුළ ඇතිවෙන යහපත් මෙන්ම අයහපත් සිතිවිලි ක්‍රියාවට නැගෙන්නේ කාය වචනය හා සිත යන ත්‍රිවිධද්වාරයන්ගෙන්ය. සිත අපිරිසිදුවන සංකිලෙස ධර්ම රැසක් බුද්ධ දේශනාවෙහි ඇතුළත් වේ. එම මනෝභාවයන් අකුසල විතර්ක, නීවරණ, ක්ලේශ, උපක්ලේශ, අනුසය, ආසව ආදි වශයෙන් විවිධ නම්වලින් හඳුන්වා ඇත. කවර නාමයකින් හැඳින් වුවද ඒ සියල්ලෙන් සිදුවන්නේ සිත අපිරිසිදු වීම ය.

### සිත පිරිසුදු කිරීමට පෙර

බුදුරදුන්ගේ අනුශාසනය වූයේ සිත කිලිටි කෙරෙන කෙලෙස් ධර්ම ප්‍රඥවෙන් දැන දැක බැහැර කළ යුතු බවයි. එසේ නුවණින් දැනගන්නාට හා දකින්නාට ආශ්‍රව බැහැර කළ හැකි බවත් එසේ නොදන්නාට හා නොදකින්නාට ආශ්‍රව බැහැර කළ නොහැකි බවත් බුදුරජාණන් වහන්සේ වදාළහ. මේ අනුව සිත පිරිසිදු කිරීමට පළමුව සිත් කිලිටි කෙරෙන විවිධ කෙලස් ධර්මවල ස්වභාවයත් ඒවා ඇතිවන ආකාරයත් මැනවින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඒ සඳහා ධර්මය අධ්‍යයනය කිරීම හෝ ධර්මය දත් කෙනෙකු සමග සාකච්ඡා කිරීම කළ යුතුවේ. කට පාඩම් කිරීම කෙලෙස් ධර්ම නිසි ලෙස හඳුනා ගැනීම යනු වට්ටෝරුවක් ලෙස ඒ සියල්ල කටපාඩම් කිරීම නොවේ. කෙලෙස් ධර්ම නුවණින් දැකීම යනු ධර්මයේ විස්තර කෙරෙන එම කෙලෙස් ධර්ම තම සිතතුළ ක්‍රියාවට නැගෙන්නේ කෙසේද යන්න අත්දැකීම් මගින් වටහා ගැනීමයි. එසේම ඒවා ක්‍රියාවට නැගීමෙන් තමන්ට මුහුණ දීමට සිදුව තිබෙන ආදීනව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් වටහා ගැනීමයි. මෙසේ අතිදැකීම මගින් අවබෝධකරගන්නා තැනැත්තාට ඒ සියල්ල හේතුඵල සම්බන්ධයකට අනුව ඇතිවන බවත් නැතිවන බවත් දැකිය හැකි වේ. සන්තානගත කෙලෙස් ධර්ම ප්‍රභවය වන්නේ අයෝනිසෝ මනසිකාර හෙවත් නුවණින් තොරව මෙනෙහි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. තම සිතෙහි පහළවන සියලු මනෝභාවයන් (කුශල හෝ අකුශල) නුවණින් මෙනෙහි කරන්නාට ඒවා වෙන්කර හඳුනාගත හැකිවේ. ඉතා සියුම්ව විමසා බැලීමේදි පෙනීයන්නේ ඒ සියල්ල ලෝභ දෝස මෝහ යන අකුශල මූලයන් හෝ අලෝභ අදෝස අමෝහ යන කුශල මූලයන් පදනම්කරගෙන ඇති බවයි.

### මනස හැඳිනීම

මෙය ක්‍රියාවට නගන්නේ කෙසේද යන පුහුණුව සතිපට්ඨාන සූත්‍රයේ චිත්තානුපස්සනා යටතේ දක්වා තිබේ. එහිදි කෙනෙකු තම සන්තානයේ

පහළවන විවිධ චිත්තවේග කවරේදැයි වෙන් වෙන් වශයෙන් හඳුනා ගනී මෙසේ ඒ ඒ චිත්තවේග දැකීමෙහිලා සතිය හෙවත් සිහිය දියුණු කිරීම අවශ්‍ය වේ. සතිය දියුණු කළ පුද්ගලයාට තම මනස හා එහි ක්‍රියාකාරිත්වය මැනවින් දැකිය හැකි වේ. ඉහතින් දැක්වූ සූත්‍ර දේශනාව අනුව මනස අවුල් සහගත වූ විට පුද්ගල චර්යාව ද අවුල් සහගත වේ. සිත අවුල් සහගත වන්නේ යථෝක්ත කෙලෙස් ධර්මයන්ගේ බලපෑමෙන් ය. කෙලෙස් ධර්මවලින් සිත අවුල් වීමට හේතුව සිහිය දියුණු නොකිරීමය යන්න පැහැදිලි ය. සිහිය දියුණු කළ තැනැත්තාට මනස හා එහි ක්‍රියාකාරිත්වය මැනවින් දැකිය හැකි අතර තමන්ගේ සිත තම වසඟයට ගෙන අකුසල සිතිවිලි වර්ධනය වීමට ඉඩ නොතබා පාලනය කරගැනීමට හැකි වේ.

සූත්‍ර දේශනාවෙන් පෙන්වා දෙන ආකාරයට සිත අවුල් වූ විට එහි බලපෑම නිසා කාය කර්ම වචී කර්ම හා මනෝකර්ම අවුල් සහගත වේ. ලෝභයෙන් ද්වේෂයෙන් හා මෝහයෙන් යුත් මනසකින් ක්‍රියාවට නැගෙන්නේ අකුසල සහගත කායික වාචසික හා මානසික ක්‍රියා ය. ප්‍රාණඝාතය වැනි අකුසල ක්‍රියාවට පදනම් වන්නේ මනසේ පවතින ලෝභ දෝස මෝහ යන අකුසල චේතනාවලින් එකක් දෙකක් හෝ තුනමය. චේතනාව කර්මය යනුවෙන් බුදුරදුන් වදාළේ මෙම ක්‍රියාකාරිත්වය නිසයි. අකුසල චේතනා පදනම් කරගෙන තිදෙරින් ක්‍රියාවට නැංවෙන සැම ක්‍රියාවක්ම අකුසල සහගත වේ. මෙසේ සිත අකුශල චේතනාවලින් අවුල් සහගත වූ විටෙක එහි ප්‍රකාශන මාධ්‍ය වන චර්යාවද අකුසල වේ. ඇතැම් විට එම අකුශල චර්යාව කායිකව සිදුවන ප්‍රාණඝාතාදි ත්‍රිවිධ දුශ්චරිතයක් හෝ, වාචිකව සිදුවන බොරු කීම ආදි සිව් වැදෑරුම් දුශ්චරිතයක් හෝ මානසිකව සිදුවන අභිධ්‍යාව ආදි ත්‍රිවිධ දුශ්චරිතයක් හෝ විය හැකි ය. කවර ආකාරයේ අකුසල කර්මයක් කළද එවන් තැනැත්තෙකුට යහපත් සොඳුරු මරණයක් හිමි නොවන බව ඉහත සූත්‍ර දේශනාවෙන් පැහැදිලි වේ.

### සෙවිලි නොකළ වහලය

මෙම ක්‍රියාවලිය පැහැදිලි කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ සිත්ගන්නා සුළු උපමාවක් භාවිත කරති. ඒ අනුව මැනවින් සෙවිලි නොකළ උස වහලක් සහිත කූටාගාරයක මුදුන ද, පරාළ ද, බිත්ති ද අවුල් සහගත වේ. නැතහොත් අපිළිවෙල ය. එසේම අනාරක්ෂිත ය. එමෙන්ම සිත නැමැති කූටාගාර වහල මැනවින් සෙවිලි නොකළහොත් ත්‍රිවිධද්වාරයෙන් සිදුවන ක්‍රියා නැමැති මුදුන ද පරාළ ද බිත්ති ද අවුල් සහගත වේ. එසේම අනාරක්ෂිත වේ. එහෙත් සිත නැමති කුළුගෙය මැනවින් සෙවිලි කළහොත් ත්‍රිවිධද්වාරය නැමැති මුදුන ද පරාළද, බිත්තිද නිරවුල් වේ. ආරක්ෂිත වේ. උපමාවට අනුව සමස්ත කුළු ගෙයිම ආරක්ෂාව රඳා පවතින්නේ මැනවින් සෙවිලි කළ වහලයේය. එය අවුල් වුවහොත් සෙසු කොටස් ද අසම්පූර්ණ වේ. එමෙන්ම පුද්ගල චර්යාවට පදනම වන මනස අවුල් වුවහොත් සියල්ල අවුල් සහගත වේ.

මනස නිරවුල් වන තරමට පුද්ගල චර්යාව ද නිරවුල් වේ. නිරවුල් මනසක් හිමි අයෙකුට සොඳුරු මරණයකට හිමිකම් කිව හැකි වේ. අනේපිඬු සිටුවරයාට දේශනා කළ ධර්මය අනුව සිත නිරවුල්ව තබා ගැනීම අනිවාර්ය වේ. බුදුරදුන් වදාළ ශික්ෂා පද සියල්ල තමාට රැකිය නොහැකියැයි ළතැවුණු එක්තරා භික්ෂූන් වහන්සේ නමක් අරබයා බුදුරදුන් වදාළේ ඒ සියල්ල ගැන වද නොවී සිත පමණක් රැකගන්නා ලෙසයි. සිත රැකගැනීමට සතිය අවශ්‍ය වේ.

සතිය හෙවත් සිහිය දියුණුකළ පුද්ගලයාට නීතිය හෝ ශික්ෂාපද රැකීම පිළිබඳ අමුතු වෙහෙසක් අවශ්‍ය නොවේ. එයට හේතුව නීතිය හා ශික්ෂාපද කැඩීමට තුඩුදෙන අකුශල සහගත මනෝභාවයන් පිළිබඳ මනා දැක්මක් ඇති හෙයිනි. එබැවින් වඩා වැදගත් වන්නේ සිත රැකගැනීමය. නැතහොත් සිත නිරවුල්ව තබා ගැනීමයි. සිත නිරවුල් වූ විට චර්යාව නිරවුල් වන අතර එවැනි නිරවුල් සිතක් හා චර්යාවක් සහිත තැනැත්තාට නිරායාසයෙන්ම සොඳුරු මරණයක් හිමි වේ.


# වෙන්නායි මහා බෝධියේ වෙසක් සැමරුම

සාක් රටවල් අතුරින් වැඩිම පිරිසක් කොරෝනා රෝගයට ගොදුරුව ඇත්තේ අසල්වැසි ඉන්දියාවේ ය. කොරෝනා රෝගය පැතිරයාමත් සමගම ඉන්දීය අග්‍රාමාත්‍යවරයා විසින් සමස්ත රටම දින 21 කට වසා දමන ලදී.

එවන් තත්ත්වයක් මත බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්ව පිරිනිවන් පෑ රටේ වෙසක් සැමරීමට සිතීම පවා ඉමහත් දුෂ්කර කාර්යයක් විය. එහෙත් කෙසේ හෝ අඛණ්ඩව ම වෙසක් සැමරුම සිදු කළ යුතු හෙයින් ඉන්දියාවේ වෙන්නායි මහබෝධි මධ්‍යස්ථානාධිකාරී කලවානේ මහානාම හිමියන් විසින් වෙන්නායි මහාබෝධි මධ්‍යස්ථානය තුළ වෙසක් අසිරියෙන් සිරි ගන්වන ලදී.

ඒ අනුව බෞද්ධ කොඩි 100 කට අධික ප්‍රමාණයක් සහ වෙසක් පහන් කූඩු ද 100 කට අධික ප්‍රමාණයක් සකස් කර බුදුරජාණන් වහන්සේට ගෞරව පුද සත්කාර කළහ. එමෙන්ම පිරිත් සජ්ඣායනා කරමින් මේ රෝබිය තුරන් කිරීම උදෙසා කටයුතු කරන ලදී.

රටක් වසා තිබියදී මෙන්ම එළියට බැසීමටවත් නොහැකි ලෙසින් විශාල ගැටලු රැසකට මැදිව වෙනත් කිසිදු බෞද්ධයකු අහල පහළින් සොයා ගැන්මට නොහැකි අවස්ථාවක උන්වහන්සේ විසින් බුදුරජාණන් වහන්සේ උදෙසා කරන ලද මේ පූජෝපහාරය සුළුපටු නොවේ.



## පහන් සිතක කවි

### මිනිසා



ලොව ඇති සියලු යසිසුරු පිඩකට සකසා
දුන්නත් බලායනු ඇති මොනවද විමසා
වැටුණත් බිමට දඹරන් කහවනු වරුසා
සැහීමකට පත් නොමවෙනු ඇති මිනිසා

හටගත් සියලු දේ වැනසෙන සුළුය කියා
වදහළ සේක ඒ තිලොවග තිලක පියා
තර කොට බෙදගෙන මෝහය නමැති නයආ
මිනිසා විසින් අඳුරෙන් අඳුරටම ගියා

**බෝගමුවේ නන්දසාර හිමි**
පොතුහැර

### අමාඵලය




නිතර පින් කෙරුව ත්
කුසලය නිතර පිරුව ත්
භාවනා නොකළො ත්
නිවන් දෙරටුව නො ඇරෙ ත්

වැඩුවොත් බවුන් මග
සිතකට සුවය නැත හිඟ
සමාධිය ඇත ළඟ
එවිට නිවන ම විඳී සත්වග

සමධි සුව යේ
පීනා දහම් නදි යේ
දුක දුරැර බව යේ
අමා ඵලයම ලබමු දිවි යේ

මිරිජ්ජවිල - **සිරි දන්තනාරායන**

### යථාර්ථය



පේන තැන නැත
මැරෙන ඉපදෙන කෙනෙක්
එතැන ඇත්තේ චිත්‍රයක්
හිතන තැන නැත
කිසි දෙයක් – කිසි කෙනෙක්
එතැන ඇත්තේ
දකින්නට බැරි අති සංවේදී ශක්තියක්

පරගම්මන – **නන්ද**

### සැනසුම සොයමි



කාලය ගෙවෙනවා රැය දහවල වෙනවා
රූපය දිරනවා සැම වයසට යනවා
උදයම පිපෙන මල සවසට පර වෙනවා
කවද නමුත් සැම මරු වසගෙට යනවා

මුළු හදවතින් මම බුදුහිමි සරණ යමී
සසරින් එතෙර වන්නට මහ වෙර දරමී
සදහම් සුවය ලැබ ගැනුමට මුල පුරමී
ගෞතම සසුන තුළදි ම සැනසුම සොයමී

මහණෙනි සියල්ල ඇවිලෙයි යන බුදු වදන
කොපමණ ඇත්තක් ද ඒ ගැන සිතනු මැන
පස්කම් සුවය මිරිඟුවකුයි දැන හැඳින
ඉක්මන් කළ යුතුය නැසුමට භව ගමන

**වැලිකරේ ඤාණවංස හිමි**

### මෙත් සිත




තණ්හා ක්‍රෝධ වෛරයෙ ගිනි පුපුරද්දී
මිනිසා සොයන සැනසුම ඇතට යද්දී
කොතැනද නවතින්නේ විමසුම් නො කරද්දී
සසරේ අපායක දුක ගැන නො සිතද්දී

දම් ඔසුවක් තිබේ ඇයි එය නො සොයන්නේ
තණ්හා තිමිර පටලය ඇයි නො ඉරන්නේ
මෙත් කරුණාව මුදිතා ගුණ මතුරන්නේ
එවිටයි දිවිය හැඩ වී ලස්සන වන්නේ

**කුසුමා තිලකරත්න** – බූස්ස

### පෝදා



සුදු ඇඳුමින් සැරසී අප යනවා
දාගැබ් පැදකුණු කර සැනසෙනවා
බෝ මළුවට වී බවුන් වඩනවා
බුදු මැදුරට ගොස් බුදුන් වඳිනවා

පහන් වැටේ තිර එළිය කරනවා
ඒ එළියෙන් නව පැතුම් පතනවා
හේවිසි ඝණ්ඨානාද ඇසෙනවා
ලොකු හාමුදුරුවෝ බණට වඩිනවා

සාධුකාර නාදය පැතිරෙනවා
බණමඩුවේ දම් රසය විඳිනවා
දහසක් වියවුල් අමතක වෙනවා
පෝයට පන්සල් යන්න හිතෙනවා

**අමුණුගොඩ කුසුමා ප්‍රේමරත්න** – කුරුණෑගල

## කවි කිවිඳියනට සතර පෝදාටම දහම් තුටු පඬුරු


බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස ඉල් පුර පසළොස්වක පෝද සිට දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.

බුදුසරණ
පහන් සිතක කවි
BCC

සම්පූර්ණ නම :– ........................................................
ලිපිනය :– ........................................................
දුරකථන අංකය :– ........................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා, පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.

# Four sublime states
# Catu Brahma-vihāra
# for disaster situation



**Kundasale Subhagya Meheninwahance**
Lecturer, Religious course coordinator;
Intercollegiate Sri Lanka Education Affiliated to the University of Peradaniya.

**In Buddhist scriptures, these four sublime states are known under the name of Brahma-vihara, a term which mostly be rendered as excellent, lofty, or sublime states of mind and mainly higher qualities that maintain by the good humanity. These four mentalities are supposed to be great or grand since they are the privilege or perfect method of lead towards living creatures.**

They give, actually, the response to all circumstances emerging from social contact.They are the extraordinary removers of strain, the incredible peacemakers in social clash, and the extraordinary healers of wounds endured in the battle of presence.They level social barriers, build harmonious communities, awaken slumbering magnanimity long forgotten, revive joy and hope long abandoned, and promote human brotherhood against the forces of egotism.

This world is a marvelous structure between nature and man. That's why military conditions, natural disasters, illnesses and various forms of perishing can occur in different situations.The attitudes, activities and qualities of the man are mainly causal to these various forms of perishing. Four sublime states (Catu Brahma-vihara) namely; Metta – Loving-Kindness, Karuna – compassion, Mudita - sympathetic joy and Upekka –equanimityare very much important for humanity and social stability. These four qualities are also known as the boundless states because, in their perfection and their true nature, they shouldnot be narrowed by any limitation as to the range of beings towards which they are extended. They should be nonexclusive and impartial, not bound by selective preferences or prejudices.

Presently all over the world is facing for an unbearable situation. With the outbreak of the COVID-19 epidemic reaching threatening proportions in many countries. The outbreak was first identified in Wuhan, China, in December 2019 and gradually spread to most of the countries in the world. People are suffering with health and economic problems and most of the people are confuse about the situation. As an example lives of the Sri Lankan people are getting worse every day, due to the law of curfew and the economy of the people has collapsed.Some of them have lost their relation due to the virus. Some of them haven't seen their relations for a long time due to their services or quarantine. Most of the people fed-up with the unexpected problems.

The Buddhism is the ultimate philosophy which teaches us about the actuality. It is highly recognized the practical application of the Buddhist theories in this kind of disaster situation. Four sublime states are very much important and useful for give helping hand to each other. Metta – Loving-Kindness is love, without desire to possess, knowing well that in the ultimate sense there is no possession and no possessor. This is the highest love. Human being should spread Metta – Loving-Kindnessto the every spirit without boundaries. According to the Buddhist teaching the Buddha advised to spread Metta – Loving-Kindness as a mother love to her only son the peopleshould be unlimitedly distributed Metta – Loving-Kindness to all living being. In this particular situation every human being can wish as may all living beings be well, happy and peaceful. May no harm, difficulties come to them. May all living beings free from mental and physical illness. This is very much useful to develop own peace as well as world peace.


Karuna – compassion means sympathetic consciousness of others' distress together with a desire to alleviate it. Karuna – compassion is very much important for this kind of situation. Now people are suffering with lot of problems. They are unable to full fill basic need even. For an example most of the people in this world are suffering with food problems. As living being we can understand the hunger of other beings. So those who are capable to supply basic needs can help to helpless people in the world. Not only food but also medicine, cloths, shelter as well as the spiritual and mental support to overcome every problem.

Mudita - sympathetic joy means a enjoying others happiness. This is very much helping us to get rid from the jealousy. Your life will pick up in bliss by sharing the joy of others as though it were yours. Did you never see how in snapshots of bliss men's highlights change and gotten splendid with delight? Did you never see how euphoria rouses men to honorable yearnings and deeds, surpassing their ordinary limit? Didn't such experience fill your own heart with euphoric happiness? It is in your capacity to increment such experience of thoughtful delight, by creating joy in others, by bringing them bliss and comfort. So in this situation all can express the sympathetic joy to those who suffer and non-suffer. Incidents which were happened in the airport can take as an example. Most of the passengers who came from abroad did want to join for the quarantine due to many reasons. They had different reasons including politics. So we all should have sympathetic joy to bear any success done by anybody.

Upekka – equanimityis a perfect, unshakable balance of mind, rooted in insight. This is very much important for this disaster situation. We all as human beings express our happiness than sadness. According to the Buddhism we have to be patience to maintain the gap of happiness and sadness. These days we all have to face lot of difficulties due to curfew and many other reasons. Sometimes when all the family members are resident at home in this disaster period due to the curfew there will be many problems occur.Each and every one will have different kind of attitudes and habits. Everybody have to maintain the Upekka – equanimity to have minimum problems. We all have to be very much patience with equanimity to reestablished the country and human day today life.

As a summary four sublime states - Catu Brahma-vihara,we can use in practical application in this disaster period as; Metta – Loving-Kindness to activate good will towards all,Karuna – compassionto identifying the suffering of others as one's own, Mudita - sympathetic joy to enjoy and feels others happiness and Upekka – equanimityto even-mindedness and serenity, treating everyone impartially.

All the human being has to take this COVID 19 disaster as a lesson to the life. It is not matter that you're a Buddhist or any other religious person. The matter occurs with the levels of your humanity, qualities and discipline. These sublime states - Catu Brahma-vihara can help anybody to live with full of happiness as well as to be an excellent human being. Not only that but also to attend the highest happiness of Nibbana.



# මිල මුදල් පාරට විසි කරන යුගයක වංචනික වෙළෙඳාම් එපා



**අද කොරෝනා වයිරසය එක රටකින් පටන් ගෙන සමස්ත ලෝකයට ම විසිරී ගිහින්. දස දහස් ගණන් මරණයට පත් වෙනවා. ලක්ෂය ඉක්මවා මරණයට පත් වෙනවා.**

කෙතරම් භයානක ද? මෙයට කිසිම ඖෂධයක් සොයාගෙන නැහැ. දිනපතා ම කෙතරම් පිරිසක් ව්‍යසනයට ලක්වෙනවා ද? මරණයට පත් වෙනවා ද? මේ ගැන කවුරුත් කල්පනාවෙන් මරණයට බිය විය යුතු යි.

මොකද? අපේ මරණය හෙට වෙන්න පුළුවන්. 'මට නැහැ' යනුවෙන් කිසි කෙනෙක් සිතන්න එපා. ඒ නිසා මරණයට සූදානම් වෙලා සැවොම පන්සිල් රකින්න.

සත්ත්ව ඝාතනය, සොරකම, කාමමිථ්‍යාචාරය, බොරුව, මත්ද්‍රව්‍ය භාවිතය ආදී වැරැදි පහෙන් වළකින්න. මව්පියන්ට, ස්වාමියාට, ස්වාමි දියණියට, සලකන්න. දානමාන පින්කම් කරන්න, උදේ සවස බුදුන් වඳින්න. මේ ටිකම මරණින් මතු සුගතිගාමී වෙන්න ප්‍රමාණවත්.


මේ දවස්වල ඇතැම් වෙළෙඳුන් වස විස ආහාර ද්‍රව්‍ය විකුණනවා. ඇතැම් පාරිභෝගික භාණ්ඩ මිල වැඩි කර විකුණනවා. හොරට කිරුම් මිනුම් කරනවා. මේවා අති භයානක පව්. ඒ නිසා කවුරුත් දැහැමිව ජීවනෝපාය ගෙන යා යුතු යි. වැඩිය හම්බකරන පුද්ගලයාට මරණින් නිදහස් වෙන්න පුළුවන් ද? බැහැ. අද ලෝකයේ මහා ධනවතුන් මරණයට පත් වුණා. ඒ අය හම්බ කළ දේ දාලා ගියා. සමහර රටවල මිනිසුන් 'මිල මුදල් වැඩක් නැහැ' යනුවෙන් පාරට වීසි කළා. එවැනි වකවානුවක් තිබියදී වැඩි මුදලට බඩු විකුණන්න එපා. සොරට කිරුම් මිනුම් කරන්නට එපා. වස විස වර්ග, මත් ද්‍රව්‍ය විකුණන්න එපා. ගව ඝාතනය සම්පූර්ණයෙන් ම නවත්වන්න. නිර්මාංශී ජීවිතයක් උදෙසා දැන්වත් අධිෂ්ඨාන තබා ගන්න. මරණය පෙනි, පෙනී මිනිස්සු මත් ද්‍රව්‍ය භාවිතය සහ ජාවාරම, සත්ත්ව ඝාතනය සිදු කරනවා. වංචාව, කපටිකම සීමාවක් නැහැ. මේ වේලාවේ කවුරුත් සමගියෙන් සමාදානයෙන් ජීවත් වෙන්න සිතට ගන්න. අනුන්ට යමක් දෙන්න. ගමේ දුගී දුප්පත් අසරණ ළමයින් සිටින පවුල් වලට යමක් දෙන්න පුරුදු වන්න. දීම අති විශාල පිනක්. තමන් විතරක් ආහාර ගැනීමටවත් , එය මහා පරිමාණයෙන් ගැනීමටවත් පුරුදු වෙන්න එපා.

මේ කාලවකවානුව බිහිසුණු, දුර්භික්ෂ කාලයක්. ඒ නිසා සාධාරණ ජීවිතයක් ගත කරන්න. එවිට සංසාරික ජීවිත සුගතියක ඉන්න පුළුවන්. යහපත් ජීවිතයක් ගත කරන්න පුළුවන්. තමා වස විස වර්ග විකුණනවා නම්, අධික මිලට භාණ්ඩ විකුණනවා නම්, කවදා සුගතියක් දැක ගන්න ද? සැම දාම දුර්ගතියේ දුක් විඳින්න සිදු වෙනවා. කවම දවසකවත් සැපයක් දැකගන්න පුළුවන් කමක් නැහැ. නරකාදිය වෙන්වෙලා තිබෙන්නේ මෙවැනි පාපකාරී පුද්ගලයන් සඳහා යි.

ඒ නිසා ලොව්තුරා බුදුවරයන් වහන්සේලා ලෝකයාගෙන් ඉල්ලන්නේ කරුණු පහයි. එනම් පංචශීලය යි. එය හොඳින් රැකගෙන සිල්වත්, ගුණවත් කෙනෙක් ලෙස කටයුතු කළොත් අගෙයි.

බුද්ධ ශාසනය යනු කුමක් ද යනුවෙන් ඕනම කෙනෙක් ඇසුවොත් නිර්භීතව ප්‍රකාශ කළ යුත්තේ පව් නො කිරීම, පින් දහම් කිරීම, සිත සකසා ගැනීම යනු යි. එයට වචන තුනක් බුදු දහමේ පෙන්වා දෙනු ලබනවා. පව් නොකිරීම ශීලය යි. පින් දහම් කිරීම සමාධිය යි. සිත හදා ගැනීම ප්‍රඥාව යි. එසේනම්, බුදු දහම , බුද්ධ ශාසනය යනු සීල, සමාධි, ප්‍රඥාව යනුවෙන් පිළිතුරු සැපයිය හැකි යි. එතරම් අගනා ශාසනයක් ලැබුණ අපට දැහැමිව තමන්ගේ ජීවනෝපාය ගෙන ගියොත් හරිම වටිනවා. අද සිටින මනුස්සයා හෙට නිරෝධායනයේ. එහෙමත් නැතිනම් මරණයට පත් වෙලා.

ලංකාව කෙතරම් අගනේ ද බලන්න, රජය, යුධ හමුදාව, රාජ්‍ය පාලනයට අයත් සියලු දෙනා ඇප කැපවී කටයුතු කරන නිසා මරණ සහ රෝගීන් සංඛ්‍යාව සීමාසහිත වුණා. අන් රටවල් දෙස බලන්න, දවසකට දෙදහස් පන්සියයක් ඉක්මවා මිය යනවා. පැය විසිහතරකට එතරම් පිරිසක් මිය යන විට කෙතරම් බියකරු කරුණක් ද? යුද්ධයකදීවත් දවසට දෙදහස් පන්සියයක්,තුන්දාහක් මිය ගියේ නැහැ. අද මිය යනවා. 'ජීවිතය අනියත යි, මරණය නියත යි.' යනුවෙන් පැහැදිලි යි. සතර අපාය , ජාති, ආගම් භේද වලින් තොර යි. ඕනම ජාතියක ආගමක කෙනෙක් පව් කළොත් නරකාදියට යනවා ම යි. නවත්වන්න බැහැ. ඕනම ජාතියක ආගමක කෙනෙක් හොඳ දෙයක් කළොත්, හොඳ සිතින් මිය ගියොත් සුගතියකට යන්න පුළුවන්. සැපයන් දැකගන්න පුළුවන්. හැබැයි, ස්වල්ප දෙනාට යි. මේවා පිළිබඳ කවුරුත් හොඳට කල්පනා කර පිනට දහමට ගුණයට නැඹුරු ව තමාගේ සිත හදාගෙන මේ ගමන ඉදිරියට යන්න ඕනේ. ගේ දොර, දූ දරුවෝ, මිල මුදල් ගැනම කල්පනා කර සිටියදී මිය ගියොත් සුගතියක් දකී ද? දකින්න බැහැ. සුගතියක් දකින්න නම්, අත් හැරීම පුරුදු කරන්න ඕනේ. තණ්හාව අඩු කරගන්න ඕනේ. ගුණ ධර්ම දියුණු කළ යුතු යි. ලොවටම සෙත් පැතිය යුතු යි. හොඳ මනුෂ්‍යයකු වශයෙන් කටයුතු කළ යුතු යි. එවිට මොනම දෙයකින්වත් අඩු පාඩුවක් කරදරයක් නැතුව මේ සංසාර ගමන අපට හොඳින් ඉදිරියට යන්න පුළුවන්කම තියෙනවා.



අම්බලන්ගොඩ,
කහව ගල්දූව
ගුණවර්ධන යෝගාශ්‍රමයේ
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමයේ
මහා ලේඛකාධිකාරී
කම්මට්ඨානාචාර්ය
ත්‍රිපිටකාචාර්ය,
ත්‍රිපිටක විශාරද

**කහගොල්ලේ සෝමවංශ හිමි**

අද මේ කාලවකවානුවමුළු මහත් ලෝකවාසී ජනතාව විඳින දුකසීමාවක්නැහැ.එසේනම්, මෙවැනි රෝගී ජනතාවට සෙත් පැතිය යුතු යි. අනන්ත බුදු ගුණ බලයෙන්, පසේ බුදු, මහරහතන් වහන්සේලාගේ ආනුභාවයෙන්, මා රැස් කරගත් පින් බලයෙන් කොරෝනා රෝගීන් නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, යනුවෙන් නිබඳව ම සැවොම සෙත් පැතිය යුතු යි. එවිට රෝගීන්ට නොමැරී ,නිරෝගී භාවය ලබන්න පුළුවන්. කොරෝනා වෛරසයෙන් මරණයට පත් වුණ අයත් අප රැස්කරගත් පින් ලබාගෙන සැපයට පත් වේවා යනුවෙන් සිතනවා නම්, හරිම වටිනවා. ඒ අයට සරණක් පිහිටක්, නැහැ. ඇතැම් විට ආගමක් දහමක් නැහැ. ඒ නිසා තමයි වේදනාවෙන් කෑගසා, සරණක්, පිහිටක් නැතුව පරලොව යන්නේ.

ඔබ අප සියලු දෙනාටම නිවැරැදි දහමක් තියෙනවා. දන්දීම, බුදුන් වැඳීම, භාවනා කිරීම, බණ ඇසීම තියෙනවා. අප ළඟ යහපත් වැඩකටයුතු සම්භාරයක් තිබෙනවා. මේවා හොඳට දියුණුවෙන් හැකිතාක් පිළිවෙළකට දියුණු කරගෙන, සිල, සමාධි, ප්‍රඥා, ගුණ හොඳින් වඩා ගත්තොත් අපට හොඳ තැනකට යන්න පුළුවන්.

රතන සූත්‍රය නිතරම සජ්ඣායනා කරන්න. තමන්ටත් සෙත් පතා සැමටම සෙත් පතන්න. ලංකාවේ සැම තැනම පිරිත් දේශනා, බෝධි පූජා අනන්ත යි. ඒ නිසාදෝ අපේ රටට යම් තරමේ හෝ යහපතක් වෙලා තිබෙනවා. අනිත් රටවල කෙතරම් මිනිස්සු පීඩනයට පත් වෙලා ද? රෝගීන් පෙනෙනවා, මරණයට පත්වෙනවා, අඬනවා, වැළපෙනවා, අලාභ හානි විපත්, කෑම බීම නැහැ. එතරම් මහා අසරණ තත්ත්වයට පත් වෙලා. මේවා ගැන කවුරුත් සිතා කල්පනාවෙන් පව අඩු කරගන්නම මහන්සි ගත යුතු යි.

අනාථ පිණ්ඩික සිටුතුමා බුදු දහම වැළඳගෙන දවස පටන් අවසන් හුස්ම දක්වා ම පස් පව් කළේ නැහැ. දන් දුන්නා, දන්සල් පැවැත්වූවා. කවදාකවත් වැඩි මිලට බඩු විකුණුවේ නැහැ. සත්ත්ව ඝාතන කළේ නැහැ. වෙහෙර විහාර හැදුවා. බණ ඇසුවා. බුදුන් වැන්ඳ. දාන මාන පින්කම් කළ එතුමා දෙව්ලොව මහා දිව්‍ය රාජයෙක් ලෙස වාසය කරනවා. එලෙසම අපත් ජීවත්වන ටික කාලයේ බොහොම හොඳින් කටයුතු කර, හොඳ සිතින් අවසන් ගමන් ගියොත්, සුගතිගාමී වෙන්න පුළුවන්. ඒවා ගැන සිහිකල්පනාවෙන් බුදු දහමේ තිබෙන වැදගත්කම, මනුස්ස ජීවිතයේ තිබෙන වැදගත්කම නිතර සිතන්න ඕනේ.

> **අද සිටින මනුස්සයා හෙට නිරෝධායනයේ. එහෙමත් නැතිනම් මරණයට පත් වෙලා. ලංකාව කෙතරම් අගනේ ද බලන්න, රජය, යුධ හමුදාව, රාජ්‍ය පාලනයට අයත් සියලු දෙනා ඇප කැපවී කටයුතු කරන නිසා මරණ සහ රෝගීන් සංඛ්‍යාව සීමාසහිත වුණා.**

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

බුදුසරණ



# චීන ඉතිහාසයේ විශ්මිත නිමැවුම

# ලෂැන් බුදු පිළිම වහන්සේ හුදකලා වෙති

මේ දිනවල ලෝකයේ දිනපතාම කතාබහට ලක්වන රටක් වන්නේ චීනයයි. ලෝකයේ බෞද්ධ රටවල් අතර විශේෂ ත්වයක් ගන්නා චීනයේ මේ වන විට ක්‍රියාත්මක වන්නේ ධර්මාශෝක රජු විසින් චීනය ඇතුළු රටවලට යොමු කළ බුදු දහම නොව සම්මිශ්‍රිත දහමක්.

වර්තමානයේ චීනයේ පවතින්නේ බුදු දහමත්, කොන්ෆියුසියස් දහමත්, තාඕ දහමත් මිශ්‍ර වූ සංස්කෘතික ආගමික දර්ශනයක්.

අතීතයේ සිට මේ දක්වා බුදු දහම හා සබැඳිව විවිධාකාර වෙනස්කම්වලට බඳුන් වූ චීන දහමේ බුද්ධ වන්දනාවටද විශේෂිත ස්ථානයක් නැතිවාම නොවේ.

චීනයේ පමණක් නොව මේ දිනවල ලොව පුරා බොහෝ බෞද්ධ සිද්ධස්ථාන ජන ශුන්‍යව පවතිනවා. සාම්ප්‍රදායිකව පවත්වනු ලබන ආගමික වතාවත් හැරෙන්නට ජනතාවගේ ආගමික වතාවත් බොහෝ ආගමික ස්ථානයන්හි දක්නට නොවේ.

දිනකට දස දහස් ගණනකගේ නෙත්වලට බඳුන් වූ චීනයේ පිහිටි යෝධ බුදු පිළිම වහන්සේ ද මේ ලෙසින් අද හුදකලා වී තිබෙනවා.

චෙන්ග්ඩු ගුවන් තොටුපොළේ සිට කිලෝමීටර් 130ක පමණ දුරකින් මේ බුදු පිළිම වහන්සේ පිහිටා තිබෙනවා. දුම්රියෙන් ගමන් කරන්නේ නම් ඒ සඳහා ගත වන්නේ විනාඩි 45කටත් අඩු කාලයක්.

චෙන්ග්ඩු පළාතේ ෂු ෂැන්ග් හි පිහිටි මේ පිළිම වහන්සේ ලොව ප්‍රසිද්ධ වී ඇත්තේ ලෂැන් (*Leshan*) යෝධ පිළිමය නමින්.

ක්‍රිස්තු වර්ෂ 713දී ලෂැන් යෝධ පිළිම වහන්සේ නෙළීමේ කටයුතු ආරම්භ කළ නමුත් එහි වැඩ අවසන් කිරීමට වසර 90ක් ගත වුණා. ඒ කියන්නේ වැඩ අවසන් වී ඇත්තේ ක්‍රිස්තු වර්ෂ 803 දීයි. මුදල් නොමැතිවීම මෙන්ම විවිධ බලපෑම් එම ප්‍රමාදයට හේතු වී තිබෙනවා.

ශිලා කඳු බෑවුමකින් කැටයම් කර ඇති මේ බුදු පිළිම වහන්සේ ගංගා තුනක එකතුවක් සිදුවන ස්ථානයේ කන්දක් කපා ඉදිකර තිබෙනවා. එම ස්ථානය ලෝකයේ ඉතාම දැකුම්කලු ස්ථානයක්. එම ස්ථානයේ මේ පිළිමය නෙළීමට චීන කලාකරුවා කටයුතු කර තිබෙනවා. ලෂැන්ග් පිළිමයේ උස මීටර් 71 ක් වනවා. සිරස පමණක් මීටර් 14.7ක් බවයි දැක්වෙන්නේ. උරහිස මීටර් 28 ක පළලකින් යුක්ත වීමෙන් එහි ප්‍රමාණය සිතා ගන්නට පුළුවන්.

මෙය ඩාඩු, මින්ෂියෑන්, ක්න්ග්යි ගංගාවන්, එක්වන ස්ථානයේ නිර්මාණය කර ඇති ලොව ඇති අතිවිශාලතම ශෛලමය පිළිමයයි.

චීන ජාතිකයින් මේ පිළිම වහන්සේ සලකා ඇත්තේ අදටත් සලකන්නේ මතු බුදුවන මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ බවයි. එමෙන්ම මහායාන සම්ප්‍රදායට අයත් සාම්ප්‍රදායික ලක්ෂණ මේ අවටින් සොයා ගෙන තිබෙනවා.

යෝධ බුදු පිළිම වහන්සේගේ ශරීරය කන්ද ඇතුළට සැඟවී තිබෙන පරිදි නිර්මාණය කර තිබෙනවා. විශේෂයෙන් වර්ෂාවෙන් සිදු වන හානිය වැළැක්වීම සඳහා ජල කාණු පද්ධතියක් සකස් කර තිබෙන්නේ පසුකාලීනව බවයි දැන ගන්නට ඇත්තේ. එම කාර්යය ද ස්වාමීන් වහන්සේ නමක් විසින් සිදු කර ඇති බවට චීන ආගමිකයන් පවසනවා. ආරම්භයේදී බුදු පිළිම වහන්සේට රැකවරණය සැපයීම සඳහා මණ්ඩපයක් තනා තිබූ නමුත් මින්ග් රාජවංශ සමයේදීම එය විනාශ වූ බවයි චීන ඉතිහාසයේ දැක්වෙන්නේ.

මේ පිළිම වහන්සේ එය ඉදිරිපිට සිට නැරැඹිය නොහැකියි. එය එතරම් අතිවිශාලයි. ඒ සඳහා දුරට ගොස් විවිධ අංශයන්ගෙන් නැරැඹීමට පුළුවන්.

මේ ස්ථානයට ළඟා වීමට මෙන්ම එය නැරැඹීමට නැව් හා බෝට්ටුද උපයෝගී කර ගැන්මට සංචාරකයින් කටයුතු කරනවා.

බුදු පිළිම වහන්සේගේ සිරස කොටස දක්වාම යාමට පසුකලෙක පහසුකම් සලසා තිබෙනවා. මේ වන විට ජන ශුන්‍යව ඇති ලෂැන් පිළිම වහන්සේ ද කියා පාන්නේ ලෝකයේ අනියත ස්වභාවයයි. දිනකට දස දහස් ගණනක් පැමිණ නැරැඹූ පිළිමය අද හුදකලාවක් දක්වයි.

විශේෂයෙන්ම වෙනත් වර්ෂවල මැයි මාසය යනු අධිකම පිරිසක් ලෂැන් බුදු පිළිම වහන්සේ නැරැඹීමට පැමිණෙන කාලයයි. මේ පිළිම වහන්සේ නැරැඹීමේ හොඳම කාලය ලෙස සැලකෙන්නේ අප්‍රේල් මස 1 වැනිදා සිට ඔක්තෝබර් මස 7 වැනිදා දක්වායි.

පැන්ඩා සතුන් නැරැඹීමට යන ගමනේ විශේෂ ස්ථානයක් ලෙසයි ලෂැන් බුදු පිළිමය සංචාරකයින් සලකන්නේ.

ශ්‍රී ලංකා ලුංහුවා ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය හව් වේමින් පවසන්නේ චීනයේ පුරාවිද්‍යා ඒකක 5ක් විසින් මේ පිළිම වහන්සේගේ සංරක්ෂණ කටයුතු සිදු කරන අතර එහි සියලු කටයුතු සිදු කිරීමට චීන රජයද කටයුතු කරන බවයි.

එය යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස නම් කර ඇති හෙයින් එහි වටිනාකම තවත් තහවුරු වී ඇති බවද මහාචාර්යවරයා පෙන්වා දෙයි.

වන්දනාකරුවන් මෙන්ම පාසල් දරුවන්ද කණ්ඩායම් ලෙසින් පැමිණ මේ පිළිමය වන්දනා කරන බවයි ඔහු පෙන්වා දෙන්නේ.

මේ පිළිමයට කිලෝමීටර් 31ක් දුරින් පිහිටි 'අ මේ' කන්ද සලකන්නේ සමන්ත භද්‍ර හිමියන්ගේ මූලස්ථානය ලෙසින් බවද මහාචාර්යවරයා පවසනවා. එසේම එම කන්ද අවලෝකිතේෂ්වර හා මංජු ශ්‍රී යන මහායාන සම්ප්‍රදායයන්ගේ මූලස්ථානය ලෙසින්ද සලකන බවයි මහාචාර්යවරයාගේ මතය වන්නේ.

'අ මේ' කන්දට ලෂැන් බුදු පිළිම වහන්සේ හොඳින් දර්ශනය වනවා. මේ පිළිමය ගුවන් යානයේ ගමන් කරද්දී ද ඉතා පැහැදිලිව දකින්නට පුළුවන්.

අතීත කලා නිර්මාණකරුවන්ගේ තවත් විශිෂ්ට නිර්මාණයක් වන ලෂැන් පිළිම වහන්සේ තවත් කාලාන්තරයක් ලෝකයාට දැක ගන්නට සැලැස්වීමටයි චීන බලධාරීන් කටයුතු කරන්නේ. චීනයට ගොස් වරක් හෝ මේ පිළිම වහන්සේ නරඹන්නට හැකියාව ඇත්නම් එයත් බෞද්ධයෙක් ලෙස අපට ලබන්නට හැකි වටිනා සම්පතක් වේවි.

තාරක වික්‍රමසේකර

වර්ෂ 2020 ක් වූ මැයි 22 වනදා සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.